

# සබරගමු ජනකවියේ සමාජ මුහුණුවර

නෝමන් සිරිපාල

403310

# සබරගමු ජනකවියේ සමාජ මුහුණුවර

නෝමන් සිරිපාල

1999 සාහිත්‍ය දිනය නිමිත්තෙනි.
කර්තෘ ප්‍රකාශනයකි.

# සබරගමු ජනකවියේ සමාජ මුහුණුවර


## නෝමන් සිරිපාල

ශාස්ත්‍රවේදී (කැලණිය) ජනමාධ්‍ය ඩිප්ලෝමා (කොළඹ)



| ACCESSION NO | 47588 |
|---|---|
| CLASSIFICA-T ON NO | 398.20915493 |



මුද්‍රණය
පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්
නො. 37, ශ්‍රී සොරත මාවත,
ගංගොඩවිල,
නුගේගොඩ.



47588

## කර්තෘ ගේ ජනකවි සංස්කරණ

1990 - ගොවි ගෙදර ජනකවි.
(ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙනි)

1991 - ගොයම් කවි සරණිය.

1992 - බුත්තල ජනකවි

1992 - ජනකවි සරණිය - 1.
(1998 දෙවන මුද්‍රණය)

1992 - ජනකවි සරණිය - 2
(1998 දෙවන මුද්‍රණය)

1994 - කමක් හැල්ල.
(ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අනුග්‍රහයෙනි)

1996 - ජන කවිය සහ ජන දිවිය.

1996 - කුකුළා -(සිංහල තේරවිලි සිව්පද - ළමා)

1997 - තල මල් කවි සමාජය.
(ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අනුග්‍රහයෙනි)

1997 - මාගම් පත්තුවේ ජනකවි.

1998 - ජනකවි සියපත.
(බුද්ධ ශාසන අමාත්‍යාංශයේ ප්‍රකාශනයකි)

1998 - මාතලේ ජනකවි.

1999 - සබරගමු ජනකවියේ සමාජ මුහුණුවර

මුථම මුද්‍රණය - 1999 සැප්තැම්බර්
© නෝමන් සිරිපාල
ISBN 955-96157-4-2
(කංචුක නිර්මාණය කර්තෘගෙනි)

# පටුන


| | | |
|---|---|---|
| | හැඳින්වීම | 07 |
| 1. - | සබරගමුවේ ඓතිහාසික සාමාජීක හා සංස්කෘතික පරිසරය. | 09 |
| 2. - | සබරගමු ජනකවියේ විෂය ක්ෂෙත්‍රය. | 23 |
| 3. - | සබරගමුවේ ජනකවියෙන් හෙළිවන ජන සම්මත ඇදහිලි. | 37 |
| 4. - | සංස්කෘතික පෙරළිය හෙළිකරන සබරගමුවේ ජනකවි. | 59 |
| 5. - | සබරගමුවේ ජනකවියෙන් හෙළිවන සමාජ තොරතුරු. | 75 |
| 6. - | සබරගමු ජනකවියෙන් හෙළිවන ග්‍රාම නාම ආශ්‍රිත ප්‍රාදේශීය තොරතුරු. | 93 |
| 7. - | ගැමි ජනවිඥානය හෙළිකරන සබරගමුවේ තේරවිලි සිවිපද. | 109 |
| 8. - | සබරගමු ජනකවියේ විශේෂාංගයක් වූ ඈත්කවි. | 123 |
| 9. - | සබරගමු ජනකවියට එක්වූ වෙනත් විවිධ හා විශේෂ සංකල්පනා. | 137 |
| 10.- | සබරගමු ජනකවියන්ගේ වැනුම් මඟ හා කවිත්ත්වය. | 149 |
| 11.- | ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය. | 163 |

## හැඳින්වීම

එක් දහස් නවසිය තිහේ දශකයේ සිට මේ දක්වා දශක හතක් තුළ ජනකවි සංග්‍රහ පනහක් පමණ ප්‍රකාශයට පත්වී ඇත. එහෙත් ජනකවිය තවමත් විධිමත් විමර්ශනයකට බඳුන් වී නැති විෂයකි. එසේම ජන කවියට විචාර මහක්ද නැත.

මහාචාර්ය මිණීවන්. පී. තිලකරත්නයන් විසින් 1971 දී ප්‍රථම වරට **ජනකවිය හා සිංහල සංස්කෘතික ලක්ෂණ** විමසුමට ලක් කෙළේය. දැනට පළවී ඇති සංග්‍රහයන් තුළ ගොණුවී ඇති දස දහසක් තරම්වන ජනකවි සමුදය විද්වතුන් අතින් එසේ විචාරයට ලක්විය යුතුය. සාහිත්‍යයට හා සංස්කෘතියට අමතරව, සමාජ විද්‍යාත්මක මෙන් ම සමාජ අධ්‍යයනයනට ලක්විය යුතු ජනකවි රාශියකි. මගේ මේ ප්‍රයත්නය ද ජන කවිය විමසුමට තැබූ පළමු පියවරකි.

මා මේ සංග්‍රහය පළකළේ සබරගමු පළාතේ සාහිත්‍යය අගයමින් ඇඹිලිපිටියේ දී පැවැත්වෙන 1999 සාහිත්‍ය කලා ප්‍රසාදීති උත්සවයට සමගාමී කෘතියක් ලෙසිනි. **කලවාණේ ජයසේකර. බන්දුල ලියනගේ. මුනිදස දෙඩන්තැන්න සහ චන්දන සමරවික්‍රම** යන විද්වතුන් අතින් සබරගමු ජනකවි රාශියක් සංග්‍රහ වී ඇත. මෙම විමසුමට එම සංග්‍රහවල පළ වූ ජනකවි බොහෝමයක් විෂය කරගත් බව කෘතඥතාපූර්වකව සිහිපත් කරමි.

සබරගමු ජනකවියේ පසුබිම හා විෂය ක්ෂෙත්‍රය හඳුන්වාදෙමින් ඒ තුළින් සබරගමු ජනකවියේ සමාජය හා සංස්කෘතිය මෙන්ම රසඥතාවද හඳුනාගැනීමට උත්සාහ කෙළෙමි. ඉන් ඉමහත් වින්දනයක් ලැබුවෙමි. මා ලැබූ ඒ වින්දනය පාඨක ඔබටත් ලබාදීමට ප්‍රයත්න දැරුවෙමි.

සිංහල ජනකවි ඇසුරින් ම පළකරනු ලබන දහතුන්වැනි කෘතිය මෙයයි. ජනකවිය අගයන පොදු පාඨක පිරිසක් සිටීමත් මා දිරි ගැන්වීමෙන් ඔවුන් විසින් ලබාදෙනු ලැබූ අනුග්‍රහයත් නොවන්නට මේ මහෙහිම මෙතෙක් දුර පිය නැඟිය නොහැකි බව මම දනිමි.

කලින් කී පරිදි මේ මගේ පළමු ජනකවි විමර්ශනයයි. "තේරවිලි සිව්පදයේ ජනවිඥානය හා රචනා සමුදය" ඇතුළත් ජනකවි විමර්ශනයක් නොබෝ දිනෙකින් ඔබ අතට පත්කිරීමට බලාපොරොත්තු වෙමි.

මට අනුබලදුන් පාඨක ඔබටත්, අතහිත දෙන මිතුරු මිතුරියන්ටත්, මේ සම්බන්ධයෙන් මා සමඟ කැප වී සිටින නන්ද ජයසිංහ දයාබර බිරිඳටත් ස්තුති කරමි.

**නෝමන් සිරිපාල**

"ජයසිරි"
මඩකුඹුර,
කරන්දෙණිය.
1999/9/12.

# සබරගමුවේ ඓතිහාසික සාමාජික හා සංස්කෘතික පරිසරය

# 1

සබරගමුව, පළාතක් ලෙස නිළවශයෙන් පිහිටුවනු ලැබුවේ මිට වසර එකසිය දහයකට පමණ පෙරදීය "1889 ජනවාරි මස 1 වැනි දින නිකුත්කරන ලද ප්‍රකාශ පත්‍රයක් අනුව සබරගමු පළාත පිහිටුවන ලදි. එවිට බටහිර පළාතෙන් වෙන් කරනු ලැබූ කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්ක මේ අභිනව පළාතට වෙන් කරනු ලැබීය"[1].

1834 දී ලංකාව පිළිවෙලින් කොළඹ - යාපනය - ත්‍රිකුණාමලය - ගාල්ල - මහනුවර යන නගර අග නුවරවල් කොට, බස්නාහිර - උතුර - නැගෙනහිර - දකුණ - මධ්‍යම නමින් පළාත් පසකට වෙන්කර තිබුණි. 1845 දී හලාවත - පුත්තලම හා සත්කෝරළය වෙනම වෙන්කොට පුත්තලම අගනුවර කොට වයඹ පළාත පිහිටුවන ලදී. 1856 දී වයඹ පළාතේ අගනුවර පුත්තලමින් කුරුණෑගලට ගෙන ගියේය. 1870 දී ත්‍රිකුණාමලය වෙනුවට මඩකලපුව, නැගෙනහිර පළාතේ අගනුවර බවට පත්විය. 1873 දී අනුරාධපුරය අගනුවර කොට, උතුරු මැද පළාතද, 1886 දී බදුල්ල අගනුවර කොට ඌව පළාත ද පිහිටුවනු ලැබීය. 1889 දී අන්තිම වශයෙන් රත්නපුරය අගනුවර කොට, කෑගල්ල දිස්ත්‍රික්කය එක් කොට සබරගමු පළාත පිහිටුවනු ලැබුවේ නව වැනි පළාත වශයෙනි.[2]

දැනට රත්නපුරය නමින් හැඳින්වෙන නගරයෙහි පැරැණිම නම සබරගමුව (= හබරගමුව) විය.[3]

---

1. ලංකාවේ ජන ලේඛනය - 1946
   සාමාන්‍ය වාර්තාව (1951) - 168 පි.
2. ලංකා ඉතිහාසය (බ්‍රිතාන්‍ය හා නිදහස් යුග.) එස්. ජී. පෙරේරා පියතුමා. ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම. (1960) - 183 පි.
3. ලංකා ඉතිහාසය (පෘතුගීසි යුගය)
   එස්. ජී. පෙරේරා පියතුමා ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම. (1960) - 229 පි.

1 වැනි පරාක්‍රමබාහු මහ රජතුමා විසින් පොළොන්නරුවේදී කරන ලද ශාසන සංශෝධනයට සහභාගිවූ මහා සංඝයා වහන්සේ ගැන කෙරෙන මහාවංශය විස්තරයෙහි "සපරෙ රට්ඨෙ" (=සපර රට) යන නම යොද ඇත.[4] 1 වන විමලධර්මසූරිය රජතුමා විසින් දළද වහන්සේ දෙල්ගමුවෙන් සන්ද උඩරටට වැඩමවනු ලැබූ විස්තරයේ දී මහාවංශය "සබරගමු මහාරට්ඨ" යනුවෙන් සඳහන් කර ඇත.[5]

මහනුවර යුගයේ දී ලියැවුණු පොත්වල එනම්, "ශ්‍රී ලංකා දිපයේ කඩඉම් පොත"[6] - (සබරගමු රටය, සවිගොමු රටය)" ලක්විදිය"[7] (සබොගමු දනවූය)" ශ්‍රී සිංහලේ කඩඉම් පොත"[8] (සබරගමුව - හබරගොමුව) යන නම් දක්වේ.

සැවුල් සන්දේශය - (සපරපුර - සපරගමුපුර) කුන්ස්තන්තිනු හටන (සපරපුර) මන්දරම්පුර පුවත (සබරගමු) සිරි පැරැකුම්බා රජුගේ සමන් දේවාල ශිලා ලිපියේ (සපරගමුවෙහි) ද සබරගමු නාමය දක්වේ. "සබරගමුවේ පැරැණි ලියැවිලි" වලට අයත් සන්නස් හා තුඩපත් වල "සබරගමුව" හා "සපරගමුව" යන දෙවදනම යෙදී ඇත. "සබර" හා "සපර" යන දෙවදනින් වැඩි වශයෙන් යෙදී ඇත්තේ "සපර" යන්න බව විශේෂයෙන් සඳහන් කළයුතු වන්නේය. වර්තමාන ව්‍යවහාරයේ "සබර" යන්න යෙදෙන්නේ "සපර" යන්නට වඩා එය උච්චාරණයට පහසු වන බැවිනි. ජන වවහරේ එය "හබරගමුව" යනුවෙනි

"ශ්‍රී ලංකාදිපයේ කඩඉම් පොතට" හා "ලක්විදිය" කඩඉම් පොතට" අනුව සබරගමුව රුහුණට අයත් ප්‍රදේශයෙක් විය. "ශ්‍රී සිංහලේ කඩඉම් පොත" ට අනුව සබරගමුව, මායාරටට අයත් රටවල් සොළසට

4. මහාවංශය -සිංහල පරිවර්තනය - ද්විතීය භාගය "සබරගමු" යනුවෙන් යොද ඇත. - 207 පි.
5. කඩඉම් පොත් විමර්ශනය - ආචාර්ය එච්. ඒ. පී. අභයවර්ධන - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව (1978) - 120 පි.
6. කඩඉම් පොත් විමර්ශනය - 208 පි
7. කඩඉම් පොත් විමර්ශනය - 219 පි.
8. කඩඉම් පොත් විමර්ශනය - 211 පි.

ඇතුළත්වේ.[9] එහි දක්වෙන්නේ "කොළඹ නව කෝරලේ සබරගමුව" යනුවෙනි.

මහනුවර රාජ්‍යයට අයත්වූ දිසා දෙළසින්[10] නවවැන්න වූයේ සබරගමුවයි.[11] නූතන සබරගමුවට එම දිසා දෙළසින් තුනක්ම (සබරගමුව- සතරකෝරලේ සහ තුන් කෝරලේ) අයත්වේ.

කෝට්ටේ සමයේ දී සබරගමුව හැටියට සලකන ලද්දේ රත්නපුරයේ දෙනවක හරහා බඹරකොටුව දක්වා විසිරී ගිය යොදුන් නවයකට පමණක් සීමාවූ කුඩා බිම් පෙදෙසකි.[12] සිරි පැරකුම් රජුගේ සමන් දේවාල ශිලා ලිපියේ "නව යොදුන් බද සබරගමුවෙහි" යනුවෙන් සඳහන් වන්නේ එම ප්‍රදේශය විය හැකිය.

"සබරගමුව යනු වැද්දන්ගේ ගම යන අර්ථ ඇත්තේය. වැදි නාමය මුල් කොට අති ගම්, කුඹුරු පවුල් ආදියේ නම්, රත්නපුර දිස්ත්‍රික්කයේ එමට ඇත. වැද්දපංගු - වැද්ද කුඹුර - වැද්දවත්ත - වැද්ද ඇල - වැද්දගල - වැද්ද ගේ - ආදීය ඊට උදහරණයි. එසේ වුවත් 1946 ජනලේඛනය ගන්නා අවස්ථාවේදී රත්නපුර දිස්ත්‍රික්කයේ වැද්දන් හැටියට ගැනුනේ තුන් දෙනෙක් පමණකි.[13]

සබරගමුව යන්නෙහි තේරුම දඩයක්කාරයන්ගේ හෙවත්, වැද්දන්ගේ ගම යනුය."

"තවත් අර්ථයක් නම් මැණික් යන අදහස ඇති "සබර" යන ශබ්දයෙන් මෙය සෑදුන බවයි.[14]

මැණික් පමණක් නොව, මිනිරන් සහ යකඩ වැනි ඛනිජ සම්පත් සම්බන්ධයෙන් ද සබරගමුව ප්‍රසිද්ධියක් ඉසිලීය.

---

9. කඩඉම් පොතේ විමර්ශනය - 211 පි.
10. සතරකෝරලේ - සත් කෝරලේ - ඌව- මාතලේ - සබරගමුව - තුන් කෝරලේ - වලපනේ - උඩ පළාත- නුවර කලාවිය - වේල්ලස්ස - බිම් තැන්න - තමන් කඩුව.
11. සිංහලේ ආණ්ඩු ක්‍රමය - ජෝන් ඩොයිලි - 08 පි.
12. සබරගමුව දර්ශනය - 03 පි.
13. ලංකාවේ ජන ලේඛනය - (1946) - 168 පි.
14. ලංකා ජනතාව - නන්ද විජේසේකර - 53 පි.


| ACCESSION NO | A 7588 |
| --- | --- |
| CLASSIFICA -TION NO | 394.209 5493 |

1. හම්බන්තොට ගිරුවා ඌව දෙ - දුම්බර බින්තැන්නා
සබරගමුව සහ සත්කෝරල මන්නාරම තිබෙනා
යකඩ ලෝහයෙන් කම්හල් එකසිය හැත්තෑ පමණ වනා
කරමි දහස් ගණන් තිරතුරු නෙකදන වැඩ කරනා[15]

රත්නපුරය සහ කෑගල්ල යන පාලන දිස්ත්‍රික්ක දෙකකින් සමන්විත වන සබරගමු පළාත උතුරින් කුරුණෑගල, මහනුවර සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක වලින් සීමා වේ. නැගෙනහිරින් මහනුවර සහ බදුල්ල යන දිස්ත්‍රික්ක වලින් සහ වලවේගඟින් වෙන්වන මොනරාගල දිස්ත්‍රික්කයෙන් ද මායිම් වේ. දකුණින් සිංහරාජ කඳු වැටියෙන්, හා හම්බන්තොට, මාතර සහ ගාල්ල යන දිස්ත්‍රික්ක වලින් ද මායිම් වේ.

2. දකුණ සබරගමුව මායිම මුදුන
මුදුන හිමෙන් කොටසක් නොපෙනී වැසෙන
වැසෙන ගජන් කොටි ඈ සිව්පා තිතින
තිතින පෙනේ සීරද හිම දුර දකුණ[16]

මෙහි දැක්වෙන "සීරද හිම" යනු සිංහරාජ වනය වේ. බටහිරින් කළුතර සහ කොළඹ යන දිස්ත්‍රික්ක වලින් ද සබරගමුව මායිම් වේ. මෙම පළාත වර්ග සැතැපුම් 1892 පමණ වූ භූමි ප්‍රදේශයකින් සමන්විතය.

කෑගල්ල - දිස්ත්‍රික්කයේ භූමි ප්‍රමාණය වර්ග සැතැපුම් 642 ක් පමණ වන අතර එය තෙත් කලාපය තුළට වැටේ. නැගෙනහිර මායිම දිගේ කඳු රටෙහි ලක්ෂණ පවතී. දිස්ත්‍රික්කයේ සෙසු කොටස්වල තැනිතලා ලක්ෂණ පිළිඹිබු වේ. නැගෙනහිර මායිම දිගේ ඇති කඳුකර ප්‍රදේශයෙහි කැලෑ පිහිටා ඇත. රබර් වගාව බහුල ලෙස පිහිටා ඇති මෙම ප්‍රදේශයේ ප්‍රධාන ජීවිකා මාධ්‍යය කෘෂිකර්මාන්තය වේ. අහස් ජලයෙන් වැඩ කරන කුඹුරුවල පුළුල්

15. මන්දරම් පුර පුවත - 152 වි.
16. කුකුළු කෝරලේ ජනකවි - 22 වි.

වශයෙන් වී ගොවිතැන කෙරේ. තරමක් දුරට පොල් සහ තේ වගාකර ඇත.

පසුගිය කාලයේදී දිවයිනේ විශාලතම පේෂකර්මාන්ත සංකීර්ණ ය, තුල්හිරියේ පිහිටුවා තිබූ අතර, 7000ක් පමණ රැකියාවල යෙදී සිටියහ. දැනටත් පවතින තවත් ආර්ථික කාර්ය මධ්‍යස්ථානයක් නම් බෝගල මිනිරන් පතල් ය.

දිස්ත්‍රික්කයේ ජනයා වැඩි වශයෙන් ගම්බදව වාසය කරන අතර. 76% ක් පමණ සිංහල ජනතාව වේ. රුවන්වැල්ල - යටියන්තොට සහ දෙහිඕවිට යන ප්‍රදේශයන්හි වතුවල ඉන්දියානු පුද්ගලයන් ඒකරාශිව වෙසෙති. යෝනක (මුස්ලිම්) ජනයා ප්‍රධාන වශයෙන් මාවනැල්ල ප්‍රදේශයේ ඒකරාහි වී සිටිති. අන්‍යෝන්‍ය වශයෙන් බැඳුනු සිංහල සුළු ජන කොටස් අරනායක ප්‍රදේශයේ ඒකරාශිව වෙසෙති.

රත්නපුර - දිස්ත්‍රික්කය වර්ග සැතැපුම් 1250 ක් පමණ භූමි ප්‍රදේශයෙන් පුරා පැතිර තිබේ. භූ විෂමතා ලක්ෂණ අනුව සාමාන්‍ය වශයෙන් මෙය කඳුකරයකි. මුහුදු මට්ටමේ සිට අඩි 60 ක් පමණ සාමාන්‍ය උසකින් මෙම දිස්ත්‍රික්කය ආරම්භ වෙයි.

ශ්‍රී ලංකාවේ භූ විෂමතා කලාප අනුව මුහුදු මට්ටමේ සිට මීටරර 300 ට වඩා උස් ප්‍රදේශ මධ්‍යම කඳුකරය ලෙස සලකනු ලැබේ. ප්‍රධාන කඳුකරය හෙවත් මධ්‍යම කඳුකරය රට මැද පිහිටා ඇතත් සමනල කඳු මුදුන ද මධ්‍යම කඳුකරවලට සමාන වේ. සබරගමු කඳුවැටි කලාපය මධ්‍යම කඳුකර්යට තිරිත දිගින් පිහිටා ඇත. මේවා රක්වාන කඳු හෙවත් බුළුතොට කඳු නමින් ද හැඳින්වේ. හිනිදුම - කොග්ගල හා කුකුළු ගල මෙහි පිහිටි උස් කඳු වලින් කිහිපයකි. රක්වාන කඳු මධ්‍යම කඳුකරයෙන් වෙන් වී ඇත්තේ ගංගා නිම්න වලිනි.

සමනල කඳු වැටිය අඩි 7360 ක් පමණ උස්වෙයි. රක්වාන කඳුවැටිය අඩි 3600 ක් පමණ උසය. බංලගොඩ ප්‍රදේශය අඩි 2000 ක් පමණ උස වේ. මෙම දිස්ත්‍රික්කය හරහා ගලායන ප්‍රධාන ගංගා වනුයේ කළුගඟ සහ වලවේ ගඟයි.

රත්නපුර දිස්ත්‍රික්කයේ නිරිත දිග කොටස තෙත් කලාපයෙහි පිහිටි අතර, සෙසු කොටස් වියලි කලාපිය තැනිතලා වලින් සමන්විත වේ. වැවිලි කර්මාන්ත පදනමකින් රබර් සහ තේ පුළුල් ලෙස වගා කෙරේ. දිස්ත්‍රික්කයේ ප්‍රධාන කර්මාන්තය වන්නේ මැණික් ගැරීමයි. දිස්ත්‍රික්කයේ ස්වභාවික සම්පත් අතර සිංහරාජ වනය වැදගත් ස්ථානයක් ගනී.

සබරගමු පළාතේ මැතිවරණ කොට්ඨාශ 17 කි. කෑගල්ල දිස්ත්‍රික්කය සඳහා මැතිවරණ කොට්ඨාශ 09 කි. රත්නපුර දිස්ත්‍රික්කයට 08 කි. සබරගමුව, පලාත් සභාවත් මගින් පාළනය වේ.

රත්නපුර දිස්ත්‍රික්කයට කෝරල හතක් ඇතුළත් වේ.

1 - කුරුවිට කෝරළය

2 - දිග්ගම්පත (කුකුල්) කෝරළය

3 - නවදුන් කෝරළය

4 - කඩවතු කෝරළය

5 - මැද කෝරළය

6 - අටකලන් කෝරළය සහ

7 - කොළොන්න කෝරළයයි

රත්නපුර දිස්ත්‍රික්කයට අයත් වූ දිග්ගම්පොත කෝරළය "කුකුළු කෝරළය" බවට පත්වූයේ කුකුල්පොර නිසා බව, ජන කවියෙන් හා ජනශ්‍රැතියෙන් හෙළිවේ.

ii වන රාජසිංහ රජතුමාගේ කාලයේදී රජවාසල පැවැති කුකුල් පොරයන් සඳහා දිග්ගම්පොත කෝරළයෙන් ඉදිරිපත් වූ පොර කුකුලා අනෙක් දිසාවලින් පැමිණි පොර කුකුළන් පරදවා ජයග්‍රහණය කෙළේය. දිවයිනේ කුකුළ් පොර සඳහා විශේෂයෙන් පුහුණු කළ ඉතා දක්ෂ කුකුළන් රත්නපුරයේ දිග්ගම්පොත කොරලයේ සිටි බැව් ඉන් සනාථ වේ.

කුකුළු කෝරළයේ ජනශ්‍රැතියට අනුව ජයග්‍රහණය කළ පොරකුකුළා අයිතිකරු වූ පරගල ගම්වැසියකුට 'විජේසූරිය කුකුළු කෝරාළ' යන නම පටබැන්ද පමණක් නොව, ඔහුට 'කුකුලේගම ගම්වරයක් කොට දුන් බවත් කියැවේ. එතැන් සිට දිග්ගම්පත කෝරළය 'කුකුළු කෝරළය' නමින් ප්‍රසිද්ධියට පත්වූ බව සබරගමුවේ ජනකවියෙන් හෙළි වේ.

3. දිග්ගම්පොත කෝරළයෙන්
ගෙනා කුකුළු පොර කොටන්ඩ
අඩ හැරලා පටන් ගත්තු
අන් කුකුළන් ගසා කන්ඩ
වික්මැති යුද කරපු නිසා
රජවාසල සතුටු වෙන්ඩ
එද පටන් නම පැවැතිය
කුකුළු කෝරළය කියන්ඩ [17]

මෙම කවිය සෙංකඩගල නුවර කවිකාර මඩුවේදී කියා ඇති කවියක්සේ දක්වේ. පරිසරයේ පිහිටීම නිසා ද එම නම ලැබුණු අකාරය, මෙහි සබරගමුවේ ග්‍රාම නාම හා ඒ ආශ්‍රිත තොරතුරු ඇතුළත් හයවැනි පරිච්ඡේදයේදී සාකච්ඡා කෙරේ.

කෑගල්ල - දිසාවට ද

1 - සතර කෝරලය සහ

2 - තුන් කෝරළය නමින් -

කෝරළ හතක් ඇතුළත් වේ.

1. ගල්බඩ කෝරළේ

2. පරණ කුරු කෝරළේ

3. කිදිගොඩ කෝරළේ

4. බෙලිගල් කෝරළේ

17. කුකුළු කෝරලේ ජනකවි - 05 වි.

5. දෙහිගම්පල් කෝරලේ
6. අටුළුගම් කෝරලේ
7. පනාවිල කෝරලේ

පිළිවලින් සතර කෝරළයට අයත්වන කෝරළ හතර ජනකවියට එක්වූයේ මෙලෙසිනි.

4. ගල්බඩ - කිණි ගොඩ දෙකවෙයි දෙකෝරලේ
බෙලිගල - පරණ කුරුව සමග එක් කෙලේ
මේසතර එක්ව සැදුනේ සතර කෝරලේ
විකුම්විල පෑව සිංහල නරන් කුළේ[18]

සතර කෝරලේ කඩඉම් ජනකවියේ දක්වෙන්නේ මෙලෙසිනි.

5. වයිකුන්ටය සදිසි ඇල්පිටි කන්දෙ ගල
බුලත්ගමු කන්ද කරගල රහල ගල
රන්ආද කෙළින මිණිකඳ කියන වල
අහුපිණි ඇල වැටුණු ගම මැදින් බෙර විල[19]

6. මාතලා ගඟින් මුරුතේ කඩවතට
උනන් කන්ද පසුකර ගොස් වැදිගලට
නයියොත් පැන රණගල පිට්ටෑගමට
අරුක්ගමින් කොටියාකුඹුරේ ඉමට[20]

7. දුම්මල දෙනි කන්ද පසුකර ගෙන ගොසිනා
ඉර හඳ කෙටූ රණ ගිර මුදුනෙන් වඩිනා
බුජ්ජමු තොටද මාවතු කන්ද මුදුනෙනා
සේරුවා ගලෙන් උතුරට කෙනෙන් යනා[21]

8. මීයන් ඇල්ල බලනේ කඩවත ඇතුලේ
කඩුගන්නාව පිට සේසත කෙටූ ගලේ
මාවෙල උඩු පිටින් ලගමුවද පසුකළේ
මෙලකුණු මැද පිහිටි රට සතර කෝරලේ[22]

---

18. සතර කෝරලේ විත්ති -
19. - 21 ජන සම්මත කවි - 272 පි.
22. ජන සම්මත කවි ගී - 277 පි.

සතර කෝර්ළයට තාන්න-මාන්න (=නතතුරු හා ගරුනම්බු) පහක් ලැබී ඇති ආකාරය ද ජනකවියෙන් හෙළිවේ.

9. රුන මායා පිහිටි තුන්ලක
කන්ද උඩරට සතක් ඇත්තේ
වාන සිදුරුය නමින් පරසිදු
උඩුනුවර මුල් කොට පැවැත්තේ
පාන සිව් තුඩු ලෙසින් නුවරට
සිව් දෙසින් සිව් දිසා ලත්තේ
මාන පසලත් කෝර්ළයෙ සිව්
මෙ මහනුවරට ඉදිරි පැත්තේ [23]

10. රාම දෙව්රද දෙවුන්දර සිට
අලුත් නුවරට වඩින ගමනේ
සැම සිව්රඟ සෙනඟ සැදෙමින්
මඟුල් දිවි පෙරහැරකි සොදිනේ
සේම රිව්රුව පිහිටි කොඩියද
පෙරට කොට ආ ලෙසිනි එදිනේ
ඒ මහත් මානයක් සිව් කෝර්ළේ
අයට වනි එතැන පටනේ [24]

11. හරින්ඩේ කොටු කොළඹ රජසිහ
තිරිදු රත්ගත් වත්ත වැඩ සිට
දවුන්ඩේ සිහ පව්වලන්සය
එල්ලෙමින් පොල් තුරක එම විට
ගෙනෙන්ඩේ වදහලෙන් කප්පිත්තාගෙ
තරමද දක්කු අත්පිට
දවුන්ඩේ සහ පව්ව ලංසය
ලැබුණි සිව් කෝර්ළේට මා නෙට [25]

23 - 25 ජන සම්මත කවි ගී - 278 - 279. පි.

12. ලක වෙතුන් හිමි රාජ සහ නාප
    වඩින මඩකලපුවට          සමයෙක
තෙක දහස් දන ගියා ගල්මය
    රදන කිඹුලෙකු දිව නෙතින්          දක
සැක නොවී කඩුපතින් කොටමින්
    කොතවියක් ඇතලුවෙන්          විගසට
රැක නොදි දිවි කොතවියත් සහ
    කිඹුළු ජලබාවිය          ඇසිල්ලෙක [26]

13. සෙන් පිරිස් මැද රාජසිංහ නාප
    එදු එක් පනතක්          වදලේ
ඇන්නවිට කිඹුලාට ජලයට
    ඇන්නගිය ඒ          ඉලුක්කෝලේ
දුන්නහොත් දන් ගෙනත් සමතෙක්
    ඇතොත් සබයේ නොවී          කෝලේ
දුන් දෙවමි මානයට අත්පිට
    වදලේ එම          ඉලුක්කෝලේ [27]

14. එවිට කප්පාගොඩින් සමතෙක්
    රැගෙන අවසර දියට          පැනලා
එගොඩ මැද උන් කිඹුලු දකිමින්
    ගිරිය අතලා අනුව          බිඳලා
දියට මතුකොට ගෙනත් දක්වූ
    කලට මාහැඟි තට්ටු          බැඳලා
එවිට මානෙට ඉලුක්කෝලය
    ලැබුණි ඔහු යස උසස්          කරලා [28]

15. (i) කොඩියකුත් රතු බැඳපු සවරත්
        සදන යුදයට          පෙරමුණේ
    (ii) කොතවියක් සහ (iii) පච්ච ලන්සය
        (iv) දවුන්ඩයකුත්          සමගිනේ
    (v) කොඩියකුත් තව පිහිටි ඉර - හඳ
        මාන පස ලැබ          මෙලෙසිනේ
    මෙම සිරිත් ඇති සතර කෝරලෙ
        දිසාවේ යයි          පෙරමුණේ [29]

26-29 ජන සම්මත කවි ගි 280 පි.

එම ජනකවි වලින් කියැවෙන මාන්න පස නම්:

1. සවරන් බැඳි රතු ඉර හඳ කොඩිය
2. දවුණ්ඩය (කොඩි වර්ගයකි)
3. පච්චලංසය (පච්ච වර්ණ හෙල්ල)
4. කොතව්ය (කුන්තායුධය)
5. ඉලුක්කෝලය (තෝමරය)

මේවා දෙවන පැරැකුම්බා රජතුමාගෙන් සහ දෙවන රාජසිංහ රජතුමාගෙන් ලැබුණු බව ජනශ්‍රැතියේ එයි.

සතරකෝරළේ ඉර - හඳ කොඩිය දළද පෙරහැරේ ගෙන යන ගජනායක නිලමේගේ කොඩිය සහ මහ දේවාලයේ කොඩි ළඟට තුන්වෙනුව පෙරමුණේ ගෙන යයි.

කෑගල්ල නගරයේ පවා සතර කෝරළේ ඉර - හඳ කොඩිය ලෙළදුන් ආකාරය කෑගල්ලේ සිරගෙට පෙණුන බව තලමල් කවියක සඳහන්වේ.

16. කොළඹ සිටන් රජු නුවරට එනකොට
පෙරහැර සතරක් සම්බ උනේ
පෙරහැර සතරේ දිය කපනාද
අයියා සිරගෙට නියම උනේ
ජනෙල් දෙරටුවෙන් බලාපු බැල්මට
ඉර - හඳ දෙදෙනා කොඩිය වැනේ
ඉන්ද්‍රනීල මැණිකක් වැනි තලමල
කෑගල්ලේ සිරගෙට පෙනුණේ[30]

සබරගමු පළාතේ කොඩි කිහිපයක් භාවිතා වී ඇත.

1- කහපාට පට රෙදි මහා කොඩිය

2- සැවුළු කොඩිය

3- රාවණා කොඩිය

---

30 - තලමල් කවි සමාජය - 107 පි.

4. සතර කෝරළේ සඳහා රතු පාට
ඉර - හඳ කොඩිය සහ

5. තුන් කෝරළේ සඳහා හිස් දෙකක් සහිත පක්ෂියෙකුගේ කොඩිය වශයෙනි.

'සතර කෝරළය' හා 'වත්තිය අතර ඇතිවූ හබයක් ඉදිරිපත් කරන ජන කවියා අපට දෙපක්ෂයේම තරම, ඉදිරිපත් කරන්නේ මෙලෙසිනි.

16. කන්නේ හෝතලා පැන වැල්ල පොතු ගෙනේ
බොන්නේ බොර දියයි මඩ කඩිති ඉස ගෙනේ
උන්නේ උණ විලා බඩගෙඩි නෙරව ගෙනේ
දන්නේ නැද්ද වත්තියෙ අඟනන්ගෙ ගුනේ [31]

17. සතර කෝරළේ පටමළු හිඟන්නනේ
දනට අත දිදී කඳුහෙල් නගින්නනේ
අතින් පයින් කුඩැල්ලන් කඩන්නනේ
තොපට මොටද වත්තියෙ අඟනන්ගෙ ගුනේ [32]

දිවයිනේ පොදු ජනතාවට සබරගමුව ගැන නිතර කියැවෙන උපදේශාත්මක පිරුලකින් හෙබි ජන කවියකි මේ.

18. දුන්න දුනු ගමුවේ
ඊතල කිතල ගමුවේ
රාළ මී ගමුවේ
මුවෙක් හැඩුවා සබර ගමුවේ [33]

---

31 - - 32 සිංහල ජනකවි සංග්‍රහය - ii - 240 පි.
පහත දක්වෙන ආකාරයෙන් ද එම ජනකවිය
රඹුක්කන ප්‍රදේශයේ භාවිතා වේ.
- සතර කෝරලේ පටමළු හිඟන්නනේ
අතික් පයින් කුඩැල්ලන් කඩන්නේ
හිරිකඩ පොදට කල්පත් හිසලාගන්නේ
තොපට මොටද වත්තිගෙ අඟනුන්ගේ ගුනේ
- එච්. ගුණරත්න මහතා විශ්‍රාමික විදුහල්පති සියඹලන්ගොමුව - නේවාදිවෙල - රඹුක්කන

33. ජනශ්‍රැතිය

කිහිප දෙනෙකු විසින් එකට එක් වී කළ යුතු වූ කාර්යයක් සඳහා එක්තැන් විය යුතු අය එක්තැන් නොවීම නිසා, එම කාර්යය කිසි දිනෙක ඉටු නොවන බව දක්වීමට මේ උපදේශාත්මක පිරුල භාවිතා වේ. එසේම අවශ්‍ය දේ ඇතත්, උවමනා වේලාවට ළඟ නොමැතිවූ විට ද මෙම පිරුල භාවිතා වේ.

සතර කෝරළේ කිසියම් සිද්ධියක් මෙම ජන කවියෙන් අනාවරණයවේ. මෙම මතුපිටින් කියැවෙන සිද්ධියට වඩා ගැඹුරු අදහසක් ඉන් ධ්වනිත වන බව හැඟේ.

19. සතර කෝරළේ ගේකට හොරු පැන්නා
අට දෙනෙක් බරට ගෑනී ගෙයි උන්නා
මැරුවත් බැරිය දුටු දේ නොකියා ඉන්නා
දෙරියන් මහාරයි ඇහෙ තන තව එන්නා [34]

සබරමුවේ මහ සමන් දේවාලය මුළු දිවයිනටම ආශිර්වාදයකි.

20. හෙළ මුදුනින් බැස්ස කලට පෙනේය උළු මාලිගාව
රැ ද වල් එළිය ඇතුව රන් කොත් බබලන සූබාව
බිම්බරකට සෙනඟ ඇවිත් සැදෙව් උළු මාලිගාව
මුළු රටටම පාරට්ටුයි සබරගමුවෙ මාලිගාව [35]

සබරගමුවට එළිය වැටෙන්නේ රත්නපුරයේ මහ සමන් දේවාලයේ පෙරහැර කාලයටය. මිනිරන් පතලේ දබර මඩුවද පාළු වන්නේ එම කාලයටය. පතල් කරුවන් සියළු දෙනාම පෙරහැර බැලීමට එහි යන බැවිනි.

21. සබරගමුව එළියයි පෙරහැර දට
කබර ගොයින් එනවා වැහිපොද දට
සබරගමුව පාළුයි අපි නැති දට
දබරේ ගල් වෙයන් හෙට එන පෝලිමට [36]

---

34-35. එච්. ගුණරත්න මහතා රඹුක්කන

සබරගමුවේ සමන් දේවාල පෙරහැර ජන කවියෙන් මෙන්ම පොදු ජනතාවගේ ද ව්‍යවහාරයට ලක්වූවකි.

22. සබරගමුවේ බදින කොණ්ඩා
තල්ගසේ ගෙඩි අන්දමේ
සබරගමුවේ පේලි යනවා
මුහුද රළ දෙන අන්දමේ
සබරගමුවේ බදින තරුවැල්
පවන් ලෙළ දෙන අන්දමේ
සබරගමුවේ යනෙන පේලි
කොකුන් ඉගිළෙන අන්දමේ[37]

සබරගමුව මහ සමන් දේවාලය මහත් හාස්කම් වලින් පිරුණු පූජනීය ස්ථානයක් වූ බව ද ජන කවියෙන් හෙළිවේ.

23. කුරුවිට කෝරළෙ පල්ලේ පත්තුවෙ
උතුම් සබරගමු දේවාලේ
දවසින් දවසට ලියලාගෙන එන
ගලක් තිබුණිය කිව් මැද මාලේ
ලොව සතහට මතුවට පවතින්නට
සුමන දෙවිඳු පෑවා ද බලේ
එම ගල සකියති තව ලියලනටව ද
උතුම් සබරගමු දේවාලේ[38]

36-38. පී.කරුණාරත්න. සාම විතිසුරු
කොහෙල්වත්ත - සියඹලන්ගමුව
හේවාදිවෙල.

# සබරගමු ජනකවියේ විෂය ක්ෂේත්‍රය

# 2

සබරගමුවේ ජනකවි ඇතුළත් සංග්‍රහ කිහිපයක් දනටමත් පළවී ඇත.[1] මෙම සංග්‍රහයන්ට ඇතුළත් දහස් ගණනකින් යුත් ජනකවි සරණිය ඇසුරින් සබරගමු ජනකවියේ විෂය ක්ෂේත්‍රය, වස්තු විෂය නොහොත් අන්තර්ගතය හඳුනාගැනීම එතරම් අපහසු නොවන අතර, එහි විෂය ක්ෂේත්‍රය ඉතා සරළ ලෙස මෙසේ වර්ග කළ හැකිවේ.

(i) - **වෘත්තීය ආශ්‍රිත ජනකවි**

1 - පතල් කවි
2 - කරත්ත කවි
3 - ඔරු - පාරු කවි
4 - නෙළුම් කවි / ගොයම් කවි
5 - පැල්කවි
6 .- කුරහන් කවි
7 - පත් කවි

---

1. 1991 - **කුකුළු කෝරලේ ජනකවි**
කලවානේ ජයසේකර
රත්න මුද්‍රණාලය - නිවිතිගල.

1991 - **සබරගමුවේ ජනකවි**
බන්දුල ලියනගේ
තිලක් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, පන්නිපිටිය.

1994 - **සපරගමුවේ ජනකවි**
මුනිදස දෙඩන්තැන්න
තිලක් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, පන්නිපිටිය.

1994 - කුකුළු කෝරලේ ජනකවි හා ගැමි සංස්කෘතියක ලක්ෂණ
චන්ද්‍රන සමරවික්‍රම
තිලක් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, පන්නිපිටිය.

1995 - **රුවන් කවි**
බන්දුල ලියනගේ
ඉසුරු මුද්‍රණාලය - කුරුවිට

(ii) - ඇදහිලි ආශ්‍රිත කවි

8 - දේව පූජා කවි
9 - ශාන්තිකර්ම ආශ්‍රිත කවි
10 - සිරිපා කවි
11 - වස්කවි
12 - සෙත් කවි

(iii) - පරිසරය ආශ්‍රිත ජන කවි

13 - කඩඉම් කවි
14 - ගම් බිම් කවි
15 - ඇල - දෙළ - ගංගා කවි
16 - තලමල් කවි
17 - ඇත් කවි

(iv) - මනෝභාව ආශ්‍රිත ජනකවි

18 - තේරවිලි
19 - අනුවේදනීය කවි
20 - අවලාද කවි
21 - විහිළු කවි
22 - තහංචි කවි
23 - දිවිරුම් කවි
24 - ආලය හා ආදරය පිළිබඳ කවි

(v) - සෞන්දර්යාත්මක ජන කවි

25 - රංග කලාව හා ගැමි ක්‍රීඩා ආශ්‍රිත කවි
26 - කවිත්වය හා වැනුම් මඟ හෙළිකරන කවි

(vi) - ජන සාහිත්‍ය ග්‍රන්ථාවලියට එක්වූ ජන කවි

27 - තුන් සරණේ
28 - පුරාණ හිමගත වර්ණනාව හෙවත් ශ්‍රී පාද වන්දනා ගමන
29 - සමනළ හෑල්ල

30 - සමනළ වැඳීම
31 - සමනළ විස්තරය
32 - ශ්‍රී පාද ගමන
33 - සූවිසි විවරණය
34 - කාපිරි කතාව
35 - ගල කැප්පු සැහැල්ල
36 - දැඩි මුණ්ඩ අවතාරය
37 - හීරළු සන්දේශය
38 - ශ්‍රී පාද සන්දේශය
39 - දළ රකුසු සන්දේශය
40 - කැටකිරිලි සන්දේශය
41 - ගිරත් බාස් හටන/ පතල් කවි
42 - බෝගල පතලේ විස්තරය

මේ ආකාරයෙන් වර්ග කළ හැකි ජන කවි රාශියකින් සබරගමුවේ ජන කවි ක්ෂෙත්‍රය වර්ධනය වී ඇත. සබරගමු ජනකවියේ විෂය ක්ෂෙත්‍රය යටතේ එහි ඓතිහාසික සමාජීක හා සංස්කෘතික පෙරළිය හා සමාජ තොරතුරු ද සපයාගත හැකි වේ. ග්‍රාම නාම ආශ්‍රිතව ද, ගංගා ඇල දෙළ හා කඳු ආශ්‍රිතව ද ප්‍රාදේශිය තොරතුරු රැසක් සබරගමුවේ ජනකවියෙන් හෙළිවේ. ඇදහිලි හා විශ්වාස, ශාන්ති කර්ම ආශ්‍රිත බලි හා තොවිල් ආදිය පිළිබඳව තොරතුරු හඳුනාගත හැකි වේ. ඊට අමතරව මඳ වශයෙන් සබරගමු ජන කවියාගේ මනෝ භාවයන් ද කවිත්වය හා වැනුම්මග පිළිබඳ සාහිත්‍යමය හැඟීමක් ඇතිකර ගැනීමට ද අපට අවකාශ සැලසේ.

සබරගමු ජනකවියේ විෂය ක්ෂෙත්‍රයේ ප්‍රධාන තැනක් උසුලන්නේ **පතල් කවි** යයි. කෑගල්ලේ **බෝගල** සහ රත්නපුරයේ **දූම්බර** මිනිරන් පතල් සමූහය ආශ්‍රිතව නිර්මාණය වූ පතල් කවි දහස් සංඛ්‍යාවක් සබරගමු ජනකවි ක්ෂෙත්‍රයට එක් වී ඇත. සබරගමුවේදී නිර්මාණයවූ "**ගිරත් බාස් හටන**" හා "**බෝගල පතල් විස්තරය**" නැමැති නිර්මාණයන් ද පතල් කවි සමූහයට එක් වී ඇත. සබරගමුවේ පතල් කවි මූළු දිවයින පුරාම ජනශ්‍රැති වශයෙන් ව්‍යාප්ත වී තිබේ.

සබරගමු ජනතාවගේ ප්‍රධාන වෘත්තිය වන මැණික් පතල් ආශ්‍රිත ජනකවි ලැබෙන්නේ ඉතාම මඳ වශයෙනි. මෙය පර්යේෂකයින්ගේ විශේෂ අවධානයට ලක්විය යුතු කරුණකි.

දුම්බර හා බෝගල මිනිරන් පතල් ආශ්‍රිතව කියැවුණ පතල් කවි, කුරුණෑගල - ගාල්ල වැනි වෙනත් ප්‍රදේශවල මිනිරන් පතල් අතර ද ජනප්‍රිය වීමෙන් පතල් කවි දිවයින පුරාම ව්‍යාප්ත විය.

24. කුව්වි කන්ද පාමුල මිනිරන් පතළේ
බැසලා සිව් සියක් කළුගල් සිදුරු කළේ
උතුරු දෙසට දේනාවක් ගමන් කළේ
විස්තර කියමි නොම්බර දෙකෙ පතල් වලේ

25. දුම්බර කන්ද පාමුල මිනිරන් පතළේ
බැසලා බඹ තිහක් කළුගල සිදුරු කළේ
බස්නාහිරට දේනා දෙක ගමන් කෙළේ
විස්තර කියමි දුම්බර මිනිරන් පතළේ

26. නැව්ගල කන්ද පාමුල මිනිරන් පතළේ
බැසලා බඹ තිහක් කළුගල සිදුරු කළේ
බස්නාහිරට දේනා දෙක බේද කෙළේ
විධාහැර බලන් බෙම්මුල්ලේ පතළේ

වචන කිහිපයක් මාරුකර ගනිමින් එකම රටාවක් අනුව, එක් එක් පතල් වල එකම කවිය භාවිතාවූ ආකාරය මෙයින් හෙළිවේ. පතල් කරුවාගේ භයානක හා කටුක අද්දැකීම්, වෙහෙස මහන්සිය දුක් වේදනා පමණක් නොව, ආදරය, ප්‍රේමය වැනි මනෝභාවයන් ද පතල් කවියෙන් හෙළි කෙරේ.

සබරගමුවේ ජනකවියට ඇතුළත්වන ගැල් කවි ද රාශියකි. මෙම කවිවලින් ග්‍රාම නාම රාශියක් මෙන්ම කරත්ත ගාල් කළ ස්ථාන රාශියක් හඳුනාගත හැකි වේ. එයින් ගැල් කරුවන්ගේ ගමන් මාර්ගයන් ද හෙලිවේ.

---

2. පතල් සිව්පද - 04 පි.
3. කුකුළු කෝරළේ ජනකවි - 26 පි.

27. රත්නපුරේ තිරිවානා කැටියේ දී
කැටන්දෙලේ පැල්වාඩිය කොනේ දී
පතුල්පාන වැලි මළුවේ කන්දේ දී
ලියක් දුටිමි සන්නස්ගම වෙලේ දී [5]

කරත්තය භාණ්ඩ ප්‍රවාහනයට පමණක් නොව, වන්දනාගමන් හා වෙනත් ගමන් බිමන් සඳහා ද උපයෝගිකරගත් ප්‍රධාන ප්‍රවාහන මාධ්‍යය විය.

28. සොඳුරුව තැනූ බති මාමගෙ කරත්තේ
බැඳලා කැහැටු ගොන් දෙන්නෙක් දෙපැත්තේ
කෙවිටයි තෝන් ලණුවයි දුරතට ගත්තේ
මාර්ටින් ආත ආවද අයගම පැත්තේ [6]

සබරගමුවේ ගැල්කරුවා කෙතරම් දුක් ගැහැට ලැබුවත් කාලය ගෙවුවේ විනෝදයෙනි.

29. ගොනාගේ අගක් කැඩිලා දක්කනවා
පනාවේ කොනක් කැඩිලා පීරනවා
මනාවේ බතුන් මේවට මදි වෙනවා
හිනාවේ මගේ මේවට පණ යනවා [7]

පුල්ලියා නම් කන්ද දුටු විටම නවතීවි. එහෙත් කන්ද පල්ලමේ දී නම් කරත්තය දක්කාගෙන යා යුතු වන්නේ ඉතා සෙමින් සීරුවෙනි.

---

4 - පතල් කවි සමාජය අත්පිටපත
5 - රත්නපුරේ ජනකවි - 02 පි.
6 - කුකුළු කෝරලේ ජනකවි - 21 පි.
සසඳන්න

අවිය වඩන ලොකු අප්පුගෙ කරත්තේ
කැහැටු ගොන්බාන ඇදලා දෙපැත්තේ
කවට කමට විය අඹරාගති නැත්තේ
ගොයින් ලිහිව් ගිං තොට නැන්දගෙ වත්තේ
- ජන සම්මත කවි ගී - 141 පි.

7 - රත්නපුරේ ජනකවි - 01 පි.

30. කල්බලා සිටිය සමනලයින් දෙන්නා
මල්තලා වැඩෙන බමරුන් රොන් ගන්නා
පුල්ලියා කන්ද දුටුවම නවතින්නා
පල්ලමේ සෙමෙන් දක්කමු ගොන් දෙන්නා

සබරගමුවේ දී ගැල් අදින ගොනාටත් නිදහසක් ලැබෙන තැනත් ඇත. එනම් බලංගොඩ ගාල්පොලේ දිය.

31. ජඃ පිවමඃ කියා ගැල්රිය දක්කනවා
නිදිමත යන්න කවි සී පද පවසනවා
බලංගොඩ ගාල ඉදිරියෙ හමුවෙනවා
ඇඳපන් ගොනෝ එතැනදි නිදහස දෙනවා

බලංගොඩ ගාල්පොල ගොණුට පමණක් නොව්, ගැල්කරුවාට ද සුව පහසු තැනැක් විය. නැමට දිය ඇලි ඇත. කෑමට හොඳ පළාකොළ ඇත. දින දෙකතුනක් නැවතී සිටීමට වුවද එය පහසු ස්ථානයක් වූ බව කරත්ත කවි වලින් හෙළිවේ.

32. පෙට්ටිගල හොඳයි පෙට්ටියකට ගන්ඩ
දිය ඇද හැලෙයි අපෙ ඇඟපත නලවන්ඩ
පලාකොළ තිබෙයි කෑමට මලවන්ඩ
බලත්ගොඩ හොඳයි දිගටම නවතින්න [10]

සබරගමු ජනකවියේ විෂය ක්ෂෙත්‍රයට ඔරු - පාරු කවි ද ඇතුළත් වේ. ගමනාගමනයට මෙන්ම, දැව සහ භාණ්ඩ ප්‍රවාහනයට ද ඔරු පාරු භාවිතා කිරීම සබරගමු ජනතාවට ඉතා හුරු පුරුදුය. වළවේ කළු හා කැලණි ගංගා ගලා යන්නේ සබරගමුවෙන් බැවිනි. ජන කවියා. රෑ පානේ ඔරු පදින්නන්ට දුන් උපදේශයකි මේ.

8 - සපරගමුවේ ජනකවි - 107 පි
9 - සපරගමුවේ ජනකවි - 116 පි.
10 - සපරගමුවේ ජනකවි - 116 පි.

33. හඳපානේ ඔරුව පැදගෙන ගඟ මැද්දේ
තොටුපොල නොදන ගිය තොටියා විය බැද්දේ
ඉහළට පදින ඔරු ඇයි පහළට පැද්දේ
බැස යන දියේ ඔරු නොපදිව් එක ඉද්දෙ?[11]

ඔරු - පාරු පදින තොටියන්ට ඇති වන අනතුරු බොහෝය. සබරගමුවේ තොටියාට එවන් අවස්ථාවලදී සමන් දෙවියන් මිස වෙනත් කාගේ පිහිටක් දැයි ජනකවියාට සිතේ.

34. කිරුවන්ගල ගලේ මීදුම පේන්නා
වේවැල් දෙලේ තද ගංවතුර එන්නා
දෙමව්පියෝ දෙන්නට දුක් සිතෙන්නා
සමන් දෙවියනේ මා වතුරේ යන්නා[12]

රුහුණු මායා පිහිටි යතුවෙන් වූ ඉපැරණි බෙදීම අනුව, මුනි සිරිපා පිහිටි සමනළ කඳු මුදුන තුන් රටටම අයිතිවූවක් සේ සැලකිණි. එහෙත් එය රත්නපුරයට වඩාත් සමීප වන අතර, සිරිපා මහිමය කියැවෙන ජනකවි රාශියක්, සිරිපා වන්දනාකරුවන් ගෙන් සබරගමු ජනතාවට උරුම වී ඇත.

සමන් දෙවිඳුගේ ආරාධනය මත. බුදුරජාණන් වහන්සේ විසින් මුනි සිරිපා සළකුණ සමනළ ගිරි මුදුනේ පිහිටුවා වදළ බව ජනකවියා සඳහන් කරයි.

35. මං බැස ගඟුල ගෙට එම් ගෙන්තම් පාන
පිං මද අයට සීමා පවුරකි එතන
ඉන් බැස ගිය කලට මලුවටලු පහන
වම් සිරිපතුල තුබුවේ සමනළ මුදුන[13]

මුණි සිරිපා වැඳීමේන් මතු බුදුවන මෛත්‍රී බුදුන් දකිය හැකි බවට සබරගමුවේ ජන කවියා තුළ ඉමහත් විශ්වාසයක් ඇත.

11 - සපරගමුවේ ජනකවි - 11 පි.
12 - සපරගමුවේ ජනකවි - 117 පි.
13 ජන කවිය හා ජන දිවිය - 19 පි.

36. එන මෙත්තේ බුදු මඟුලට එන්නේ
ජය ගත්තේ තුන් වරක් ගොසින්නේ
මේ වැත්තේ අපි සමනළ එන්නේ
සමන් දෙවිඳු හට මේ පිං දෙන්නේ[14]

37. සින්දු කියන් අප හැම දෙන කැලණිය වැඳලා
දකු සොඳට පෙති පිළිමේ දේතින් වැඳලා
ස්වර්ණ හංස තිලකේ සිරිපාදය වැඳලා
එන ඒ මෙත් බුදුන් දකිමු සිරිපා වැඳලා[15]

හත් අඩියේ කවි පෙළක ජන කවියා සඳහන් කරන ලෙ
සියළුම බුදු වරුන් සමනළ ගල මුදුනේ සිරිපා පිහිට වූ අයුරු

38. ඔක්කොම මුනි බුදුව ලොවට
සමනළ ගල පිටට වැඩිය
දක්කම සිරිපාද එබු
අණ සක මිහි දෙරණ තලය
ඔක්කොම සිට නපුරු දුදන
යනෙන තැනදි කළොත් විනය
මක්කම තිබු අඩියේ විණ
ඉරිඳ රිවි අණින් කැපිය

සමනළ කන්දේ අලි ඇතුන් පිළිබඳ අනුවේදනීය පුවත
ජනකවියේ සඳහන් වන්නේ මෙලෙසිනි.

39. සමනළ ගලේ කාබසිනා අලි ඇතුනේ
කියත ගෙනත් දළ කැප්පූ තැන වැටුනේ
බලනට යමුව අලි ඇතු දත් දුන්නු නැතේ
වඳිනට යමුව සිරිපා සමනළ මුදුනේ[17]

සබරගමුවේ ජනකවියේ විෂය ක්ෂෙත්‍රය ඇතුළත්වන පැල්
වලින් එහි කෘෂිකාර්මික පරිසරය පිළිබඳව තොරතුරු රැස
හෙළිකරගත හැකිය.

14. පුරාණ හිමගත වර්ණනාව - 10 - පි.
15. ජනකවිය සහ ජන දිවිය
16. ජන කවියා සහ ජනදිවිය - 28 පි.
17. සිංහල ජනකවි සංග්‍රහය - ii - 43 පි.

පැණි - ලා තැනූ කුරහන් පිට්ටු සබරගමු ජනතාව අතර ජනප්‍රිය අහාරයක් වූ ආකාරය ජනකවියා මෙසේ සඳහන් කරයි.

40. කළුගල් මූකලානේ කුරහන් පිට්ටු
කපලා කොටලා පැණි ද හැඳූ පිට්ටු
කන්නට මෙ අප රුසි නොමකර පාරට්ටු
ගත බල වඩයි මන පිනවයි නොව කෙට්ටු [18]

කිරිඇල්ල ප්‍රදේශයට වැසි කාලය ළඟාවන විට ඇල් හේන්වල වල් පඳුරු වැවී වගාවන් යටවී යන ආකාරයත්, එනිසා ගොවියන්ට ඇතිවන සිත් වේදනාවන් සබරගමු ජනකවියෙන් හෙළිවේ.

41. අඳුරු වෙලා කිරිඇල්ලට වසින්නා
පඳුරු වෙලා හේනේ වැල් වැඩෙන්නා
අක්ක නගා නැති අරුමේ දනෙන්නා
මෙදෑ ඇල්හේන නෙළුමෙන් ඇරෙන්නා [19]

අධික වැසි ගොවියාට හිරිහැරයක් වෙයි. එහෙත් කලට වැසි එල ලැබීම තරම් තවත් සම්පතක් ගොවියාට නැත. කලට වැසි එල ලැබී ගම් බිම් තෙත්වී පොළව නැවුම් සුවදින් යළි ජීවය ලබන අකාරය සබරගමු ජනකවියා දක්වුයේ මෙලෙසිනි.

42. කාලෙට වැසි එන්නෙ සාගත දුරුවෙන්නයි
වේලිද ලියැදි ගං ඇල දෙල පිරෙන්නයි
වැලිබිම තෙත්ව නැවුම් සුවඳක් - එන්නයි
සාරව පොලව ජීවය යළි උතුරන්නයි [20]

18. රත්නපුරේ ජනකවි - 02 පි.
19. රත්නපුරේ ජනකවි - 03 පි.
සසඳන්න : අඳුරුලලා සෙංකඩගල වසින්නා
පඳුරුලලා වල් කුඩුමැටි බඳින්නා
අක්ක නගෝ ඇති අරුමේ දනෙන්නා
මෙදෑ අද කුඹුර නෙළුමෙන් ඇරෙන්නා
- ගොවි ගෙදර ජනකවි - 104 පි.
20. රත්නපුරේ ජනකවි - 05 පි.

එහෙත්, සබරගමුවේ ගොවියා ගේ පපුව දන්ට පටන් ගන්නේ මාස ගණනක් වර්ෂාවෙන් තොරව, දිගටම පායමින් වේලුණු බිම් ගිණියම් වී කැකෑරෙන විටය.

43. මාස ගණන් වැස්ස නැතිව දිගටම පායන්නේ
වෙලි ලියැදි දිය හිඳිලා ඉරි තැලිලා යන්නේ
වේලුණු බිම් ගිණියම් වී අව්ව කැකෑරෙන්නේ
පාළු කුඹුරු ගැන සිහිවන කලට පපුව දන්නේ[21]

වල් අලින් ගෙන් ගොවිතැනට වන පාඩුව අන් හැමටම වඩා බලවත් විය. පනාමුරේ ඇත් රංචුව ළං වූ විට මුළු කුඹුරුයායම විනාශයට පත්වෙයි.

44. පනාමුරේ ඇත් රංචුව ළං වෙනවා
විග විතුරේ වී අමුණම වනසනවා
කිරිඅප්පුට බිත්තර වී ණය වෙනවා
මෙද පොටෙත් ඇලයා මට වද දෙනවා[22]

ආදරය - ප්‍රේමය හා රාගය පිළිබඳ හැඟීමෙන් යුත් මනෝභාවයන් ගෙන් පිරි ජනකවි වලින් ද සබරගමුවේ ජනකවි ක්ෂේත්‍රය පුළුල්වී තිබේ.

ජනකවියා මේ කියන්නේ පොඩි සිඤ්ඤො නැමැත්තෙකුට රහස් පෙමින් බැඳී සිටි 'රට කජ්ජා' නමැත්තෙකුගේ බිරිඳගේ චරිතයෙන් බිඳකි.

45. ආදර ගුණ වඩන පොඩි සිංඤො උඹට
මේවර කියම් කරුණක් අප හොඳින් සිට
නාඹර පහේ ලොකු තියඹරේක් මෙමට
අරන් වරෙන් රට කජ්ජට නොපෙනෙන්ට[23]

සිය සැමියාට රහසින් පොඩි සිංඤේ ස්මඟ පවත්නා රහස් සම්බන්ධයක් ඉන් ධ්වනිත වේ. නාඹර පහේ ලොකු 'තියඹරයක්' යනු ලිංගික සංකේතයකි.

21. රත්නපුරේ ජනකවි - 05 පි.
22. ගොවි ගෙදර ජන කවි - 178 පි.
23. රත්නපුරේ ජනකවි - 16 පි.

මේ තැනැත්තා 'සෝපියා' නමැත්තියගෙන් වතුරත්, දුම්කොළත් ඉල්ලා සිටින්නේ සීතල හැරගන්නටම ද?

46. සීතලේ බැරිය මේ රට උහුලන්ඩ
වතුර ටිකක් දෙනවද සොපියෙෝ බොන්ඩ
දුංකල ටිකක් දෙනවද මගෙ විට කන්ඩ
පිං කළ ළඳේ දෙර ඇරපන් ගෙට එන්ඩ [24]

මොහුගේ අපේක්ෂාව කුමක් දැයි සොපියාට දැනුණි. ඔහු දඟලන්නේ ගෙට ඇතුල්වීමටය. ඒ දැනගත් සොපියා මෙසේ කීවාය.

47. වතුර පිපාසේ බැරුවා ඉවසන්ඩ
වතුර ටිකක් දෙනවද සොපියෙෝ බොන්ඩ
ඔන්න ළිඳ මෙන්න සෙම්බුව බීපන්න
නපුරු කැලේ මා අරගෙන නොදුවන්න [25]

ඔහුගේ රාගික ආරාධනය පිළිනොගත් සොපියා ඔහුට දුන් පිළිතුරු අගෙයි. 'ඔන්න ළිඳ - මෙන්න සෙම්බුව - ඉතිං බීපන්' යනුවෙන් කී සොපියාගේ පිළිතුරු ඔහුගේ බලාපොරොත්තු සුං කළේය.

අනුවේදනීය තොරතුරු රැසක් සබරගමුවේ ජනකවියට එක්වී ඇත.

නාදෙණියේ ආරච්චිල මරා දැමූ ආකාරය සහ ඒ වෙනුවට සොරුන් පස් දෙනෙකුට එල්ලුම්ගස මගින් මරණීය දණ්ඩනය ලබාදුන් ආකාරය පිළිබඳව කෑගල්ල ප්‍රදේශයේ ඇතිවූ අනුවේදනීය පුවතක් ජනකවියෙන් හෙළිවේ. 'නාදෙණියේ සිංදුව' නමැති එය පළවී ඇත්තේ මෙලෙසිනි.

---

24-25. රත්නපුරේ ජනකවි - 19 පි.

48. ආ බව නොදනුණී ගෙදරට වස සොර වගයක්
නැත කිසිම රැකවලක්
මේ දනමුතුකම කරන්ට හාමිගෙ සිතුවත්
පෙර තිබුණු එදිරියක්
ඌ වැනි එකෙකුගෙ අසාපු සැටි උත්තරයක්
එක් සිත් උණු සැටියක්
නාදෙණියේ ආරච්චිල මරාපු සැටියක්
මුන් කරපු පෙරලියක්[26]

49. කැගල්ලේ ඕවිට හරි සෙයිලම මැද්දේ
පෝරකයක් ඇදේදේ
ඒ ගොල්ලගෙ වස නපුරු කමට කළ යුද්දේ
ගැන නැත පරසිද්දේ
අපේ තරුණ ළමයින්ගේ හිත බය වෙච්චි
ඇඟ හිවුඩු පිපිච්චි
ඇනේ අදින කොට ලෑල්ල පාත මැට්ච්චි
පස්දෙන එල්ලෙව්වී[27]

සොරකම්, මිනීමරුම වැනි අපරාධයන්ට දඬුවම මරණය නොහොත් එල්ලුම්ගස (= පෝරකය) බව ජනකවියා කියා ඇත.

වඳුරන් කුන්සිය ගණනක් රැකවල්ලාගෙන සිටි විශාල වෘක්ෂයක් කපා - දෙපෙරලා ඒ වඳුරන් රාශිය මරණයට පත්කළ ආකාරය දක්වෙන අනුවේදනීය පුවතක් සබරගමුවේ කුකුළු කෝරලේ[28] ප්‍රදේශයේ ජන කවියට එක් වී ඇත. මිනිසා, තිරිසනාටත් වඩා පහත්කම් කළ ආකාරය මෙම අනුවේදනීය පුවතින් අනාවරණය වේ. මෙය 'කවිකොළය' කට එක්වූ පුවතක් විය හැකිය.

26 - 27 සාහිත්‍ය විචාර (1964) - 27 පි.

50. ඉඩමේ නම සකි අහන්ඩ කදිමයි
විටියල හේනයි පවසන්නේ
අරුමේකට මෙන් එක් මුගුණගහක්
අහස උසට වැටිලා තිබුණේ
මේ වන වසනා රිලා වඳුරු රැළ
ලැගුමට මේ ගසටම එන්නේ
දරුමේ නොමදත් පවිටෝ දෙන්නෙක්
කළ දේ කවියෙන් පවසන්නේ [28]

මීට අමතරව සබරගමුවේ ජනකවියේ විෂය ක්ෂෙත්‍රයට එක්වන (i) ජන සම්මත ඇදහිලි (ii) සංස්කෘතික පෙරළිය (iii) සමාජ තොරතුරු (iv) ග්‍රාමනාම (v) තේරවිලි (vi) ඇත් කවි (viii) වැනුම් මහ හා කවිත්ත්වය යටතේ ජනකවි රාශියක් ඉදිරියේ විමර්ශනයට ලක්වේ.

28. කුකුළු කෝරළේ ජනකවි - 13 පි.

ACCESSION NO 47588
CLASSIFICATION NO 396.209 549

# සබරගමුවේ ජනකවියෙන් හෙළිවන ජන සම්මත ඇදහිලි

3

දිවයින තුළ බුදු දහම ස්ථිර ලෙස මුල්බැසගෙන තිබුණ ද., අති පුරාණ ජන සම්මත ආගමෙහි අත්‍යවශ්‍ය අංගයක් වූ ප්‍රාණාත්මක දෘෂ්ටික අණ විණ තවමත් පවතී. තෙරුවන් ඇදහීමට අමතරව, ආරක්ෂක දේවතාවුන් පිදීම, යක්ෂයින් හා භූතයින් පිදීම, මළවුන් පිදීම, වෘක්ෂ සහ ගිරි ශිඛර පිදීම වැනි ජන සම්මත ඇදහිලි ක්‍රම අභාවයට නොගියේය.

සුබවාදි දෙවි දේවතාවුන් මෙන්ම, අසුබ වාදී යක්ෂ - ප්‍රේත - පිසාච, භූත, කුම්භාණ්ඩයන් රැසක් ප්‍රාණාත්මක දෘෂ්ටික ජන සම්මත ඇදහිලි වලට ඇතුළත්වේ. සබරගමුවේ ජනකවියෙන් ද මෙම ජන සම්මත ඇදහිලි ක්‍රම රැසක් අපට හඳුනාගත හැකි වන්නේය.

ප්‍රාග් ආර්ය යුගයේ සිට පැවැති අපේ ඇදහිලි ක්‍රම, බුදු දහමේ ඇදහිලි ක්‍රම සමග සම්මිශ්‍රණය වී "සිංහල බුදු දහම" නිර්මාණය වී තිබේ. දෙවියන් හා යක්ෂයින් බෞද්ධ ලෝක විස්තරයයෙහි ද යථා සත්‍යයක් ලෙස පිළිගැනීම ද මෙහිලා විශේෂයෙන් බලපා ඇත. සිංහල බුදු දහම නොහොත් "ව්‍යවහාරික බුදු දහම" අනුව සියලුම දෙවියන්ට හා යකුන්ට පුද පූජා පැවැත්වුවද, බුදු රජාණන් වහන්සේ එම සියළු දෙවියනට හා යක්ෂයන්ට වඩා අග්‍රගණ්‍ය බව අවිවාදයෙන් පිළිගැනේ. එසේ ම දෙවියන් සහ යකුන් බුදු අණසක අනුව ක්‍රියා කරන පිරිසක් සේ පිළිගැනේ.

51. බණ දන්නේ නැද්ද යකුනි ගෞතම මුනිඳුන්නේ
අණ දන්නේ නැද්ද යකුනි වෙසමුණි සුරිඳුන්නේ
වෙන දෙවියන් හැමට යකුන් බය උණුබව දන්නේ
අණ දැනගෙන යන්න යකුනි දැඩිමුඩ සුරිඳුන්නේ [1]

1- ගලකැප්පු සැහැල්ල - 03 පි.

52. උතුන් තිලෝගුරු මුනිඳුගෙ විවරණ අරගෙන
උතුන් කීර්ති නිල් මේවර වේවැල අරගෙන
යකුන් විසින් පිස්සුබූත මායන් කරවන
මෙතුන් ලොවට එන උවදුරු දේස මුදලන [2]

53. මැද්ද මණ්ඩලේ විමසා බලන්නෝං
බුද්ද ශාසනේ දළද වඳින්නෝං
සුද්ද ලෙසට කවි සී පද කියන්නෝං
බුද්ද අණින් සිව්පද වස් අරින්නෝං [3]

පර්වත සහ පර්වතාධිගෘහිත දෙවිවරු පිදීමේ ප්‍රාග් ආර්ය යුගයේ සිට පැවැති පුද සිරිත සබරගමුවේ ජනතාව තුළ ද මුල්බැසගත් ප්‍රධාන තම ජන සම්මත ඇදහිලි ක්‍රමයක් බවට පත්වූ ආකාරය සබරගමු ජනකවියෙන් හෙළි කෙරේ.

සමනළ කඳු මුදුනට අරක්ගෙන සිටි ප්‍රාදේශීය නායකයෙකු වූ **සුමන** නමැත්තා පසුව ප්‍රාදේශීය දෙවියෙකු වශයෙන් කාලාන්තරයක් තිස්සේ, වැඳුම් පිදුම් ලබමින් **සුමන සමන් දෙවියන්** වශයෙන් ජන සම්මතයට පත්ව, බුදු සිරිපා පිහිටුවීම සහ බුදු සසුන මෙහි පැතිරීමත් සමග, සසුන රැකීම භාරගත් දෙවියන් වශයෙන් පුද සැළකුම් ලැබූහ. මේ නිසා සමනළ කඳු මුදුන සැදැහැවතුන්ගේ ගෞරව ආදරයට පාත්‍ර විය. පූජනීයත්වයට පත්විය. එය බෞද්ධයන්ගේ පමණක් නොව, දිවයිනේ සෙසු ආගමිකයින්ගේද ගෞරව ආදරයට පාත්‍ර විය.

සමනළ කඳු මුදුන; ජයශ්‍රීමහා බෝධීන් වහන්සේ, මහියංගන මහා චෛත්‍යය සහ මහනුවර දන්ත ධාතූන් වහන්සේ තරමට ම ගැමියන්ගේ ආදර ගෞරවයට පාත්‍ර වූවකි.

---

2. දැඩිමුන්ඩ අවතාරය - 08 පි.
3. ගොවි ගෙදර ජනකවි - 31 පි.

54. අනුරපුරේ බෝ රුප් වැඳ ගතිමි වරන්
මහියංගනේ චෛතිය වැඳ ගතිමි වරන්
සිරිපාද පද්මේ වැඳ ගතිමි වරන්
දන්තදතු දළද කරඬුවෙන් වරන්[4]

55. මේ යන්නේ වඳිනට අපි සමනළ
දෙවියන්නේ පිහිටයි නිති හැම කල
සිහි වන්නේ බුදු ගුණමයි සිත තුළ
නැතින්නේ ගොඩ පසුකර යමු බල[5]

බුදු සිරිපා පහස ලැබූ සමනළ ගිරි මුදුන සැදැහැවතුන් දුටුවේ ශ්‍රී ලංකාවට ම අධිපති පර්වතය ලෙසිනි. එය පිදුරුතලාගල කඳු මුදුනටත් වඩා උස් වූවක්සේ ද, ප්‍රධාන ගංගා සමනළ කඳු මුදුනින්ම ගලා යන්නාක් මෙන් ද ගැමියා විශ්වාස කෙළේය. එබැවින් සැදැහැවතුන් තුළ සමනළ කඳු මුදුන කෙරෙහි අපරිමිත ගෞරව සම්ප්‍රයුක්ත භක්ත්‍යාදරයක් උපන්නේය.

56. ලංකාවට අදීපති පර්වත මුදුනේ
සිංහාසනේ වද මුනිඳුට පහළ උනේ
පිහිටි සිරිපාද පර්වත කොන මුදුනේ
ගංගා සතර පර්වතයෙනි උපත උනේ[6]

රාත්‍රී කාලයේදී තනිවම, ගැල් පදවන ගැල් කරුවා, තමාට ඈතින් පෙනෙන කඳු ශිඛර අතුරින් උතුම් සමනළ කණ්ද දකින්නේ බැති සිතිනි. එය දැකීමෙන් තමා ශාන්තියක් ලබාගත් මොහොතකි, මේ ජනකවියෙන් හෙළි වන්නේ.

57. අලට කණ්න බැරි අලගල්ලේ කන්ද
බතට කණ්න බැරි බතලේගල කන්ද
හුනට කණ්නබැරි හුන්නස්ගිරි කන්ද
මෙකඳු තුනට නායක සමනළ කන්ද[7]

---

4. ගොවි ගෙදර ජනකවි - 30 පි.
5. රත්නපුරේ ජනකවි - 07 පි.
6. රත්නපුරේ ජනකවි - 07 පි.
7. සපරගමුවේ ජනකවි - 97 පි.

ශාන්තිකර්ම හා කන්නලව් සඳහා කෙරෙන පූජාවිධි වලදී සමන්දෙවියන් පිළිබඳව මෙවැනි කෝල්මුර කවි කියැවේ. ඇතෙකු පිට ගමන් කරන සමන් දෙවිඳු විසින් බුදු සසුන රකිනු ලබන බව මේ ජනකවියෙන් අදහස් විය.

58. සුද්ද ලෙසින් නිති ගත බබලන්නේ
සුද්ද ඇතා පිට වද වැඩ ඉන්නේ
බුද්ද සාසනේ දියුණු කරන්නේ
සුද්ද සමන් දෙවියෝය වඩින්නේ[8]

බුදුසසුනේ දැක්වෙන **සතරවරම්** දෙවිවරුන් සතර දෙනා වශයෙන් සැළකෙන්නේ, **ධෘතරාෂ්ට. විරූඪ. විරූපාක්ෂ** සහ **වෛශ්‍රවණ** යන දෙවිවරු වෙති.[9] එසේ වුවද ලක්දිව සතර දිශාවට අධිපති දෙවිවරුන් සතර දෙනා[10] ලෙස පුද ලබන්නේ **දෙවිනුවර විෂ්ණු - කැළණියේ විභීෂණ - සබරගමුවේ සමන් සහ කතරගම කන්දකුමාර** යන දෙවිවරු වෙති. ජන සම්මත ඇදහිලි අනුව සබරගමු දිසාවේ පොදුවේ "**සතරවරම් දෙවියන්**" ලෙස සැළකෙන්නේ මේ දෙවිවරු සතරදෙනා වෙති. සියලුම සුභ කටයුතු වලදී සතරවරම් දෙවියන් සිහිකොට ආශිර්වාද ලබාගැනීම හා වරම් ලබා ගැනීම ජනතාවගේ සිරිතක්ව පවතී.

59. අවර උදය පායන ඉරි දෙවිගෙ වරන්
වෙසහ පුරට පායන සඳ දෙවිගෙ වරන්
ලොව සතහට මිතිකත් දෙවියන්ගෙ වරන්
සිව්පද කියන අප රැකදෙන් සතර වරත්[11]

8. සපරගමුවේ ජනකවි - 88 පි.
9. පිරුවාණා පොත් වහන්සේ - අතුරළියේ ඉන්දරතන හිමි. (මහාසම්මත සූත්‍රය) 200 පි.
10. කාලය අනුව හා ප්‍රදේශ අනුව වෙනස්කම් ඇත. විස්තර සඳහා බලන්න - සිංහල දේව පුරාණය - 443 පි.
මාහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස - එච්. එම් එස්. තුන්දෙනිය
11. ගොවිගෙදර ජන කවි - 30 පි.

60. හැත්තෑ දෙකේ අඩියේ ඛෙඩි පත්තු උනා
ලෝඩර ඇවිත් වලකට උඩ වාඩි උනා
ගමේ රටේ නැදෑයොත් මතක් උනා
සතරවරම් දෙවි පිහිටයි ගොඩට උනා[12]

61. මල්පැල පහන් අවිලෙන්නේ දෙවියන්ට
පොල්තෙල් පහන් ඇවිලෙන්නේ පෙළ දිගට
බිත්ති දෙකට සවි කරලා මුක්කු වැට
සතරවරම් දෙවි පිහිටයි අපි සැමට[13]

සතරවරම් දෙවියන් උදෙසා මල් පහන් පුදනු ලබන "මල් පැලක්" මිතිරන් පතලය සමීපයේ පිහිටුවා තිබුණි.

ගොයම් කපන ළඳුන් ද සතරවරම් දෙවි පිහිට පැතූහ.

62. උදේ සිටන් වකුටු කොන්ද දිග හැර පල්ලා
අතේ තියෙන ගොයම් මිටිය බිම දපල්ලා
ඉනේ තිබෙන ලේන්සු පොඩි අතට ගනිල්ලා
සතර වරම් දෙවි පිහිටෙන් ගොඩ පලයල්ලා[14]

ආදරණීය බිරිඳ, පතල් ගිය තම සැමියා නිතර සිහි කළේද සතර වරන් දෙවිඳුගේ පිහිට පතමිනි.

63. එනද උදේ තද අව්වේ ගමන් ගියා
එමද උදේ අපෙ මිදුලට ඇවිත් ගියා
හිතේ තිබුණු දේවල් මට නොකියා ගියා
-සතර වරම් දෙවි පිහිටයි පතල් ගියා[15]

අලි ඇතුන්ගෙන් වගාවන්ට හානි පැමිණෙන විට ද ගොවියාට සතරවරම් දෙවියන් සිහිවේ.

---

12. පතල් සිව්පද - 33 පි.
13. පතල් සිව්පද - 35 පි.
14. ගොවිගෙදර ජන කවි - 107 පි.
15. රත්නපුරේ ජන කවි - 26 පි.

64. සතරවරම් දෙවියනි මට උන අවුලා
නිතර සුළං හමමින් පැළ බිම වැටිලා
අලියා කයි පසෙක කිරි වැදි ඉරිඟු බලා
දෙවියෝ ඇතොත් අලියා පල හිමය බලා[16]

සබරගමුවේ ජනතාව, සතරවරම් දෙවි සතර දෙනා කෙරෙහිම භක්තිවන්තයෝ වුවද, ඉන් ප්‍රධාන තැන ලැබුවේ සමන් දෙවිඳුන්ය. සබරගමුව සමන් දෙවියන්ගේ අධිවිය බවට පත්වූයේ එබැවිනි. ශ්‍රීපාද පද්මයේ ශාන්ති ආශිර්වාදය මෙන්ම, සමන් දෙවියන්ගේ බැල්ම හා අනුහස සබරගමු වාසීන් වෙත පවතී.

සමනළ කඳු මුදුන තරණය කොට, මුණි සිරිපා පද්මය වැඳ ගැනීමට, සමන් දෙවිඳුගේ පිහිටාධාරය අවශ්‍ය බව සැදැහැවතුන්ගේ දැඩි විශ්වාසය විය.

65. වට පිට නොබලා පාර බලන්නේ
අඩියෙන් අඩියට සාදු කියන්නේ
දම්වැලෙ එල්ලී දඹය නගින්නේ
සමන් දෙවිඳුනේ අප රැක දෙන්නේ[17]

66. ගුවන් තල දැකල සිත තුළට බිය නොවන්
නුවන් නිතර පන්සිල් පද සිතේ දරන්
නිවන් දකින ලෙස පරලොවට වැඩ කරන්
සමන් දෙවි බලෙන් සිරිපතුල වැඳ වරෙන්[18]

කළු ගඟේ ඔරුපාරු වලින්, යන - එන්නන් පවා තම ගමනට ආරක්ෂාව පැතුවේ සමන් දෙවියන් ගෙනි.

---

16. ගොවි ගෙදර ජනකවි - 186 පි.
17. ජන කවිය සහ ජනදිවිය - 26 පි.
18. ජන කවිය සහ සිංහල සංස්කෘතික ලක්ෂණ - 61 පි.

67. ගමන්යන්ට නැකතින් පාරු පැදගෙන
සමන් දෙවියන්ට පුද පඩුරු දීගෙන
මෙවන් කළු ගඟේ කඳුහෙල් බලාගෙන
අපිත් යමුව බැස දෙවියන්ට වැදගෙන[18]

කමතේ දී ද සමන් දෙවියන් සිහි කරන ගොවියා, සමනළ කන්ද තරම් උස්වූ බැත කන්දක් අපේක්ෂා කරන ආකාරය ද ජනකවියෙන් හෙළිවේ. මෙයින් ධ්වනිත කෙරෙන්නේ බැත කන්දට ගොවියා දැක්වූ භක්තිපූර්වක ගෞරවයයි.

68. සමනල මහ වෙහෙර උසට
ගෙනත් පුරව මේ කමතට
මක්කම මහවෙහෙර උසට
ගෙනත් පුරව මේ කමතට
කැළණිය මහ වෙහෙර උසට
ගෙනත් පුරව මේ කමතට
රන්වැලි මහ වෙහෙර උසට
ගෙනත් පුරව මේ කමතට[19]

තමන් විසින් සිදු කරන ලද පිනකින් හෝ ඇසූ බණකින් ලැබූ පින්, දෙවියණට අනුමෝදන් කිරීමේ දී සමන් දෙවියන්ටද පින් දීම සබරගමුවේ සැදැහැවතුන් අමතක නොකළ ආකාරය මේ ජන කවියෙන් ප්‍රකාශ වේ.

69. සුමන සමන් දෙවියෝ පිං ගන්නායි
පැමිණ තිබුණු සැම දෙස දුරු වන්නායි
අපෙන් සිදුවූ වරදක් හැර ලන්නායි
සුමන සමන්දෙව් විමන වඩින්නායි[20]

18. ජනකවිය හා සිංහල සංස්කෘතික ලක්ෂණ - 61 පි.
19. කමත් හැල්ල - 75 පි.
20. සපරගමුවේ ජනකවි - 17 පි.

70. විමණ වලින් සැම දෙවියෝ වැඩලා
පවණ මේඝ අහසේ වැඩ සිටලා
අලංකාර බුදු බණම අසාලා
**සමන් දෙවියෝ** පිං ගන්නේ වැඩලා[21]

සබරගමුවේ දරුවන් නැති අම්මාලා දරුවන් පැතුවේද සමන් දෙවිඳුගෙනි.

71. වැසි නැති බෙරදිය ගඟට කොයින්දැ
කොළ නැති ගස්යට සෙවන කොයින්දැ
පුතකකු නැතිව මට අඩිය කොයින්දැ
පුතෙකු දෙවන් මට **සමන් සුරින්දැ**[22]

දෙවන ලෝක සංග්‍රාම සමයේදී සබරගමුවේ ජනකවියා යුද ගිනි නිවා සාමය පැතුවේ ද සමන් දෙවියන්ගෙනි.

72. යුද්දය ඇතිවී මේරට වැසියෝ
සෝකෙන් බිය පත්වී ඉන්නේ
රට සිට ඇවිදින් අහස්යන්තරා
මේ රට හැම තැන කැරැකෙනවා
සද්දය ඇසිලා පුදුමවෙලා සිට
බැලුවම උඩු ගුවනේ දුවනා
**සිද්ද සමන් දෙවි** යුද්දෙ නිමාකර
දුප්පත් සෙනඟගෙ ගිනි නිවනා[23]

සමන් දෙවියන් වෙනුවෙන් වෙන්වූ රත්නපුර මහ සමන් දේවාලය සබරගමුවේ ඇති දේවාල වලින් ප්‍රධාන ස්ථානයක් ගනී. එය ලංකාවටම තිලකයක් වූ බව ජනකවියා සඳහන් කෙළේ මෙසේය.

21. සිංහල ජනකවි සංග්‍රහය ii - 56 පි.
22. සිංහල ජනකවි සංග්‍රහය ii - 51 පි
23. සපරගමුවේ ජනකවි - 46 පි.

73. කන්ද උඩින් බසින කලට පෙනේය උඑ මාලිගාව
ඊ දවල් අඳුර නැතිව රන්කොත් බබලන සුබාව
දුම්බරකින් සෙනහ ඇවිත් රුවට කෙරුව මාලිගාව
ලංකාවට තිලකයක්ය සබරගමුව මාලිගාව[24]

දිවයින පුරාම බැතියෙන් අදහන විශ්ණු හා කතරගම දෙවියන් කෙරෙහිද සබරගමු ජනතාව තුළ විශ්වාසය හා භක්තිය පවතී.

කතරගම වන්දනා කිරීමට පෙර, සතර වරම් දෙවි පිහිට පතන සබරගමුවේ ගැමියෝ කතරගමට ගිය පසු කතරගම දෙවියන්ට පඬුරු දැමීටම ද අධිෂ්ඨාන කරගනිති.

74. තිස් දෙන්නෙක් බැසලා මාවතට අපි
නොදුටු ඉස්තාන වැඳ වැඳ යන්ට අපි
සතර වරම් සැම දෙවියෝ පිහිට වෙතී
කතරගමට බැසලා පඬුරු දෙමු අපි[25]

කතරගම දෙවියන්ගෙන් තමාට පිහිට යදිනවාට වඩා, තමාට වරදක් කළ තැනැත්තාට දඬුවමක් ලබාදීම අපේක්ෂා කළ ජනකවි අපට හමුවේ.

75. වඩා සෙනේ ඇතිකළ මගේ බුලත් වැල
කඩා කාපි දළුවත් සමග එහි කොළ
කුඩා කතරගම දෙවියනි පිහිට බල
කඩාපියකො ඕකගෙ හන්දියම මුල[26]

දෙවියන් ලවා තමාට පිහිටක් පැතීමට වඩා, අනුන්ට විපතක් සිදුකරවීමට සබරගමුවේ ජනකවියා පෙළඹුනේ ඇයි?

76- සිල් අරගෙන ගියයි නවගමු විහාරෙට
සිල් බිඳිලා ආවයි දෙල් ගහ යටට
අට සිල් සමග රට දෙල් ගැට කිහිල්ලට
දෙයියනේ හෙනම ගහපන් දෙල් හෙරට[27]

24. රත්නපුරේ ජනකවි - 69 පි.
25. මාගම්පත්තුවේ ජනකවි - 23 පි.
26. රත්නපුරේ ජනකවි - 01 පි.
27. රත්නපුරේ ජනකවි 41 පි.

කුසගින්න නිවාගැනීම පිණිස දෙල් ගෙඩියක් හොරෙන් ගෙන ගිය තැනැත්තිය, හෙන ගස්වා මරාදැමීමට දෙවියන්ට කීමට තරම් ගැමියා කුරිරු වීද? පහත දැක්වෙන්නේ කතරගම දෙවියන්ට කී එවැනි වස් කවි කිහිපයකි.

77. පවරා කදිරපුර පුද ලබනා සත්ත
අසුරා දෙපලු කරමින් ජයගත් ඇත්ත
මෙවරා මගෙ වත්තෙ තල්ගොබ කැපූ කැත්ත
ඉවරා කර දමන් උං සහ උගෙ හැත්ත[28]

මෙවැනි බිහිසුණු අපරාධවලට කතරගම දෙවිඳු හවුල්වේද? තල ගොබයක් කපා ගැනීමෙන් සිදුවූ පාඩුව මකා ගැනීමට හොරාගේ කැත්ත සහ මුළු හැත්ත ම විනාශකර දැමීමට තරම් ජනවියාට වෛරයක් ඇතිවූයේ ඇයි? මේ පොල්පැල සොරෙකුට කී වස් කවියකි.

78. රුහුණු රට කදිරාපුරේ පුද
ලබන තෙදබල බරණෙතා ණෙන
වානුබැරිමට ඉදිරිමානගෙ වත්තෙ
පොල් පැල හොරෙන් අරගෙන
පේනු ලෙස මොහු ගමෙන් එලවන්
නොයෙක් රජ බස දෙවා විගසින
රුණ දෙවොලට එමිය ඔබහට
සැවුල් කොඩියක් සුරුතු අරගෙන[29]

වතුර වැසි නැතිව, නියහය ඇතිවී, ගොවියාට නපුරු කලක් ඇතිවන්නේ කතරගම දෙවියන්ගේ දිවැසට නොපෙනුණු නිසාය'යි ජනකවියාට හැඟේ.

79. වතුර වැසි නැතිව රට ගිණි වැදිච්චී
වපුල ගොඩ බෝග කුරහන් මැරිච්චී
කතරගම දෙවිගෙ දෙනෙතට නොපෙනෙච්චී
නපුරු කලක් අපහට දැන් පැමිණෙච්චී[31]

28-29. රත්නපුරේ ජනකවි - 77 පි.
31 ගොවි ගෙදර ජනකවි - 173 පි.

ටිකිරි ගොයම් කෑ හාවාගේ සන්දි- කුලල් - ඇට - නහර පොඩිපට්ටම් කරවා හාවා මරණයට පත්කිරීම ජනකවියා විසින් භාරකරනු ලැබුවේ **කතරගම** දෙවිඳුන්ටය.

80. ඉන්දුසේම පැලවෙන මගෙ ටිකරි ගොයම් කනවා
පන්දු සේම බෙටි ගසමින් බැද්දට පැන යනවා
සන්දි කුලල් නහර උගේ ඇට පොඩි කරවනවා
**කන්දකුමාර දෙවියනි** හාවා මරවනවා[32]

තමාගේ නිදොස් භාවය අවශ්‍ය තැනදී දිව්රා ඔප්පු කිරීම, දිවයිනේ හැම පළාතක මෙන්ම සබරගමුවට ද උරුම වූවකි. විෂ්ණු හා කතරගම දෙවියන් සිහිකොට, එම දෙවියන් වෙනුවෙන් දිවුරූ අවස්ථා සබරගමුවේ ජනකවියෙන් හෙළිවේ.

81. හොඳයි කියන ඇලපාත වලව්වේ
මන්දැයි අපෙ නඩු නාසන්නේ
ඇතා වගේ මගෙ ගොනා මරාලා
කවුදැයි ඇල්ලට පොරලුයේ
පාරේ යන්නෝ ගොනා මරාලා
කම නැති ලේ ගිනි මට දුන්නේ
**විෂ්ණු - කතරගම** දෙවි ගැන දිවුරන්නා
ගොනා මරුබව නැත දන්නේ[33]

විෂ්ණු හා සමන් දෙවියන් ගේ බලයෙන් මැණිකේ 'හතරට පලා දැමීමට' මේ ජනකවියා අධිෂ්ඨාන කර ගත්තේය. වී කෙටීම සඳහා පණිවුඩ ලැබුණේ 'ගමේ වලව්වෙ' නි. ඊ වන තුරුම වී කෙටීමට සිදු විය. එහෙත් ලැබුණු දෙයක් නැත. වලව්වේ වී කෙටීමට ගියත්, දරුවන් අඬනාවිට උන්ට දීමට ගෙදර මොකුත් නොවීය. දෙවියනි දරුවන් හඬනා විට දෙන්නේ මොනවාදැ'යි ඇය කල්පනා කළාය.

---

32. ගොවි ගෙදර ජනකවි - 186 පි.
33. සපරගමුවේ ජනකවි - 46 පි.

82. ගුතේ පතේ ඇති ගමේ වලව්වේ
වී කෙටුමට පඟුවුඩ ආවේ
වී කෙටුවා මිස දුන්න දෙයක් නැත
හදපාතේ ගෙදරට ආවේ
අතේ මගේ දරුවන් හඩනා විට
මොනවද දෙවියනි මම දෙන්නේ
විජ්ණු - සමන් දෙවි ඇතිකාලේ නම්
මැඟිකේ හතරට පලවන්නේ[34]

මේ ජනකවි වලින් ධ්වනිතවන්නේ තමාට වරදක් කළ අයට දෙවියන් ලවා පීඩාවක් සිදුකිරිටම වඩා තමා තුළ ඇතිවූ දැඩි සිත් වේදනාව දෙවියන්ට පැවැසිම විය හැකිය.

වතුර - වැසි නැතිව, බෝග විනාශවනු දකිනවිටත්, බුළත් වැලේ දළුව සමගම කොළ කඩාකන විටත්, සිල්ගත් තැනැත්තිය දෙල්ගෙඩියක් කඩාගෙන කිහිල්ලේ ගසාගෙන යන විටත්, තල්ගොබ හොරා කපාගන්නා විටත්, පැලවෙන ගොයම කන හාවා දකින විටත්, ගොවියාට සාධාරණ කෝපයක් හා වෛරයක් ඇතිවේ. වෛරය යටපත් කර ගන්නේ දෙවියන්ට පැවැසිමෙනි. ඒ ගැමියන්ගේ ඇදහිම නොහොත් විශ්වාසය විය.

සබරගමුවේ ජන ඇදහිලි අතරට, පත්තිනි ඇදහිමද ඇතුළත්වේ. පත්තිනි ඇදහිම ගජබා රජ කාලයේදි ලක්දිව ඇතිවූ බවට විශ්වාසයක් පවති, අම්මා වරුන්ගේ ලෙඩ හා දරුවන්ගේ ලෙඩ, වසන්ගතයක් සේ පැතිරෙන විට "දෙවියන් ගේ ලෙඩ" යනුවෙන් ගැමියෝ පවසති. මෙම ලෙඩ වලක්වාගනු පිණිස ගම්වල පොල් කෙළිය සහ අංකෙළිය පැවැත්වේ. තිවෙස්වල කිරි අම්මාවරුන්ගේ දානය පැවැත්වේ. ගොයම් කපා අලුත්බත් කන අවස්ථාවල දී ද "පත්තිනි මෑණියන්" සඳහා පුජෝපහාර පැවැත්වේ.

---

34. ගොවි ගෙදර ජනකවි - 255 පි.

පත්තිනි දේවිය. ජල පත්තිනි, තෙද පත්තිනි. ඔරුවාලි පත්තිනි. ගිනි පත්තිනි. අඹ පත්තිනි. සිරි පත්තිනි හා මල් පත්තිනි[35] වශයෙන් වෙස් හතකින් පෙනී සිටින බව ජනතා විශ්වාසයයි. පත්තිනිදේවිය. "පත්ති මැණියෝ". "පත්තිනි අම්මා" වශයෙන් ගැමියෝ හඳුන්වති. පත්තිනි අම්මාගේ දනය, නොහොත් කිරි අම්මලාගේ දනය සඳහා කිරි අම්මාරවරු සත් දෙනෙක් එක් වන්නේ "සත් පත්තිනි"[36] අම්මාවරුන් නිරූපණය කිරීම වෙනුවෙනි. එබැවින් පත්තිනි දේවිය වෙනුවෙන් කෙරෙන බාරයන් කිරි අම්මාවරු හත් දෙනෙකුට පුද දෙති. බාරහාර වෙති.

83. ඉර බාරයි ඉරවට යන ගිරවුන්ට
සඳ බාරයි සඳවට යන සාවුන්ට
මල බාරයි මලවට යන බමරුන්ට
අප බාරයි සත්පත්තිනි දෙවියන්ට[37]

රත්නපුරේ කුරුවිට කෝරලේ සත් පත්තිනි දේවාලයක් වූ බව, සබරගමුවේ තලමල් කවියක දැක්වේ.

84. සත්මුල් දඹදිව ශ්‍රී සිංහලය යන
සබරගමුව මැද පිහිටි නමින්
එක්කොට රටතොට කුරුවිට කෝරලෙ
සත්පත්තිනි දේවාලෙ නමින්
සිත් ලෙස කවිකර කියමි වරද හැර
සිරස නමා වැඳ මගේ දනින්
විස්තර මොකටද පිපුණා තලමල
පුස්සැලිගම මැද උසට උසින්[38]

---

35. නොයවා වැඩියයි මල් ආසනයට
සෙල්ලන් සිරිකත පිහිටයි අපහට
පේකර අං තිබ්බා ඔබේ නාමෙට
මල් පත්තිනි වැඩියයි අං කෙළියට
සිංහල ජන කවිය හා සංස්කෘතික ලක්‍ෂණ - 69 පි.
36. සත්පත්තිනි දෙවියන් වැඳ ගතිමි වරත්
ගොවි ගෙදර ජන කවි - 30 පි.
37. ගොවි ගෙදර ජන කවි - 31 පි.
38. සිංහල ජනකවි සංග්‍රහය ii - 89 පි.

අරුග්ගොඩ පත්තිනි දේවාලය ගැනද ජනකවියෙන් කියැවේ.

85. ආලවී දනෝ සෙත ලබන අටියෙනේ
කෝල නොව ගොසින් පුද පඬුරු අරගෙනේ
කාල දැන කරන උලෙළක් විය එතැනේ
පැළ දිග කන්දෙ පත්තිනි දේවාලෙ පෙනේ[38/1]

අංකෙළිය හා පොල් කෙළිය පත්තිනි ඇදහීම සම්බන්ධ වූ දෙවි කෙළි විශේෂයකි. වසංගත රෝගයක් ඇතිවූ විට, ඒ සඳහා ගම්මඩුවක් පවත්වා පත්තිනි දේවිය ප්‍රමුඛ කොට, තවත් ගම්භාර දෙවි දේවතාවුන්ට පුද පූජා පැවැත්වීම සබරගමුවේ ගැමියන් අතර දක්නට ලැබෙන සිරිතකි. මෙය හැඳින්වෙන්නේ "ගම්මඩුව" යනුවෙනි.

> "පත්තිනි ගම්මඩු උත්සවයට අං කෙළියත්" "පොල් කෙළියත්" අයත් වේ. දැනට වර්ෂ හැට හැත්තෑවකට උඩ දී සබරගමු ප්‍රදේශයේ පවත්වා ඇති ගම්මඩු උත්සවයේ "කොහොඹා කංකාරිය" නමින් වූ කොටසක්ද අයත් වූ බවත් එය ගම්මඩු උත්සවයේ එක් කොටසක් වශයෙන් පමණක් පවත්වා ඇති බවත් කොළඹ කෞතුකාගාර ප්‍රකාශනයක සඳහන්වේ. (Spolia Zaylancaivol - 26 Part -ii) මෙම කොහොඹා කංකාරි කොටසට කොහොඹ කලය නැටවීමද කර තිබේ. පත්තිනි දේවාල විශාල ගණනක් ඉදි කළ සීතාවක රාජසිංහ රජුගේ පාලන තන්ත්‍රයට මුල් වූ ප්‍රදේශයද සබරගමුවයි. අද සබරගමුවට අයත් නැටුම් පරපුරවල් බොහොමයක් ම පත්තිනි දේවාලයට සම්බන්ධවී සිටි බව පෙනේ"[39]

වැදි ජනතාව අතර තවමත් පවතින "කිරි කොරහේ නැටුම" ට සම්බන්ධවූ සමහර කවි සබරගමු පළාතේ පුද ලබන මංගර දෙවියන් සම්බන්ධ කවි ද, සබරගමුවේ ඇති "රටයකුම" හෙවත් "රිද්දි යාගයේ" දී කියැවෙන රිද්දිබිසොවුන්ගේ කවි සමග සම්බන්ධයක් පවතින

---

38/1 කුකුළු කෝරළේ ජනකවි - 22 පි

39 සංස්කෘති - 16 කලාපය - 1 සඟරාව (1969) 80 පි

බවත් එහි උනාපාන කිරිඅම්මා යනුවෙන් කිරි අම්මා කෙනෙක් ගැනද සඳහන් වන බවත් දක්වේ.

වැදි ජනතාව අතර ව්‍යවහාරයේ පවත්නා කිරිකොරහේ පූජවේදී පුද ලබන උනාපාන කිරි අම්මා ඇතුළු කිරි අම්මාවරු හත් කට්ටුවක් ඌව සබරගමුව හා උතුරුමැද ළාත්වල කිරිපට්ටි සම්බන්ධව පුදලබන මංගර කුමාරයාත් දරුවන් ලබා දෙන හා දරුවන් රැකගන්නා උසත්ගොඩ බිසව් යන සියලුදෙනාම සත්පත්තිනි දේවතාවියගේ ශාන්තිකර්ම මුල් කරගෙන පහළ වුණු බව මහාචාර්ය තිස්ස කිරියවසම් පෙන්වා දෙයි.[40]

86. වලාව මතුකරන එවැසි කන්ද
බලන් මෙකී අම්මාගේ ගුණ කන්ද
ගලා කඳුළු සළුවෙන් පිස දම්මා
උනාපාන කිරි අම්මට වැන්ද[41]

87. උනා උනා වරලස බඳිමින් ද
සලාපාතුවේ තෙද රැස් බින්ද
ගලා කඳුළු දෙනුවන වාසින්ද
උනාපාන කිරි අම්මට වැන්ද[42]

88. වලාව වට කරන එවැසි කන්ද
නලා පිඹින ලෙස යට සත බින්ද
බලා මෙතන අම්මාගේ ගුණ කන්ද
උනාපාන කිරි අම්මට වැන්ද[43]

කිරි මඩු නැටීමටද පත්තිනි දේවිය මුල් කරගෙන සිදුවේ. කිරිමඩුව පිළිබඳ සමහර ප්‍රදේශවල අංග ලක්ෂණ සබරගමුවේ දී ද එළෙසම දැකිය හැකිවේ.

පත්තිනි දේවිය මුල් කරගෙන කිරි මඩු ශාන්තිකර්මය සිදු කෙරෙන්නේ ගවයන්ට වැළඳෙන විවිධ වසංගතවලින් මුදවාගෙන කිරි වැඩිකර ගැනීම පිණිසය. මෙහිදී මංගර දෙවියෝ ද පුද ලබති.

40 සං.බ - ජුලි - සැප් - (1998) - 56 පි
41 - 42 සං.බ - ජුලි - සැප් - (1998) 55 - 56 පි
43 සං.බ - ජුලි - සැප් (1998) - 61 පි

89. කිරි අම්මාවරු වඩිනා වේලේ
මල් වරුසාවක් වැස්සයි දෑලේ
ඒ මල් අවුලා අමුණන මාලේ
කිරි අම්මා කළ ලෙඩ නැත ආලේ[44]

සබරගමුවේ ඇති ප්‍රබලතම ජනසම්මත ඇදහිල්ල වන්නේ පත්තිනි ඇදහීමයි.

සබරගමුව පුරා පවතින සබරගමු නැටුම් සාම්ප්‍රදායට මූලික ජීවය ලබා දෙන ප්‍රබලම ශාන්තිකර්මය වන්නේ "**දේව තොවිල්**" යනුවෙන් හැඳින්වෙන "**මඩු ශාන්තිකර්මය**" යි.

සබරගමුවේ පැවත්වෙන මඩු ශාන්තිකර්මය අතර **ගම්මඩු - දොවොල් මඩු - පහන් මඩු - දනෙ මඩු - කිරි මඩු - හැල්ලුම් මඩු - පූනාමඩු - ගී මඩු සහ මංගර මඩු** ද වේ. දේව තොවිල් වැඩි වශයෙන් පැවත්වෙන්නේ පත්තිනි දේවිය මුල්කරගෙන වුවද **කිරි මඩු** පැවත්වෙන්නේ **මංගරදෙවියන්** මුල්කරගෙනය. එහෙත් පත්තිනි දේවියට ද එහි දී යාතිකා කෙරේ. සබරගමුව පළාතේ කඩවත මැද කෝර්ලයේ පැවැත්වෙන දේව තොවිලය "**කිරි මඩුව**"යි.[45]

දේව තොවිලයට අමතරව හැම සුභ කටයුත්තකදීම පත්තිනි දේවිය වෙනුවෙන් කෙරන ජනසම්මත ඇදහිල්ලක් වනුයේ **කිරි ඉතිරවීමයි**. අලුත් නිවසක පදිංචි වීම, **කමතේ**කොළපාගා අවසන්වීම.[46] වැනි විශේෂ අවස්ථාවලදී "**කිරි ඉතිරවීමේ මංගල්‍යය**" සිදු කෙරේ. දැඩිමුණ්ඩ දෙවියන් සිහිකොට කිරි ඉතිරවීම සිදුකළ බවද ජනකවියෙන් හෙළිවේ.

---

44 සං.බ - ජුලි - සැප්- (1998) - 61 පි
45 විස්තර සඳහා බලන්න "කිරි මඩුව"
රසවාහිණී සඟරාව 21 කාණ්ඩය 2 කලාපය
1981 - පෙබරවාරි 71 - 72 පි
46 බුදුන් වඩින වේලාවයි
කිරි උතුරන වේලාවයි
කොළ මඩවන වේලාවයි
කමත පිරෙන වේලාවයි
කමත් හැල්ල - 17 පි

90. පැවැත උතුම් දැඩිමුඩලත් තෙද ඇති අපෙදෙවි තුමන්ඩ
නැවත යකුන් ගලකප්පා ඊ පිට මාළිග කරන්ඩ
දිමුතා ලොව බලපාමින් එන උවදුරු දුරු කරන්ඩ
දෙවතා දෙවිගෙන් අවසර මෙකිරි හැලිය උතුරවන්ඩ [46/1]

මෙසේ සෙත් පැතීමට අමතර, වස් වැද්දවීමට ද පත්තිනි දේවිය ගෙන් කෙරෙන ආයාචනා සබරගමු ජනකවියට ඇතුළත්වේ.

91. වනේ වන පැල සොයා කාලයි
පෙරත් ඉත්තෑවුන් රැකෙන්නේ
වලේ පැලපොල් තබාලොකුකර
කවුද ඉත්තෑවන්ට දෙන්නේ
කලේ අනඩුව රෑ ජාමෙ චිත්
මයේ පොල් පැල කා දමන්නේ
බලේ තෙද ඇති සිද්ද පත්තිනි
මන්ද මේකා නොමරවන්නේ [47]

පත්තිනි මෑණියන් විසින් සෙත් ශාන්තිය සලසනු විනා වස් දෙස් නොපමුණුවන බව, ජන කවියාට සිහි නොවේ.

පත්තිනි දේවිය සමග එකම මඩුවේ කෙම් පිදේනි ගන්නට වරම් ලැබූ දෙවොලේ සත් කවටුවක් ද සබරගමු ශාන්තිකර්ම අතර පුද ලබති.

සබරගමු පළාතේ ඇති මංගර මඩුවල දී මෙන්ම කිරිමඩු වලදී ද මංගර දෙවි පුද ලබති. මංගර, කිරි පට්ටි සම්බන්ධව පුද ලබන දෙවියෙකි. එසේම වීරත්වයට අධිපති දෙවියෙකි. අලි ඇතුන් නිසා ඇතිවන බිය දුරුකරනු පිණිස ද ගැමියන් මංගර දෙවියන්ගේ සරණ පැතූ ආකාරය ජන කවියෙන් හෙළිවේ.

---

46/1 සරගමුවේ ජනකවි - 61 පි
47 කුකුළු කෝරළේ ජනකවි - 08 පි

92. එගොඩ ගොඩේ ඇතු සිටිනා නිවානේ
මෙගොඩ ගොඩේ දළ පෙනෙයි නිවානේ
ඇතුන් බදින්නට ඇඹරෙව් බානේ
මංගර දෙවිට බාරයි පරානේ[48]

බඹර කපන්නෝද මංගර දෙවිඳුගේ පිහිට පැතූහ.

93. අයිනෙයි සඳ ගිරියේ ගල මුදුනේ
බඹරය බැන්ද එකලු ගලේ
බඹර සැමම මට පෙන්වා දුන්නොත්
මංගර දෙවිඳුගෙ පිහිට බලේ
බඹර සැමම මට කපන්ට යෑමට
දිවියොත් වලසුත් බෝය කැලේ
රටින් රටට පාරට්ටු කියන්නට
බැන්ද බඹර නවරත්න ගලේ[48/1]

සබරගමුවේදී පුද ලබන තවත් දෙවියෙක් ලෙස සැළකෙන්නේ දැඩිමුන්ඩ දෙවියන්ය. සතර කෝරලේ අළුත්නුවර දේවාලය දැඩිමුණ්ඩ දෙවියන් වෙනුවෙන් වෙන්වී ඇත. අප බෝසතුන් බුදුවන ද මාරසේනා පැමිණෙන විට, අන් හැම දෙවියන් පළායද්දී මෝහු පමණක් රැඳී සිටි බැවින් හේ දැඩිමුණ්ඩ වූ බව ජනශ්‍රැතියේ එයි. "ගල කැප්පු සැහැල්ල" සහ "දැඩිමුණ්ඩ අවතාරය" යන කෝල්මුර කවි වලට අනුව ඒ බව දැක්වෙන්නේ මේ අයුරිනි.

94. දස බිම්බර යුදට
මර සෙනඟ රැස්වූ විට
දෙවියෝ දැක නොසිට
දුවපි සක්වල ගලෙන් පිටතට[49]

48 ගොවි ගෙදර ජන කවි - 179 පි
48/1 රත්පුරේ ජනකවි - 32 පි
49 ගල කැප්පු සැහැල්ල - 02 කවිය

95. බුදුන් තනි කරලා
දෙවියෝ ගියයි ඇරලා
දැඩි දෙවියෙක් සිටලා
යුද කරමි සැළ කෙලේ වැදලා[50]

96. සදෙව් ලොව බලමින
නාලොව තිලොව බලමින
කෙනෙක් නැත සරිලන
මුණ්ඩ දැඩි යයි නමක් පවසන[51]

97. වට පිට සිටි සුරසෙන් ජය ගත්තේ
සිට බඩ මීස තිලොවට වෙන නැත්තේ
අට විසි යක් සෙන් ලැබු කැමැත්තේ
පට බැඳි දැඩි මුඩ නමක් පැවැත්තේ[52]

දැඩිමුණ්ඩ දිවයිනට පැමිණ සතර කෝරළයේ අලුත් නුවර දේවාලයක් කරගත් බවද එහි දැක්වේ.

98. සළුත් බරණ මිනි ඔටුණු දරන්නේ
ගලුත් බැඳපු අවි සෝලි දරන්නේ
මලුත් සුවඳ දස අත විහිදෙන්නේ
අලුත් නුවර දැඩිමුඩ දෙවියන්නේ[53]

99. එ රජතුම ඉක්බිති
උඩ රටට කරුණා ඇති
විමසා පෙර සිරිති
බලා කෝරල සතර මැද රුති[54]

---

50 ගල කැප්පු සැහැල්ල - 05 කවිය
51 ගල කැප්පු සැහැල්ල - 08 කවිය
52 දැඩි මුණ්ඩ අවතාරය - 35 කවිය
53 දැඩිමුණ්ඩ අවතාරය - 36 කවිය
54 ගල කැප්පු සැහැල්ල - 16 කවිය

100. සඳුන් කුඩමකුත්
තනා මැද දිග් ගේකුත්
සතිස් සාලාවත්
කෙළේ විසිතුරු අලුත් නුවරක්[55]

දැඩිමුණ්ඩ දෙවියන් යකුන්ට නායක දෙවියන් ලෙස සැළකේ. "අළුත්නුවර දෙවතා බත්ඩාර" නමින් ද හඳුන්වන්නේ දැඩිමුණ්ඩ දෙවියන් වේ.

101. ගෝසාවක් නැතුව සෙනඟ
දැලේ සිට සැළ කරණ්ඩ
බෝසේ ඇති තෙද අනුසස්
දේවතා සුරිඳුගෙ බලණ්ඩ
මේ සක්වල සියළු සතුන්
හට අනුසස් බලපාණ්ඩ
දැඩිමුඩ දෙවියෝ ඔබය
යකුන්ඩ රජකම් කරණ්ඩ[56]

102. බණ දන්නේ නැද්ද යකුනි
ගෞතම මුනිඳුන්නේ
අණ දන්නේ නැද්ද යකුනි
වෙසමුනි සුරිඳුන්නේ
වෙන දෙවියන්: හැමට යකුන්
බය උනුබව දන්නේ
අණ දැනගෙන යන්ඩ යකුනි
දැඩිමුඩ සුරිඳුන්නේ[57]

103. යකුන්ඩ නායක දේවතාබණ්ඩාර සුරිඳුට
අසන්ඩ හොඳ කවි පවසම් වැදලා ඡ්නිකට,
කියන්ඩ දෙවිඳුගෙ ගුණ කඳ මේ තුන් ලෝකෙට
දකින්ඩ හැම ලෙඩ ගුණවෙයි තිරකර අත්පිට[58]

---

55 ගල කැප්පු සැහැල්ල 20 කවිය
55 ගල කැකප්පු සැහැල්ල 20 කවිය
56 දැඩිමුණ්ඩ අවතාරය 43 කවිය
57 ගල කැප්පු සැහැල්ල 41 කවිය
58 ගල කැප්පු සැහැල්ල 44 කවිය

යක් උවදුරු - පිස්සු - බූත - මායන් වැනි උවදුරු හා දෝෂ මුදා හැරීම පිණිස සතර කෝරළේ ජනතාව දැඩිමුණ්ඩ දෙවියන් නොහොත් අලුත්නුවර දේවතා බණ්ඩාර දෙවියන් අදහනු ලැබේ.

104. උතුන් තිලෝගුරු මුනිඳුගෙ විවරණ රගෙන
උතුන් කීර්ති නිල් මේවර වේවැල අරගෙන
යකුන් විසින් පිස්සු බූත මායන් කරවන
මෙතුන් ලොවට එන උවදුරු දෝස මුදලන[69]

උවදුරු දෝෂ පමණක් නොව, තම ආරක්ෂාව සම්බන්ධයෙන් ද අලුත්නුවර දැඩිමුණ්ඩ දෙවියන් ඇදහූ ආකාරය සබරගමුවේ පතල් කවියෙන් ද හෙළිවේ.

105. රස්සාවක් සොයා ආවෙමි බෝගලට
බැස්සා වලේ බඹ හැත්තෑ දෙකක් යට
මැස්සෙක් විතරවත් නෙපෙනෙයි ගොඩ අයට
විස්වාසයක් නැත අප එන තුරු ගොඩට[60]

106. නොම්බර දෙකේ අඩියේ වෙඩි පත්තු උනා
ලෝඩර ඇවිත් වලකට උඩ වා වාඩි උනා
ගමේ රටේ නෑදෑයොත් මතක් උනා
අලුත් නුවර රකින දෙවියෝ මතක් උනා[61]

බඹ හැත්තෑ දෙකක් යට, අඩියේ වෙඩි පත්තුකොට ගල පුපුරා යාමට කලින්, ගොඩට ඒමේ විශ්වාසයක් නැති සතර කෝරළයෙන් පැමිණි පතල් කරුවාට සිහිවූයේ අලුත් නුවර දැඩිමුණ්ඩ දෙවියන්ය.

ජන සම්මත ඇදහිලි අතරට "අණ විණ" නමින් හැඳින්වෙන යක් තොවිල්ද ඇතුළත් වේ. සබරගමුවේ යක් තොවිල් අතර, කුමාර සමයම, සත්තියකුම - සූනියම - තුන් සමයම හා දැරූහැව යන අංග දැකගත

59 දැඩිමුණ්ඩ අවතාරය - 31 කවිය
60 පතල් සිව්පද - 12 පි
61 පතල් සිව්පද - 12 පි

හැකිය. ජනකවි ගණයට ගැනෙන මේවාට අතුළත් "මල්යහන් කවි" සහ "පමයං කවි" රාශියකි. නවග්‍රහයින් සඳහා කෙරෙන ශාන්තිකර්මයක් ද සබරගමුවේ ජන සම්මත ඇදහිලි වලට ඇතුළත්වේ. මේ සියල්ලටම බුදු ගුණ සහ බුදු අණ ඇතුළත්ය. බුදු ගුණම මෙනෙහි කොට කෙරෙන විශේෂ ශාන්තිකර්මයක් කෑගල්ල දිසාවේ දි දක්නට ලැබේ. එය හඳුන්වන්නේ "සුවිසි විවරණය"[62] යනුවෙනි. මෙය නෘත්‍යමය පූජාවකි.

සබරගමු ප්‍රදේශයේ වස්කවි - සෙත්කවි කෙම් පනත්[63] සහ තිම්ති[64] රාශිය ඇතුළත් වන්නේ ද ජනසම්මත ඇදහිලි ගණයටයි.

---

62 "සතරකෝරළයේ සුවිසි විවරණය හා එහි බෞද්ධාගමික මුහුණුවර"
ඒ. ජී. එස්. පී. කේ. ජයතිලක මෙනෙවිය
උපාධි නිබන්ධන
කැලණිය විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යාපන පීඨය
කොළඹ 7.

63 සබරගමුවේ කෙම් ක්‍රම - බන්දුල ලියනගේ
1995 - ඉසුරු මුද්‍රණ - කුරුවිට

64 තිම්ති සහ සබරගමුවේ තිම්ති බන්දුල ලියනගේ
1998 - පාලිත මුද්‍රණාලය - පැල්මඩුල්ල

# 4 සංස්කෘතික පෙරළිය හෙළි කෙරෙන සබරගමුවේ ජනකවි

අවුරුදු හාරසිය පනහක් තරම් වූ බටහිර ජාතීන් ගේ පාළන සමය තුළ ඇති වූ සංස්කෘතික පෙරලිය සබරගමු ජනකවියෙන් ද විවරණය වේ. 1815 දී මුළු දිවයින බ්‍රිතානය අධිරාජයට යටත් වීමෙන් පසු කවර කලෙකවත් නොවූ විරූ ලෙස සිංහල ගැමියන් කෙරෙහිද මේ ආගන්තුක සංස්කෘතිකාංගය බලපවත්වන්නට විය. විශේෂයෙන් දහනම වැනි සියවසේ මධ්‍යම භාගය වන විට මං මාවත් තනීම හා තේ කෝපි රබර් කොකෝවා වැනි විදේශික ආර්ථික වැවිලි ඇතිවිය. මං මාවත් හා දුම්රිය වැනි ප්‍රවාහන පහසුකම් දියුණු විය. මිනිරන් පතල් වැනි මහා පරිමාණ කර්මාන්ත බිහිවීම, කර්මන්ත යාන්ත්‍රීකරණය වීම හා ඒ ආශ්‍රිතව ඉඩම් හිමි සහ කර්මාන්ත හිමි මධ්‍යම පන්තියක් බිහිවිය. මෙම කර්මන්ත වල සහ වතුවල කුලියට වඩකරන, වටුප් ලබන කම්කරු දෙමළ ජනතාවගේ සහභාගීත්වය ලබා ගනීම වැනි කරණු මෙම සංස්කෘතික පෙරළියට පසුබිම් විය.

මීට වසර හැත්තෑ අටකට තරම් මැත ඉතිහාසයේ (1921) කලවානේ පාර කැපීමේ සිද්ධිය පවා ගැමියන්ට මහත් පුදුමයක් වූ සැටි ජනකවියෙන් අනාවරණය වේ.

107. එක දහස් නවසිය විසි එක් වැනි වසරේ
ඇතුළත සිදුවුණු කරුණා
කුකුළු කෝරළේ කඩඉම ළඟ සිට
රවුම්පාර කැපුවයි සොදිනා
තවත් පුදුම වැඩ බලන්න පුදුමයි
බෝඩ්ලැලි ගසමින් ඉතිනා
මෙහෙම පුදුම වැඩ සැදුනේ කවදද
කලවානේ යන ගමෙහි මනා [1]

1. කුකුළු කෝරළේ ජනකවි - 16 පි.

බොහෝ පැරැණි ජනකවි වලින් සමාජ සහ සංස්කෘතික තොරතුරු හෙළිවෙතත්, ඒවයේ කාල නිර්ණය කිරීම ඉතාම අපහසු කාරියකි. මෙසේ සංස්කෘතික පෙරළියට ලක්වූ නූතන සමාජ තොරතුරු දැන්වීමේදී ජන කවියා එය සිදුවූ වකවානුව වර්ෂය හා දිනය සමගම සඳහන් කිරීමට මෙහෙයවී ඇත.

ආදිකාලයේ සිට ගංගාවලින් එතර වීමට සිදුවූයේ ඔරුවෙන් හෝ අගුලෙනි. නැතහොත් ඒදණ්ඩෙනි. වැල් පාලම් වලිනි. බඹ හැට පහක් දිගැති වැල් පාලමක් ගැන තොරතුරු කුකුළු කෝරළේ ජනකවියෙන් හෙළිවේ. කුකුළෙ ගම හා උඩුගල පස්දුන් කෝරළය දක්වා යන දුර්ග මාර්ගයේ ගෙඳගලා තොටුපොලින් එගොඩවීම පිණිස හැටපස් බඹයක් දිගැති තනි වේවැල් පාලමක් තිබුණු බව සඳහන්වේ.

108. කුකුළු ගඟේ වස කමේ හැටිය මට
කියන්ඩ යන්තම් සිහිවෙනවා
ගඟේ පළල මේ වැලේ දිගටමය
හැටපස් බඹයකි මැන බැලුවා
සලා දිදී ගෝෂාවකි ජලකඳ
ගල් අස්සෙන් පැන මතුවෙනවා
අවුරුද්දට තුන්දෙනා කනක්කුවෙ
කුකුළු ගුහට බිලි කැප වෙනවා

මෙවැනි භයානක වේවැල් පාලම් දැක පුරුදු හා ඉන් එගොඩ මෙගොඩ ගමන්ගත් ගැමියන්ට නව තාක්ෂණය යටතේ ඉදිවන පාලම් දැකීමෙන් ඇතිවන්නේ විශ්මයකි. එම සංස්කෘතික පෙරළිය ජනකවියා දුටුවේ මෙලෙසිනි.

වරකාතොටේ පාලමේ යකඩෙන් තැනූ කොඑස දූනු සූත්තරය ලෙසත් ගල් බැම්ම කලගෙඩි බැම්ම ලේසත් ජන කවියා දුටුවේ ඉතාම පුදුම දෙයක් මෙනි.

---

2. කුකුළු කෝරලේ ජනකවි 7 පි.

109. එගොඩත් බැලිම් එගොඩත් දුනු සූත්තරේ
මෙගොඩත් බැලිම් මෙගොඩත් දුනු සූත්තරේ
දෙගොඩම බැලිම් දෙගොඩම දුනු සූත්තරේ
වරකාතොටේ පාලම දුනු සූත්තරේ [3]

110. එගොඩත් බැලිම් එගොඩත් කලගෙඩි බැම්ම
මෙගොඩත් බැලිම් මෙගොඩත් කලගෙඩි බැම්ම
දෙගොඩම බැලිම් දෙගොඩම කලගෙඩි බැම්ම
වරකාතොටේ පාලම කලගෙඩි බැම්ම [4]

ඒදණ්ඩ සහ වැල්පාලම වෙනුවට ඇතුන් බානක් එකවර ගෙනයාමට හැකි ශක්තිමත් පාලමක් නිමවෙනු දැකීම ගැමියන්ට ඉමහත් පුදුමයකි. සංස්කෘතික පෙරළියකි. මේ ඇතුන් බානක් එකවර ගෙනයාමට තරම් ශක්තිමත්ව තැනූ කහවත්තේ පාලම ජනකවියාට පෙණුනු ආකාරයයි.

111. මෙතැන් පටන් අප ඇසුවේ වත් නැත
ගංගාවක වැඩ තියම උනේ
උතුම් දෙයකි පාලම පිට ඇතුලේ
සිටලා යන්නට නවාතැනේ
පැතුම් පතම් නුවරක උපදින්නට
තිලමේ ගියරට මතුත් අනේ
ඇතුන් බාන ගෙනියන්ට පුළුවනි
කහවත්තේ පාලමේ අනේ [5]

බටුගෙදර හා ගොඩිගමුව යාකෙරෙන හැට රියනක් තරම් දික් වූ ඉංග්‍රීසීන් විසින් සාදන ලද පාලම නව සංස්කෘතියට එක්වූ විසිතුරු වැඩකි.

---

3-4. කුකුළු කෝරළේ ජනකවි හා ගැමි සංස්කෘතික ලක්ෂණ - 130 පි.

4. සසඳන්න.
- එගොඩත් බැලිම් එගොඩත් කලගෙඩි මාලේ
  මෙගඟඩ බැලිම් මෙගොඩත් කලගෙඩි මාලේ
  දෙගොඩම බැලිම් දෙගොඩම කලගෙඩි මාලේ
  වරකාතොටේ පාලම කලගෙඩි මාලේ

  රත්නපුර ජනකවි - 20 පි.

5. රත්නපුර ජනකවි - 30 පි.

112. ගොඩිගමුවද බටුගෙදර ද දෙගොඩම
ගඟ මැද විසිතුරු වැඩක් කළේ
හැටි ඔහොමයි ජල මතුපිටමයි
යකඩෙන් තොරණයි කලගෙඩි දැලේ
වැඩ කදිමයි හැමදම තිබෙයි
ඉංග්‍රීසි තමයි වැඩ නියම කලේ
හැට රියනයි අනුමාන තමයි
උස් ගඟ මැද පාලම තුන්මාලේ[6]

තේ වගාව සමගම ගමේ වැවිලි ආර්ථිකයේ සහ ශ්‍රම භාවිතයේ පුදුම වෙනසක් ඇතිවිය. ඈත අතීතයේ සිට ජාතියට උරුම වූ ගොවිතැන හා බැඳුණු "අත්තම" - "කයිය" වැනි සාමූහික අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම් ආශ්‍රිත සාරධර්ම සමාජයෙන් තුරන් වන්නට විය. දින වැටුපට හා මාසික වැටුපට ශ්‍රමය විකුණා වැඩ කරන කුලී කම්කරු පන්තියක් බිහි විය. කාන්තාවන් පවා තේවතුවල කුලී වැඩ සඳහා බැඳුණු ආකාරය ජන කවි වලින් හෙළිවේ. ඔවුන්ගේ දින චරියාව මෙසේ වෙනස්විය.

113. උදේ හයට නැගිටල තේවතු යනවා
සවස හයට නාගෙන ගෙදරට එනවා
බදේ තිබුණ ගෝමර අච්චට දනවා
තේවතු නොයන් ඒ දෙන පඩි මම දෙනවා[7]

114. උදේ රැයින් නැගටල තේවතු යනවා
සවස හයට නාගෙන ගෙදරට එනවා
ඔහොම ගියොත් නංගියෙ නුඹ කළු වෙනවා
තේවතු නොයන් ඒ දෙන පඩි මම දෙනවා[8]

මෙම සමාජ පරිවර්තනය නොහොත් සංස්කෘතික පෙරළියට පෙර කාන්තාවන් කුලියට වැඩ කොට නැත. ඔවුන් සාමූහිකව එක්වී පෙළගැසී විනෝදයෙන් වැඩ කෙළේ නෙළුම් කයිය - කුරහන්

---

6. රත්නපුරේ ජනකවි - 20 පි.
7. සිව්පද හා සමාජය - 46 පි.
8. රත්නපුරේ ජනකවි - 1 පි.

ක්ෂියයට හෝ ගොයම් ක්ෂියයටය--කයියට වැඩ කරන විට අහල-පහළ ගෙවල්වල තරුණියෝ එකට එක්වී එකිනෙකාගේ වැඩපොලට සහාය වූහ. ඒ වෙනුවට කයිය හිමි වූ නිවසේ අය විසින් කයියට ආ පිරිසට බත බුලතින් කිරි පැණියෙන් සලකනු ලැබූහ. මුදල් හෝ කුලී ගෙවීමක් නොවීය. ගම්වල පැවැති මෙම සමාජ සාරධර්ම වතු වගාවත් කාර්මීකරණයත් මත අහෝසිවී අභාවයට ගියේය. ඉන්පසු පඩියට වැඩ කරන කම්කරු පිරිසක් බිහි වූහ.

ස්වාමියකු යටතේ කුලියට වැඩ කළයුතු වූයෙන් ඒ සඳහා දැඩි වෙහෙසක් දැරීමට සිදු විය. උදේ හයේ සිට සවස හය දක්වා වැඩ මුරයක යෙදී එක දිගටම වැඩකිරීමට සිදුවීම දැඩි වෙහෙසක් ගෙන දෙන්නක් විය.

තේ වගාව දියුණුවී පැතිරීමත් සමගම රඹුක රජවත්තේ තේ කම්හල ඇරැඹිණ. එහි තේ දළු ඇඹරීම යාන්ත්‍රීකරණය වූ ආකාරය මෙන්ම ඉබේට තේ දළු ඇඹරෙන ආකාරය ජනකවියා දුටුවේ පුදුම වැඩක් ලෙසිනි.

115. කොළඹ සිටන් ආ යකඩ කඳන් තුන
ඉස්ටෝරුව ළඟ නවතින්නේ
රක්වානේ සිට රවුම කපාලයි
මෝලට දියවර ගෙන එන්නේ
උඩ බලනාකොට - බිම බලනාකොට
ජලේ උඩින් දුම මතුවන්නේ
සින්දුව කීවට වස්නැත දෙවියනි
ඉබේම තේ දළු ඇඹරෙන්නේ [9]

එම ජනකවිය මෙම ආකාරයෙන් රත්නපුරය ප්‍රදේශයේ භාවිතාවේ.

9. කුකුළු කෝරළේ ජනකවි - 17 පි.

116. කොළඹ සිටන් එන යකඩ කඳන් දෙක
ඉස්ටෝරුව ළඟ නවතින්නේ
උඩ කන්දේ සිට කානු කපාලා
මෝලට දියවරගෙන එන්නේ
උඩ ලැයිමේ සිට බලාපු බැල්මට
ජලේ උඩින් දුම මතු වන්නේ
සැක්කර දෙවියනි මේ බස බොරුනැත
ඉබේම තේ දළු ඇඹරෙන්නේ[10]

මේ ජනකවියන්ට දෙවියන් සිහිවූයේ තේ දළු අඹරන යන්ත්‍රය පෙර නොදුටු විරූ පුදුම අද්දැකීමක් වූ බැවිනි.

රත්නපුර දිස්ත්‍රික්කයේ බෝගල සහ දුම්බර පතල් කර්මාන්තය දියුණු වීමත් සමග එම කර්මාන්තය ආශ්‍රිතව ද කාන්තාවන්ගේ ශ්‍රමය විකිණීම ඇරඹුනේය.

117. උදේ හයට නැගිටල බෝගල යනවා
සවස හයට නාගෙන ගෙදරට එනවා
ඇගේ තිබෙන ගෝමර අව්වට දනවා
බෝගල නොයන් ඒ දෙන පඩි මම දෙනවා[1]

පතල් වැඩට ගිය කාන්තාවකට දිනකට ලැබුණේ පනත් තුනකි. (ශත දහ අටකි) පනමට ශත හයකි. සිලිං තුන යනුවෙන්ද දැක්වේ. එනම් රු: 1.50 කි. සිලිම ශත පනහකි.

118. එළිය වැටේකොට සියබල ගොඩින් එන
නෙරිය තබා පට කම්බා ඇඳ හොඳින
බැරිය කිය කියා මිතිරන් වැඩට යන
ඩොලියෝ උබට මොකටද ඔය පනත් තුන[1]

---

10. රත්නපුරේ ජනකවි - 22 පි.
11. පතල් සිව්පද - 46 පි.
12. සිව්පද හා සමාජය - 46 පි.
සසඳන්න - එළිය වැටෙන කොට සියඹල ගොඩින් එන
නෙරිය තබා රතු කම්බායක් අඳින
බැරිය කිය කියා විතිරත් කැටි කපන
ලිලියෝ උඹට මොකටද ඔය සිළිං තුන
- එළියවැටෙනකොට මදුරාගොඩින් එන
නෙරිය තබා පට කම්බායක් අඳින
බැරිය කිය කියා මිතිරත් කැටි කපන
ජුලියෝ උඹට මොකටද ඔය සිළිං තුන
- පතල් සිව්පද 48 පි.

කාන්තාවන්ට පිට් පළාත්වලින් පැමිණි ආදරවන්තයෝ ද හමුවූහ. කාන්තාවෝ ඔවුන් හා ආදරයෙන් බැඳුනහ.

119. කළුවන් කළු රුවයි මංගෝ දිළිසෙනවා
මිනිරන් තෝරන්න දින ගණනින් එනවා
මිනිරන් තේරුවොත් ළඳ නුඹ කළු වෙනවා
ළඟනන් ගෙදර මුර ඇරුනම මම එනවා[13]

පතල් කර්මාන්තය සහ වැවිලි කර්මාන්තය ආශ්‍රිතව ගම - නගරය බවට පරිවර්තනය වෙමින් පැවැති ආකරය ද පතල් කවියෙන් හෙළිවේ. මාබෝගල පතලට ආසන්නව කරවනැල්ලේ දුම්රිය මාවතක් ද දුම්රිය පොළක් ද විය. රුවන්වැල්ලේ තැපැල් කාර්යාලයක් තිබුණි. කොටියාකුඹුරේ පාරිභෝගික භාන්ඩ ඇතුළත් ගබඩාවක් විය. ගමේ සිදුවූ මෙම සමාජ පරිවර්තනය සමගම ස්ටේෂම - කන්තෝරුව - ඉස්ටෝරුව - ටිකැට් - ලියුම් - පඩි වැනි ඉංග්‍රීසි හා පෘතුගීසි වචන කිහිපයක් සිංහල බසට එක්විය.

120. කරවනැල්ල ඉස්ටේසම ටිකැට් දෙන
රුන්වැල්ල කන්තෝරුව ලියුම් දෙන
කොටියාකුඹුර ඉස්ටෝරුව බඩු කිරන
මාබෝගලේ පතලෙයි අපි වැඩ කරන[12]

දුම්බර පතල් සමූහයට ආසන්නව ඉංගිරියේ තැපැල් පලක් හා කැටේපොල ඉස්ටෝරුවක් තිබුණි.

121. තුට වඩවන ඉංගිරියේ තැපැල් හල
බඩු පටවන ඉස්ටෝරුව කැටේ පොල
වැඩ කරනා දුම්බර මැද ඉහළ පොළ
පඩි ගැනුමට හොඳයි මිතුරේ පහළ පොළ[15]

ආරම්භයේදී පතල් කර්මාන්තයේ බොහෝ කටයුතු කෙරුණේ සාම්ප්‍රදායික ක්‍රම අනුවය. පසුව එය යාන්ත්‍රීකරණය විය. මෙම

---

13. රත්නපුරේ ජනකවි - 13 පි
14. පුරාණ සිව්පද සංග්‍රහව - 324 පි.
15. රත්නපුරේ ජනකවි - 14පි.

නව තාක්ෂණය සම්බන්ධයෙන් ලැබූ දියුණුව ජනකවියෙන් හෙළිවන්නේ මෙලෙසිනි.

පතලය තුළ කතාව සිදුවූයේ පයිප්පයෙනි. ඒ ජනකවියා දුරකථනය දුටු ආකාරයයි. එක්කුවක්යා හැකි මාර්ගයක් ද ඒ තුළ විය. වැඩි ජලකඳ හැරවූනේ පොම්පය වය.

122. පතු වල සොඳලු බඹ විසි පහලු
පයිප්යෙන් එහි කතාවලු
දෝනා දෙකලු ඩක්කු පාරලු
තුංමං හන්දියක් තිබෙනවලු
කළුගල තදලු-ලස්සන වැඩලු
යකඩ වළලු සවිකර තිබෙලු
ජලකඳ වැඩිලු-පොම්පෙට සැරලු
ඉතින් ඇරලා ඉහිනවලු[16]

දබරය කරකවා අතින් ජලය ඇදීමට වඩා වතුර පොම්පයෙන් ජලකඳ ගොඩට ගෙන ඒම ජන කවියාට පුදුමයක් විය. පෙර නොදුටු විරූ හාස්කමක් විය.

123. තොසන් වඩන මැල් මැතිඳුගෙ පතලයට
මෝලක් ගෙනාවා ජල කඳ ඉසින්නට
අඟලක් පමණ සැර ඇරියම පොම්පයට
ජලස්කන්ද ඇදගෙන එනවා ගොඩට[17]

දබර කරකවා වෙහෙස වූවන්ට මෙසේ පතල් තුළ ඇතිවූ නවීකරණය නිසා විශාල පහසුවක් දැණින. ඔවුන්ගේ සතුට හා නව අද්දැකීම පිළිබඳ සංස්කෘතික පෙරළිය සබරගමුවේ ජනකවියෙන් හෙළිවේ.

---

16. පතල් සිව්පද - 40 පි.
17. පතල් සිව්පද - 35 පි.

124. රටට ලියාලා මෝල් ගෙනැල්ලා
බිම සවිකරලා තියෙන රගේ
කොටුවට ඇරලා පැණි ගෙන්නාලා
දගර දමාලා තියෙන රගේ
යතුරු වසාලා සේ පුරවාලා
යතුරු අරිනකොට දුවන රගේ
විස්තර කරලා කවි මා දලා
අපේ මඩුවෙ දැන් මෝලෙ රගේ[18]

නව තාක්ෂණය සමඟ ඇතිවූ ජලනල ක්‍රමය ගැමියන්ගේ විශ්මයට හේතුවිය එය නව අද්දැකීමකි.

125. පොලවෙන් යට ජල යන්ත්‍ර සවිකර
සැම තැනටම පැන් ගෙන යැව්වා
මලුවෙන් පිටකර අරුමය විලසට
වතුරෙන් මල්ගස එහි තැනුවා
යතුරෙන් කරකවනාකොට සේරම
ජලයෙන් පැතිරීලා යනවා
රුදුවන්සේ සිත් කම්පාවන ලෙස
වතුරෙන් මල්ගස එහි තැනුවා[19]

වතු වැවිලි සහ පතල් ආශ්‍රිත ආර්ථිකය සමග ඉන්දීය ප්‍රභවයක් ඇති දෙමළ ජාතික ශ්‍රම භාවිතය ද ලබාගැනීමෙන් මෙරට සංස්කෘතිය තුළ තවත් උප සංස්කෘතියක් ගොඩනැගෙමින් පැවැතිණ. තේ හා රබර් වතුවල පමණක් නොව පතල් කර්මාන්තය තුළට ද විවිධ ශ්‍රමය එක්විය. මේ සමගම සිංහල සංස්කෘතියට වැදුනු පහර ජනකවියා දුටුවේ මෙලෙසිනි.

126. ලැලි දිගන් පලු ගහලා වල කටට
බාදි නිතර යන එනවා පතුල යට
පේලි සැදිලා තරුණෝ පෝලිමට
දෙමළ ඇවිත් කැත කෙරුවා මීගොඩට[20]

---

18. පතල් සිවිපද - 36 පි.
19. රත්නපුරේ ජනකවි - 32 පි.
20. පුරාන සිව්පද සංග්‍රහව - 225 පි.

127. අඩිය නොසොල්ලා අපි කරන වැඩ පලේ
පොඩි පොඩි ළමුන් ඇවිදින් කරන වියවුලේ
පඩිදෙන අපේ කංකානම මැතිගෙ බලේ
හැඩි දෙමළෙක් ගල විද්දයි දෝන වලේ[21]

දෙමළ ජනයා සමග එකට වැඩපොලෙහි යෙදුණු සිංහලයන්ගේ ව්‍යවහාර බසට දෙමළ බස මුසුවූ ආකාරය ද ජන කවියෙන් හෙළිවේ.

128. කොළඹ සිටන් දෙමළු දෙන්න ගාලු යන්න ආ තැනේ
එද උන්ට යන්ඩ බැරුව මුත්ගෙ ගෙදර නවාතැනේ
එද උන්ට මුත්ගෙ අම්ම කන්න උයල දුන් තැනේ
එද පටන් මුට දෙමළ පුළුවනි හා මුදුරුවනේ[22]

129. එන්නඩි සුරුකපෝවේ ජුජී බඩවා
වායිලේ මන්න පොට්ට පීතුල නෙරවා
කයිඉරි කව්චිරානේ ඉප්පිලේවා
සොල්ලදු දෙමළ බාසෙන් ඔන්න කීවා[23]

දෙමළ සංස්කෘතික අංග ලක්ෂණ ද සිංහල සංස්කෘතියට එක්වන්ට විය. කාමච්චිය නැමැති දෙමළ තරුණිය ගේ නර්තන විලාශය සිංහල නර්තනකලාවේ ව්‍යාප්තියට බලපෑවේය. නර්තන අංග සිංහලයන් ගේ විශේෂ අවධානයට ලක්වූ ආකාරය ජන කවියෙන් හෙළිවේ.

21. පුරාණ සිව්පද සංග්‍රහව - 225 පි.
22. රත්නපුරේ ජනකවි - 18 පි.
23. පතල් සිව්පද - 23 පි.

130\. ගෙනෙවිත් කුඹගස තබමින් වෙළ මැද
  කුඩ මුදුනේ එන  කාමච්චී
නළල තලාලිය මැදලා දත්පොඩි
  නැටුමට එනබව  තේරිච්චි
කඹේ උඩින් තම කුඩේ බැඳපු බව
  නටාය රණ ගිරව්ය  ලෙසිනේ
ඇසළ මස් එමද නැටුමට වර
  දෙමළ රුසිරු ළඳ  කාමච්චී[24]

සිංහලයන් ගේ නම් වෙනුවට විදේශීය නාම ආදේශකර ගැනීම පිළිබඳ තොරුතුරු ද සබරගමුවේ පතල් කවි තුළින් හෙළිවේ.

131\. ගණන් දමන්නට නම් කියැවෙන සැටි
  ගම ඇත නම ඇත  දැනගන්ඩා
සුනංගු නැතිවම ජේම්ස් පීරිස්
  එලියස් අල්විස්  පලයන්ඩා
මතන්සිඤ්ඤො ජෝකීනු ද මැන්දිස්
  පේදුරු රපියල් සහ  බණ්ඩා
මෙනම දරණ අර්නෝලිස් හෙන්ද්‍රික්
  පේද්‍රික් සහ පල  නාගන්ඩා[25]

132\. දත් කැකුළු  පැලිස්
සුරතල් සිනා  ජුලිස්
බොළඳ බස්  පීරිස්
කෙළී සියොළඟ දීගන  පිරිස්[25/1]

දෙවන ලෝක සංග්‍රාම සමය තුළදී සිංහල සංස්කෘතිය කෙරහි යුද්ධය කළ බලපෑම සහ එහි බිහිසුණු අද්දැකීම් සිංහල ගැමි හදවතට ළංවූ ආකාරයද සබරගමු ජනවියෙන් හෙළිවේ.

---

24\. සපරගමුවේ ජනකවි - 37 පි.
25\. සිව්පද හා සමාජය - 51 පි.
25/1. කුකුළු කේරලේ ජනප්‍රවාද - 82 පි.

133. යුද්ධය ඇතිවී මේ රට වැසියෝ
සෝකෙන් බියපත් වී යනවා
රට සිට ඇවිදින් අහස්යන්තරා
මේ රට හැම තැන කරකැවෙනා
සද්දය ඇසිලා පුදුමවෙලා සිට
බැලුවම උඩු ගුවනේ දුවනා
සිද්ද සමන් දෙවි යුදදේ තිමාකර
දුප්පත් සෙනඟගෙ ගිනි නිවනා [26]

අහස් යාත්‍රා රට හැම තැන කැරුකි-කැරුකී යාම හා ඒවායෙන් නැගෙන භයංකර ශබ්දය ගැමියාට පුදුමයක් විය.

කොළඹ කොටුවේ සිට ඕපනායක දක්වා පැවැති කැළණිවැලි දුම්රිය මාර්ගයත්, කොළඹ කොටුවේ සිට මහනුවර දක්වා දිවෙන උඩරට දුම්රිය මාර්ගයත් සබරගමු පළාතේ ගමනාගමනය පිළිබඳ නව සංස්කෘතියක් බිහි කළේය. මෙම නව ගමනාගමන ක්‍රමයේ පුදුමය ගැමි ජනතාවගෙන් කියවුණු ආකාරය ජන කවියෙන් හෙළි කෙරේ.

දුම්රිය ගැමි ජනතාව නොදුටු පුදුමයක් සේම විශ්මය ගෙනු දෙන්නක් ද විය. එම පුදුමය සවුදම් නැටුමකට ලක්වූයේ මේ අයුරිනි.

134. බෙර කඳ විලසට යකඩය තලලා
ඇතුලේ ගිනි දමතෙයි
වෙලාව ඇවිදින් ලෑස්තිවෙන කොට
හුයි කියා ගතිතෙයි
ඇණ කිහිපයකුත් මිරිකා හරිමින්
පීල්ල උඩ දුවතෙයි
රේල්ලු සවුදම කොහොමද ඇසුවොත්
පැයට කොළඹ දුවතෙයි [26]

26. සබරගමුවේ ජනකවි - 46 පි.
26. සව්දම් කේ. එන්. ඩී චන්ද්‍රසේන

ගැමියාට අරුම පුදුම - වාහනයක් වූ දුම්රිය ද විෂ්ණු - සමන් වැනි දෙවිකෙනකුගේ මැවීමක් ලෙස ජනකවියා විශ්වාසය පළ කෙළේය.

135. බලා සිටිද්දී රුපියල් දීලා
එවලෙම කොළඹට යනවාලු
ගොන් බැන්දෙත් නැත - අසු බැන්දෙත් නැත
කරත්ත හතලිහ යනවාලු
කඩුගන්නාවේ බර පටවාලා
පේරාදෙණියෙ නවතිනවාලු
සිංහල සෙනහට නොදුටු පුදුමයක්
විෂ්ණු-සමන් දෙවි මැව්වාලු[27]

ජනකවියා දුම්රිය දුටුවේ ගොන් බැන්දෙත් නැති, අසු බැන්දෙත් නැති එකට ගමන් කළ කරත්ත හතලිහක් ලෙසිනි. මේ ජනකවියා දුම්රිය දුටුවේ ගෙවල් හතලිස් හතරක් එකට ඇදගෙන යන්නාක් මෙනි.

136. කොළඹ සිටන් එන හතරැස් කෝච්චිය
උපමාවෙන් ඇණ කරකැව්වේ
අසු බැන්දෙත් නැත-ගොන්බැන්දෙත් නැත
කරසක ගානට ඉගිලෙව්වේ
යන එන සෙනඟට බලා සිටින්නට
ස්ටේසම් පොලවල් හැදුවේ
ගෙවල් හතලිස් හතරක් ඇදලා
බලන්න සිංහලයට එව්වේ[28]

'හැතැම්මම තුනකුත් තුන් කාලක්' කඩුගන්නාවේ ගල විද, ගලට මැදින් රේල්ලුව ගමන් ගත් ආකාරය සබරගමුවේ ගැමියාට නොදුටු පුදුමයක් විය. 'අඟුරු ගෙනෙනවා - ගෙට පූරවනවා - කොකු අව්ලනවා - හුළං බදනවා' - දුම්රිය ගමන් ගන්නා හඬ නැංවෙන ආකාරයෙන් මේ ජන කවිය නිර්මාණය වී ඇත.

---

27. ජනසම්මත කවි ගී - 69 පි.
28. සපරගමුවේ ජනකවි - 72 පි.

137. අඟුරු ගෙනෙනවා ගෙට පුරවනවා
කොකු අව්ලනවා දැකපල්ලා
හුළං බඳනවා-දුම් පටලනවා
රේල්ලුව යනවා දැකපල්ලා
හැතැම්ම තුනකුත් තුන් කාලක්
ඇත කඩුගන්නාවේ ගල විදලා
සින්දුව කිව්වට වස්නැත දෙවියනි
ගලට මැදින් රේල්ලුව යනවා [28/1]

රේල්ලුව තවත් ජනකවියෙක් දුටුවේ මේ ආකරයෙනි.

138. දර පුවනවා - අඟුරු දමනවා
ජල උණුවෙනවා නිරන්තරේ
රැළ නද දෙනවා - දුමතද වෙනවා
විදුලි කොටනවා රේලු සැරේ
මොරහඬ දෙනවා - කම්පා වෙනවා
පොළව නටනවා රේලු සැරේ
හැර වෙන මොනවා - මෙරට තියෙනවා
බලන්ඩ එනවා දුවන සැරේ[29]

රේල්ලුව ජනකවියට පුදුමය ගෙන දුන් නව අද්දැකීමක් විය. නව සංස්කෘතික අංගයක් විය. දුම්රියේ ගමන හා හඬ දැනවෙන 'උඩරට - මැණිකෙට - පට - කුඩ - දෙක - දෙක' කීවාක් මෙන්. 'දරපුරවනවා-අඟුරු දමනවා - ජල උණුවෙනවා-විදුලි කොටනවා - මොරහඬ දෙනවා - කම්පා වෙනවා - පොලව නටනවා' යන වචන භාවිතය මගින් දුම්රිය ගමන්කරන ආකාරය දකින හා නාදය ඇසෙන ජංගම පද සංඝටනාවකින් යුත් ශ්‍රව්‍ය ගෝචරවූත්, දෘෂ්ටි ගෝචර වූත් නව රටාවකින් ජනකවියා එය ඉදිපත් කෙළේය.

සංස්කෘතික පෙරළියකට ලක්වමේන් සිටි ගැමියන්ගේ මෝඩකම් ද, සබරගමු ජනකවියෙන් හෙළිවේ. ජනකවියා ඒ අය උපහාසයට ලක් කෙළේය.

28/1. සපරගමුවේ ජනකවි - 131 පි.
29. ජන සම්මත කවි ගී - 86 පි.

139. ගෝනව මරලා ඊස්සට වළලා
අවුරුද්දට ගත් මෝඩකමත්
දනෙට අරගත් පස්සගාත්වල
තාර උකුණු කළ මෝඩකමත්
බෝකොට නිදිමත වී යයි අලියට
පැදුරු එලූ ගජ මෝඩකමත්
මුලට මදිවී පත්තුකරපි මහ
පන්දමකුත් පොල් ගහක් ගෙනත්[30]

ඉංග්‍රීසි පාලන සමය තුළ ඇතිවූ පෝරකය (එල්ලුම්ගස) සමාජය සංස්කෘතික පෙරළියකට යොමු කෙළේය. උල තැබීම - හිටුවාපස් ගැසීම වැනි පාරම්පරික මරණීය දණ්ඩනයන්ට වෙනස් වූ පෝරකය පිළිබඳ බිහිසුණු අද්දැකීම් ජනකවියා සිහිකෙළේ මෙසේය.

140. කැගල්ලේ ඕවිට හරි සෙයිලම
මැද්දේ පෝරකයක් ඇද්දේ
ඒ ගොල්ලගෙ වස නපුරු කමට කළ
යුද්දේ තැන තැන පරසිද්දේ
අනේ තරුණ ළමයින්ගේ හිත බය
වෙව්වී ඇඟ හිවුඩු පිපිච්චී
ඇනේ අදිනකොට ලැල්ල පාත
වැටිච්චී පස්දෙන එල්ලිච්චී[31]

පෝරකය තරුණ ළමයින් බිය ගැන්වීය. දුටු-දුටු අයගේ ඇඟ හිරිගඩු පිපුණේය. ඇඟ කිළිපොලා ගියේය. අතින් අදින විට ලැල්ල පහත්විය. පස් දෙනාම පෝරකයට බිළි වූහ. මෙය නව සමාජය හා සංස්කෘතික අද්දැකීමක් විය.

30. රත්නපුරේ ජනකවි - 18 පි.
31. නාදෙණියේ සිත්දුව
සාහිත්‍ය විචාර - 3 - 27 පි.

# සබරගමුවේ ජනකවියෙන් හෙළිවන සමාජ තොරතුරු

# 5

ජනකවිය කාලාන්තරයක් තිස්සේම ජනතාවගේ සංස්කෘතිය සන්නිවේදනය කරන්නක් පමණක් නොව, සමාජ පරිසරය ද කදිමට හෙළිකෙරෙන මාධ්‍යයකි.

අන් හැම සාහිත්‍යාංගයකට වඩා පරිපූර්ණ සමාජ තොරතුරු ලැබෙන්නේ ජනකවියෙනි. කෝට්ටේ යුගය තෙක් ලියැවී ආ ගද්‍ය හා පද්‍ය ග්‍රන්ථයන් සංස්කෘත අලංකාර ශාස්ත්‍රයන්ට නැඹුරුව ඉන්දීය පරිසරය නිරූපණය කෙළේය. සද්ධර්මරත්නාවලියේ ගැමි ජීවන සුවඳ මුසු වුවද එහි ද සමාජ තොරතුරු හමුවන්නේ මද වශයෙනි. එහෙත් හැම ජනකවියකින්ම කිසියම් සමාජ තොරතුරක් විදහා දැක්වේ. මේ නිසා සිංහල ජනකවිය සමාජ හරයන් හා සමාජ යථාර්ථයන් නිර්ව්‍යාජත්වයෙන් හෙළි කෙරෙන කැටපතක් බඳුය. සබරගමුවේ ජනකවියෙන්ද සමාජ තොරතුරු රැසක් හෙළිකරගත හැකිවේ.

**අම්බලම** - මගියන්ට සෙවන සැදූ ගිමන නිවූ සමාජ සංස්ථාවක් විය. අම්බලම ද අභාවයට ගියේය. එහෙත් මෑත ඉතිහාසය තුළ වුවද අම්බලම - ජනතාවට ඉතා වැදගත් මෙහෙයක් ඉටු කළේය. අම්බලමේ නැවතී ගිමන් නිවාගත් අය, එය අතු-පතු ගා ශුද්ධ පවිත්‍ර කොට පිරිසිදුව තබායාම සිංහල ලකුණක් ලෙස හා සාරධර්මයක් ලෙස ජනතාව අතර පැතිර තිබුණු ගුණයකි. එහෙත් පසුකාලවල අම්බලම් අපවිත්‍ර කොට, එහි කැත වචන ලියා- කැත රූප සටහන් ඇඳ, කුරුටුගා, පුවක් ලෙලි - දුම්කොළ නැටි - දමා බුලත් කෙළ ගසා හුණු ඉරි ඇඳ, අවට මුත්‍රාකර අපවිත්‍ර (කැත) කර තිබෙනු දුටු සබරගමුවේ ජනකවියා, සමාජයට උරුමකොට ඇත්තේ මහඟු උපදේශයකි. මේ පොතුපිටියේ අම්බලම දුටු සබරගමු ජනකවියොගෙන් සමාජයට ලැබුණු උපදේශයකි.

141. ලියා කැත වචන වැඩනැති දෙලොවටම
කපා පුවක් ලෙලි තැන තැන දමා බිම
සපා බුලත් කෙළ නොගසනු සිතු ලෙසම
එපා කැත කරන්නට මේ අම්බලම[1]

කුකුළු කෝරළයට අයත් වූ රජමහා කුකුළුවා විහාරයේ බුදු පිළිමය නිදන් හොරුන් විසින් (ක්‍රි.ව. 1892 දි පමණ) විනාශ කරනු ලැබුහ. බුදු පිළිමයේ දෙවුරට - ළමැදට හා හිසට වෙඩිතබා කළ අපරාධය සබරගමුවේ ජනකවියා සමාජයට දැක්වූයේ මෙළෙසිනි. එද නිදන් හොරුන්ගෙන් ජාතියට හා ආගමට ඇතිවූ විනාශය මෙයින් අනාවරණයවේ.

142. සිරිලක පරසිදු නවදුන් කෝරලෙ
මැදපත්තුවෙ කිරි ඇලි කන්දේ
පෙරසිටි රජවරු තැනූ විහාරේ
බොල් වී තිබුණයි ගම මැද්දේ
පව්කළ හොරු රැළ කුකුළු විහාරේ
පිළිමෙ කඩන්නට කළ යුද්දේ
දෙවුරට - ළමැදට - සිරසට වෙඩිතුන
තැබුවා ලෝකෙට පරසිද්දේ[2].

ආවාහ - විවාහ මංගල්‍ය උත්සව වලදි මඟුල් තහංචි කවි කීම, පැරණි සිංහල සිරිතකි. මේ දෙපාර්ශවයේ දැනුම් තේරුම් ඇති නැදැයින් විසින් තම තමන්ගේ දැනුම පෙන්වීමට යොදගනු ලැබූ අවස්ථාවකි. එක් පාර්ශවයක් විසින් කරනු ලබන තහංචිය අනෙක් පිරිස විසින් ඉවත්කරගැනීම පිණිස කවි ගායනා කෙරේ.

---

1. කුකුළු කෝරලේ ජනකවි - 07 පි
2. කුකුළු කෝරලේ ජනකවි 06 පි.

143. පළමුව මේ කප නසිනා කාලෙදි
 බුලත් තිබුණු තැන කොතැන කියන්
දෙවනුව මහ සම්මත රජ වලියට
 බුලත් ගෙනාවේ කවුද කියන්
පත්තිනි පාලඟ වෙළඳත් දුන්ද
 බුලත් ගත්තු අය කවුද කියන්
බුලත් උපැත්තියෙ මුල කියලා මිස
 ඉලත්තට්ටුවෙ අත නොකියන්[3]

මේ. හතංචිය ලැබූ පිරිස "බුලත්උපත" කවියෙන් කියා දී තහංචිය ඉවත්කරගත යුතු විය.

බුලත්විට අතහැර දැමූ බාල පරම්පරාව, සුරුට්ටු හා සිගරැට් වලට පුරුදු විය. එනිසා බුලත් විට නොරුස්සන දෙයක් බවට පත්විය. මෙම සමාජ පෙරළිය සබරගරමුවේ ජනකවියෙන් හෙළිවෙන්නේ මෙලෙසිනි. ඔවුන්ට බුලත් උපත අවශ්‍ය නොවීය. අවශ්‍ය වූයේ සුරුට්ටු හා සිගරැට් පමණි. මෙය තහංචි කවියට ලැබුණු පිළිතුරක් ද?

144. පළමුව මේ කප නසිනා කාලෙදි
 අපේ මුත්තවත් නැතිලු බොලන්
දෙවනුව මහ සම්මත රජවලියට
 අපේ දෙමව්පියො නැතිලු බොලන්
පත්තිනි පාලඟ වෙළඳත් දුන්ද
 අප සිටියේවත් නැතිලු බොලන්
බුලත් උපැත්තිය අපට ඕනැ නැත
 සුරුට්ටු-සිගරැට් බොන්ට දියන්[4]

පොලව යට සිට , දුක්බර රැකියාවක් කොට, මුදල් උපයාගෙන, දුකසේ පවුල් ජීවිතය ගෙන යන මිනිසුන් නසන්නට කුරිරු මිනිසුන් යෙදූ උපායවල් මිතිරන් පතල් ආශ්‍රිත ගම්මානවලදී

3. රත්නපුරේ ජනකවි 75 පි.
4. රත්නපුරේ ජනකවි 75 පි.
5-6. පතල් සිව්පද

දක්නට ලැබුණි. රා-අරක්කු විකිණීම, බූරුවා ගැස්වීම වැනි සූරා සූදු ගම්වල ඇති විය. කම්කරුවන් දාඩිය මහන්සියෙන් උපයාගත් මුදල් එම ජාවාරම් කරුවන්ට බිලිවිය. මෙම සමාජ දූෂණය රත්නපුරයේ බෝගල පතල් ආශ්‍රිත ගම්වල සිදුවූ බව සබරගමු පතල් කවියෙන් හෙළිවේ.

145. රැකියාවක් කරල මුදලක් උපය ගෙන
දුකසේ ජීවිතය ගෙන යන පවුල් උන
මිනිසා නසන්නට උගුලක් අටව ගෙන
සිටිනා පිරිසකුත් බෝගල හතර කොන [5]

146. පොලව යට ඉඳන් අපි මේ වැඩ කරන
අට පැයක් පමණ ගනදුර ගල් විඳින
එයින් ලැබෙන මුදලින් සූරා බීගෙන
ඉතුරු මුදල පඩියට බූරුව ගහන [6]

එම ජනකවිය තුලින් පතල් සමාජයේ එක් නොදුටු පැතිකඩක් නිරූපණයවේ.

වලව් බොහෝ සංඛ්‍යාවක් සබරගමුවේ පැවැතිනි. සබරගමුවේ වලව් පරපුරවල් ගැමි ජන සමාජය කෙරෙහි ඉමහත් අණසක පැතිර වූහ. වලව්ව ගැමි සමාජයේ උසස්ම සංස්ථාව විය. නඩු ඇසීමේ විනිශ්චය කාර බලය, පවා ඒකරාශි වී තිබුණේ වලව් වලටය. නින්දගම්, මුත්තෙට්ටුගම් වල උරුමය ඇතිව, එම ගම්වල විසූවන් කෙරෙහි සියළු බල පරාක්‍රමය පතුරමින් ජනතාව සිය අණසක යටතට ගෙන තිබුණි. ජනතාවද ඔවුන් වෙනුවෙන් සේවය කළ යුතු වූහ.

බලවත් වලව්වල නිලමේ පැලැන්තිය, සාමාන්‍ය ජනයාට සැළකූ ආකාරයත්, එනිසා සමාජයේ පැවති ලොකු මහත්කම් හා පහත්කම් අතර වෙනස දැක්වෙන සමාජ විවරණාත්මක ජනකවි රාශියක් සබරගමුවේ ජනකවියට එක් වී ඇත.

---

7. කුකුළු කෝරළේ ජනකවි - 09 පි.

වලව්වක දඩමස් උයා තිබියදී, දෙල් කෑමට ලුණුමිරිස් පමණක් දීමෙන් නිලමේ කෙනෙක් කළ හපත්කම ජනකවියා දුටුවේ මෙසේය. "නිවට අයත් දඩමස් කනබව" ජනකවියා නිලමෙට කීවේය. වලව්වල දුර්වල තැන් සමාජයේ දෝෂ දර්ශනයට ලක්විය.

147. එපිට වලව්වේ මුදියන්සේ නිලමේ
කවට කමක් කළ හැටි ඇසුවද පුදුමේ
අපට දෙල් කණ්ඩ ලුණු මිරිසුත් කදිමේ
නිවට අයත් දඩමස් කනවා නිලමේ [7]

සමාජ අසාධාරණය දුටු ජන කවියා මුදියන්සේ නිලමෙට පමණක් නොව මුළු වලව් පැලැන්තියටම එල්ල කෙළේ දරුණු පහරකි.

නිලමේ කෙනෙකුගේ කෝපි කඩයෙන් ද සාමාන්‍ය ගැමි ජනයාට ලැබුණේ මඳ සැලකිල්ලකි. ඇල් දියෙන් කෝපි සාදදීම මොනතරම් මදි පුංචිකමක්ද? ජනකවියා එය ඉවසුවේය. ඇල් දිය සහිත කෝපි පානයකළ ජනකවියාගේ කට සීතල වුවද, "කෝපි වලට ඇල්දිය හොඳ මදි" යි කීමෙන් පසු නිලමෙගේ නම් කණ රත්වන්නට ඇත.

148. පාපයෙන් ඉපිද අපි විඳිනා කරුමේ
පිපාසෙන් ගියේ කඩයට දැක නිලමේ
බීපු කලට කට සීතල වුණු මහිමේ
**කෝපි වලට ඇල්දිය හොඳමදි** නිලමේ [8]

ඉත් නොනැවතුන ජන කවියා, නිලමෙට උපදේශයක් ද දුන්නේය.

---

8. කුකුළු කෝරළේ ජනකවි - 10 පි.
09. කුකුළු කෝරළේ ජනකවි 10පි.

149\. එපා බොහොම මතු වෙළදන් කරන්නට
අපායක් නොදැන වෙළදන් කරන්නට
පිපාසෙට ආවේ මම කෝපි බොන්නට
අපායට වැටෙයි මය වෙළදන් වලට[9]

තිලමෙලා - මෙසේ අවූ සැළකිලි දක්වන්ට ඇත්තේ කුල ක්‍රමය (සමාජ ස්ථරායතනය) සැළකිල්ලට ගෙන විය හැකිය. ඉන් නිරූපණය වන්නේ සමාජය තුල ක්‍රමය දතුව ගොඩනැගී තිබූ ආකාරයයි. තිලමෙලා - ගැමියන්ට මදි පුංචිකම් කළා පමණක්නොව, ගුටි-බැට පවා දුන් අවස්ථාවන්ද සබරගමුවේ ජනකවිවලින් හෙළිවේ.

තරුණයෙකුට ගුටි බැට දුන් අවස්ථාවකදී නම් තිලමෙ කෙනෙකුට වුවත් වරදින්ට පිළිවන "පුළු සිදුරකින් ලොකු ගමනක් හිඳ බසිනවාලු" යනු වෙන්ද කියමනක් ඇත. එසේම:

150\. වන්කම් පළ කළ ද නම්බුව ඇති පරිදි
දස්කම් කරති සමහරු කරමින් වැරදි
විස්කම් පාති අගතිව සොද කාලෙදි
ලොන්කත් ගටත් බොහො වුවවන්ගෙන් වරදි[10]

යනුවෙන්ද ජනකවියේ සදහන්වේ.

මේ මහළු අයෙකුට තිලමෙ කෙනෙකුගෙන් උපරන් වැදුණු අවස්ථාවකි. මහළු අයෙකුට ගැසීමත් ලොකු වන්ඩිකමක් දැයි සබරගමුවේ ජනකවියා තිලමෙගෙන් අසුවේය.

151\. වන්ඩි කමක් කළ හැටි තිලමේ කදිම
පරුෂ බවින් මා හට බැනලා බොහොම
තරුණයෙකුට ගහපු ද වරදි මෙහෙම
මහළු අයට ගැහුමද ලොකු වණ්ඩිකම[11]

10\. ජනකවි සිපසත 04 පි.
11\. කුරුළු කෝර්ලේ ජනකවි 06 පි.
12\. සබරගමුවේ ජනකවි 45පි.

නඩු ඇසීමේ අධිකරණ කටයුතු පවා වලව්තුළ සංකේන්ද්‍රගත වූ ආකාරයත්, සාමාන්‍ය ගැමියන්ගේ නඩු ගැන වලව්වල අවධානය එතරම් යොමු නොවී, අවනඩු බවට පත්වූ ආකාරයත් ජන කවියෙන් හෙළිවේ.

152. හොඳයි කියන ඇලපාත වලවේවේ
මන්දැයි අපෙ නඩු නාසන්නේ
ඇතා වගේ මගෙ ගොනා මරාලා
කවුදෙයි ඇල්ලට පෙරලුයේ
පාරේ යන්නෝ ගොනා මරාලා
නිම නැතිලේ ගිහි මට දුන්නේ
විෂ්ණු-කරතගම දෙවිගැන දිවුරන්නා
ගොනා මැරූ බව නැත දන්නේ[12]

මෙසේ රදළ පෙළැන්තිය අසරණ ගැමියන් කෙරෙහි තම අණසක පැතිරවූහ. අසල්වැසි දුප්පත් ජනයා වලව්වේ වැඩ පොල වලට යොදගත්හ. ඒ වෙනුවට ඔවුනට කුලී ගෙවීමක් නොවීය. ඒවා ගැමියන් විසින් චාරිත්‍රානුකූලව ඉටුකල යුතු වලව්වේ රාජකාරි බවට පත්වී තිබුණි. රාත්‍රි කාලය වන තෙක්ම වලව්වේ වී කෙටූ මේ දුගී කාන්තාවට ඒ වෙනුවට වලව්වෙන් ලැබුණු දෙයක් නැත.

153. අනේ ගුණේ ඇති ගනේ වලව්වේ
වී කෙටුමට පණිවුඩ එව්වේ
වී කෙටුවා මිස දුන්නු දෙයක් නැත
අඳුරු වෙලයි ගෙදරට ආවේ
ළමයින් දෙන්නා දුවගෙන එන කොට
දෙන්නේ මොනවද ඇන්නැවේ
කුලිය නොදී වැඩ ගත් අය ගොස්
අද හොත් ජම්මේ උපදින්නේ[13]

13. සබරගමුවේ ජනකවි 47 පි.
14. ගොවි ගෙදර ජනකවි 255 පි.

එම ජනකවිය මේ ආකාරයෙන්ද දැක්වේ.

154. ගුනේ පනේ ඇති ගනේ වලව්වේ
 වී කොටුමට පණිවුඩ ආවේ
 වී කොටුවා මිස දුන්නු දෙයක් නැත
 හදපානේ ගෙදරට ආවේ
 අනේ මගේ දරුවන් හඩනාවිට
 මොනවද දෙවියනි මම දෙන්නේ
 විෂ්ණු සමන් දෙවි ඇතිකාලේනම්
 මැණිකේ හතරට පලවන්නේ[14]

"මැණිකේ හතරට පැලියන්" කියා පළිගැසීම විනා දරුවන්ගේ කුස ගිනි නිවා ගැනීමට ඇයට නොහැකි වූවාය. මෙහි දැක්වෙන්නේ "මැණිකේ හතරට පැළියාවේ!" යනුවෙනි.

155. ගුණේ ඝනේ ඇති වලව්වටයි මට
 වී කොටුමට පණිවුඩ එව්වේ
 වී කොටුවා මිස දුන්නු දෙයක් නැත
 හිස් අතකින් ගෙදරට එව්වේ
 අනේ මගේ දරු දෙන්න හඬන කොට
 මොනවද සපයා ගෙන කැව්වේ
 සුමන සමන් දෙවි ඇති කාලේනම්
 මැණිකේ හතරට පැළියාවේ[15]

වලව්වලට අයත් වූ කුඹුරුවල කයියට එක්වූ විට ද ගැමියන්ට ලැබුණේ අඩු සැළකිල්ලකි. නෙළුම් කයියට එක්වූ තරුණියන්ට බීමටවත් දෙයක් නොලැබුණි. ඉර මුදුනේදීවත් වැඩ හමාරනොවූ ඔවුන්ට, නෙළුම එපා වූ ආකාරය සබරගමු ජනකවියෙන් හෙළිවේ.

---

15. රත්නපුරේ ජනකවි 71 පි.

156. උදේ සිටන් අපි තුනටි කඩාගෙන
මන්දැයි දැසට නොපෙනෙන්නේ
රජුගෙ වැඩක් දෝ ගොවිගෙ වැඩක්දෝ
කස පැන් ගෙඩියක් නොලැබෙන්නේ
නලාව නැතිවද-වෙළාව නැතිවද
දෙළහටවත් වැඩ නාරින්නේ
උඩහ වලව්වේ නිලමෙට කියලා
නෙළුම නතරකර අපි යන්නේ[16]

උණු දිය හැලියක් වත් ලැබුණේ සවස් වී ඉර අවරට ගිය පසුවය. ලැබුණු හකුරු කැට පවා තිබ්බටු ගෙඩි තරමටම කුඩා විය. කාන්තාවෝ එකට එක්වී තීරණය කෙළේ මින් මතු එම හේනේ වැඩකට නැවත නම් නොඑන ලෙසය.

157. උදේ සිටන් අපි තුනටි කඩාගෙන
මන්දැයි දැසට නොපෙනෙන්නේ
සවස් වෙලා ඉර අවරට යන කොට
උණු දිය හැලියක් ගෙනෙමින්නේ
තිබ්බොටු තරමට හකුරු කඩාගෙන
උතුරන දිය ටික ටික දුන්නේ
අපි මෝ සැම දෙන සමගි කතාවී
මින්මතු වැඩකට නේමින්නේ[17]

මෙසේ වෙතත් ගැමියන්ගේ ආදර ගෞරවයට පාත්‍ර වූ වලව් කාරයන් ද වූ බව, ජනකවියෙන් හෙළිවේ. ගැමියා ඔවුන්ට සැළකුවේ ගරු නම්බු ඇතිවය. එවැනි වලව්කාරයන් ගෙමන් කරනා බව, ගැමියා සඳහන් කෙළේ 'යහපත් වෙනවා' යනුවෙනි. නිලමේ නිද ගැනීම, භික්ෂූන් වහන්සේ නමක් මෙන් 'සැතපී ඉඳීම' විය. වලව්වේ ඇත්තන්ගේ ඇඟ 'රන්කඳ' මෙනි. මෙසේ ගෞරව සම්ප්‍රයුක්තව සඳහන් කෙළේ ගුණවත් වලව් කාරයන් ගැන විය හැකිය. එවැනි කෙනෙකුගේ වියෝගයත් ඔහු හෝ ඇය සුසාන

16. ගොවි ගෙදර ජනකවි 98 පි.
17. සබරගමුවේ ජනකවි 67පි.

භූමියක තැන්පත් කිරීමත් ගැමියා තුළ ඇති කෙළේ දැඩි ශෝකයකි. ඒ සමාජ පිළිගැනීමයි.

158. උදයට සූරිය පායන්නාසේ
    මහදෙරකඩ යහපත් වෙනවා
සවසට පුන්සඳ මූවාවුනාසේ
    යහන් අඳක සැතපී ඉන්නා
රත්රන් බඳවට ඉදුනයි ගෝමර
    ඇතට රන්කඳ දිළිසෙන්නා
එසෙව් රුව ඇති රත්රන් කඳ අද
    පාගල් මිවිට සැතපෙන්නා[18]

දූප්පත් අයට පිහිට වූ කලවානේ වලව්වේ නිලමේගේ වියෝවීම, ජන කවියා දුටුවේ මේ අයුරිනි. කලවානේ නිලමේ රත්රන් පිළිමයක් බඳුය. පස්ළොස්වක ද සඳ මෙන් දීප්තිමත්ය. ඔහුගේ වියෝගය දුප්පත් සෙනඟට ගින්දරක් වූ සැටි සතර වරම් දෙවියන්ට කී ආකාරය මේ ජනකවියෙන් පැවැසේ.

159. කලවානේ මහතුන්ගෙ වලව්වේ
    රත්රන් පිළිමය දිළිසෙන්නේ
පසළොස්වක සඳ පායන විලසට
    පිල පිට උන්කල බබලන්නේ
මෙසෙව් මෙ රත් කඳ කොහේ ගියාදේ
    දුප්පත් සෙනඟට නොපෙනෙන්නේ
දුප්පත් සෙනඟට මේ දුන් ගින්දර
    සතරවරම් දෙවි නොබලන්නේ[19]

වටගෙදර වෙලේ මඩමක් තැනූ රත්නපුරේ බස්නායක නිලමේත්, දිය බෙත්ම කැලේ මඩමක් සැදූ ගිලීමලේ නිලමේත් ගැමියන් ගේ ආදර ගෞරවයට ලක්වූහ. ඔවුන්ට ඒ ගෞරව ලැබුනේ ඔවුන් සමාජ සේවකයන් වූ බැවිනි. ඔවුන් දෙදෙනා ගැන ජනකවියා මෙසේ පවසා ඇත.

18. සපරගමුවේ ජනකවි 46පි.

19. කුකුළු කෝරලේ ජනකවි සහ ගැමි සංස්කෘතික ලක්ෂණ 126 පි.

160. එකර මෙකර මේ සිරිලංකාවේ
සැදුනි මඩම වට දෙර වෙලේ
මකර තොරණ යට මැණික් දිළෙන සැටි
විස්තර මඩමක් සැදුනි වෙලේ
එතර සිටන් එන දෙමළ කියන්නන්
මසුරන් දී ලැබ ගන්නට ලොලේ
රත්නපුරේ බස්නායක නිලමේ
දිව රතයෙන් යති මතු කාලේ[20]

රත්නපුරේ බස්නායක නිලමේ විසින් බටුගෙදර වෙළේ තනවන ලද මඩම පිළිබඳ විස්තර පහත දැක්වෙන ජනකවියෙන් ද අනාවරණය වේ. කලින් කවියේ සඳහන් වූ "වටගෙදර" යන්න "බටුගෙදර" විය යුතුය'යි මට හැඟේ.

161. එතෙර මෙතෙර මේ සිරිලංකා පුර
උතුම් මඩම බටුගෙදර වෙලේ
එතෙර සිටන් එන දෙරට කියන්නන්
මසුරන් දී ලැබ ගන්න ලොලේ
මැණික් තොරණයට මැණික් දිළෙන විට
විස්තර මඩමක් සද වෙලේ
රත්නපුරේ බස්නායක නිලමේ
තැනෙව් මඩම බටුගෙදර වෙලේ[21]

162. පලා දෙලේ බත් උණු කාලේ
තුනුරුවන් බලේ සිරිපාද මුලේ
නිලී හෙලේ ගොඩ නගින වෙලේ
දිය බෙත්ම කැලේ කළ මඩම බලේ
ගැඹුරු ජලේ සීතල ගඟුලේ
දියනාපු කලේ යමු බුදු මඟුලේ
වටපිට නොගොසින් දඹදිව සම්පත්
අත්වෙයි නිලමෙට ගිලීමලේ[22]

---

20. සිංහල ජනකවි සංග්‍රහය ii 100 පි.
21. රත්නපුරේ ජනකවි 32 පි.
22. සිංහල ජනකවි සංග්‍රහය ii 100 පි.

මෙම මඩම තැනවීමෙන් සිරිපා වන්දනාකරුවන්ට පහසුකම් ලැබී ඇත. පොදු ජනතාවට සේවා සැපයීම එම සමාජයේ ප්‍රභූන්ගේ වගකීමක් හා යුතුකමක් බවට පත්වී තිබුණි. එහෙත් සමාජයට හිසරදයක් වූ නිලමේ කෙනෙක් දැරසැයේ දැවෙන විට, ඔහුට එල්ල කළ සරදමකි මේ.

වෙඩිබෙහෙතට ගින්දර වැනි, නපුරුකම් ඇති නිලමේ ගමන්කරන විට වලව්ව දිළිසෙන බවත්, වීදිය දිළිසෙන බවත් ජන කවියා කීවේ ඔහුගේ තේජස, මහන්තත්වය හා බලපුළුවන්කාර කම ධ්වනිත කිරීම පිණිසය. නිලමේ දරසැයේ දැවී යනවිට ඒ සියල්ල ද දැවී යන්නා සේය.

163. වලව්වෙ සිටලා දෙව්ට බහින කොට වලව්ව දිළිසෙනවා     නිලමේ
වීදිය බැස දේවාලෙට යනකොට වීදිය දිළිසෙනවා     නිලමේ
නතර වෙලා සිට මුහුණ බලන කොට වෙඩිබෙහෙතට ගින්දර     නිලමේ
මෙහෙම ගුනේ ඇති නිලමේ කොස්ගොඩ වත්තේ දරසැයේ     නිලමේ[23]

මේ අතර එකිනෙකා කොටවා උගුල් අටවන, සොරකම් කරන, ඇනුම් බැනුම් කියන, පිරිසක් ද සමාජයේ ජීවත්වූහ. එවැනි වුන් ගමෙන් පමණක් නොව මුළු සමාජයෙන්ම තුරන් වනු දැකීම කාගේත් සතුටට හේතු විය. සබරගමුවේ ජනකවියාගේ සතුටට හේතුවූයේ ද එයයි.

164. පටන් පෙර සිට කෙටුම් කොටවන
මුදලිගම් ආරච්චියා     ටත්
ගොසින් ඉඳගෙන උගුල් අටවන
පුරත්සා මහ     හොරාටත්
තිකන් ඉඳගෙන බැනුම් අහනා
කෙහෙල් කොටුවේ     නිලමෙලාටත්
රටෙන් පිටවන වසංගතයක්
නැද්ද මේ මුන් තුන්     දෙනාටත්[24]

---

23. රත්නපුරේ ජනකවි 24 පි.
24. කුකුළු කෝරළේ ජනකවි 18 පි.

ගමට විනක්වන මුන්, ගමෙන් පමණක් නොව, සමාජයෙන් පවා තුරන්වනු දැකීම කාගේත් ආශාවකි.

සමාජයෙන් තුරන් කළ යුතු තවත් පිරිසක් වෙති. උදේ පටන් රෑ වන තුරු හොරා පොල් කඩන, සූදු කෙළින අය, මුළු රටට ම විණ කරති. ඔවුන් සමාජයට වධයකි. තම අඹුදරුවන් පවා කුසගින්නේ තබන මොවුන් මුළු රටටම විණ කරන බව සබරගමුවේ ජනකවියාගේ කල්පනාවයි.

165. උදේසිටන් රෑ වන තුරු
පදුරු අස්සෙ සූදු කෙළින
සවස පටන් එළිවනතුරු
අනුන්ගෙ පොල් හොරා කඩන
කුසගින්නේ අඹුදරුවන්
ගෙයි තැන තැන වැටී නිදන
මොවුන් උපන්නේ මොකටද
මුළු රටටම කරනා විණ[25]

සමාජයේ අසාධාරණ කම් දැක - දැක කට පියාගෙන, නිසොල්මන්ව සිටීමට සබරගමුවේ ජනකවියාට නොහැකිවිය.

සමාජ අසාධාරණයට එරෙහිව නැගී සිටි අවස්ථාවද ජනකවියෙන් හෙළිවේ. අයුක්තියට හිස නමා ඊට යටත්විය නොහැකිව රටේ මහත්මයා ගෙන් ගම ආරච්චි කම ඉල්ලා අස්කරගත් යුක්තිගරුක සාධාරණ පුද්ගලයෙකු ගැන, තොතුරු හෙළිවන ජනකවි සබරගමුවේ ජනශ්‍රැතියට එක්වී ඇත. කුකුළු කෝරලේ එවැනි ජනකවියකි. මේ.

25. කුකුළු කෝරලේ ජනකවි 19 පි.

166. අනුන්ගේ කත් අරන් කාලා
අපට යුතුකම ඉඩ නොදෙනවා
තමන්ගේ මුළු බලය පෙන්නා
අපට නිතරම හබ කරනවා
අයුක්තට මට යටත් වෙනු බෑ
රටේ මහතගෙ වුනත් මේවා
ඔහුගෙ ගම ආරච්චිකම මම
ඔහුට දීලා අයින් වෙනවා[26]

රටේ මහත්මයා තමන්ගේ බලය, අනිසි ලෙස හා අයුතු ලෙස ගැමියන් කෙරහි පතුරුවයි. යුතුකමට, සාධාරණයට ඉඩ නොදෙයි. අසාධාරණය රජ කරවයි. අයුක්තියට සිය නමයි. අනුන්ගේ කත් අරන් කා යැපෙයි. මෙවැනි අයුතුකම් වලට යත්ව, ඒවා අනුභව කොට සිටීමට වඩා, ඊට පිටිපා යුක්තිගරුකව සිටීමට ගමආරච්චි මහතා කල්පනා කෙළේය.

අරපිරිමැස්ම නොවූ විට, පවුල් ජීවිත අසාර්ථක වන බව පෙන්වා දෙන සබරගමුවේ ජනකවියා එවන් පුවතක් සන්නිවේදනය කරමින් සමාජයට ආදර්ශයක් දෙයි.

හැඩහුරු රෙදි - චීත්ත - හොඳ කම්බා - පුස්ඹ සබන් හා පූයර වලට ආරච්චිගේ මුළු සේතම වැය වූ බව මින් පැවැසේ.

167. පරගල ආරච්චි වසම
ලැබෙගෙන මගෙ සිත සතුටින
සැපයෙන ජීවත්වීමට
බිරිය ගෙනා කරත් ගොඩින
හැඩහුරු රෙදි චීත්ත සහ
හොඳ කම්බා ඕන වුන
පුස්ඹ සබන් පූයර වලට
ඉවර උනා මාගේ දන[27]

26. කුකුළු කෝරලේ ජනකවි 20 පි.

27. කුකුළු කෝරලේ ජනකවි 19 පි.

අනුවේදනීය සමාජ තොරතුරු පවා සබරගමුවේ ජනකවියෙන් හෙළිවේ. පහත දැක්වෙන ජනකවියෙන් හෙළිවන්නේ නිල්හාමි නමැත්තෙකුගේ දුවට සිදුවූ විපතකි.

168. පලංගොමුවේ නිල්හාමිගෙ දුව
බිලිඳු වඩාගෙන ගඟට ගියේ
ගැඹුරු ජලේකට නාන්න බැහැලා
අමුණු කඳන්යට සැඟවි ගියේ
කෝරලෙ මැතිඳුත් - කෝරළෙ සෙනඟත්
ඇවිදින් මළ කඳ ගොඩ ගත්තේ
වකුටු කරපු අත දිග හැරියෙත් නැත
පණගිය මුත් ළමයා උකුලේ[28]

මෙම අනුවේදනීය පුවතම තවත් ජනකවි වලින් හෙළිවේ.

169. හල්වෙළියෙ ගම සිල්හාමිගෙ දුව
බිළිඳු වඩාගෙන ඔයට ගියේ
ගැඹුරු ජලේකට නාන්න බැසලා
අමුණු කඳන්යට සැඟවි ගියේ
එගොඩින් මෙගොඩින් සෙනඟ සිටිද්දී
යන්ඩ ඇරියයි ගැඹුරු ජලේ
වකුටු කරපු අත දිග හැරුනෙත් නැත
පණ ගොසිනුත් ළමයා උකුලේ[29]

පලංගමුව-කෝන්ගමුව හා හල්වෙළියේ යනුවෙන් ගම් තුනක සිදුවූ පුවතක් ලෙස "නිල්හාමිගෙ දුවගේ" විපත දක්වා ඇතත්, එය එකම පුවතක් බව පැහැදිලිවේ. මෙවැනි අවස්ථාවලදී ගැමියෝ එය තමන්ටම සිදුවූ විපතක් ලෙස සළකා දුක්වූහ.

කවියා මේ සන්නිවේදනය කරන්නේ දරුවා වඩාගෙන කළු ගඟට පැන දිවි නසාගත් ගැබිණි මවක් ගැනය. එය අහස - පොළව කම්පාකරවන අනුවේදනීය සිදුවීමක් විය.

---

28. සපරගමුවේ ජනකවි 109 පි.
29. සපරගමුවේ ජනකවි 109 පි.

170. අතින් එකයි දරු සාර මසයි මව
බිළිඳු වඩාගෙන දෙර සිටියේ
අහසත් ගුගුරා-පොළෙවත් දෙදරා
සිටි අඩියේ පය නොසෙල්වියේ
කල් බැදි අපටත්- දෙමව්පියන්ටත්
නොකියම මින්දැයි යන්ට ගියේ
කොට්ට පැදුරු නැත- ඇඳ ඇතිරිලි නැත
කළුකර වැල්ලේ නිදන් වුයේ[31]

වැඩිහිටියන්ට උසුළු විසුළු පෑමත්, තවට කම් කිරීමටත්, නොදුසුය. වයස අවුරුදු අනූවක් තරම් වන කෙනෙකුට නාඹර තරුණියක විසින් කරනු ලබන අපහාසය විඳගත හැකිවන්නේ, මෙවැනි නවයට බින්දුවක් එක්කළ වයස ඇති හික්මුණු වැඩිහිටියෙකුට පමණි. ඔහු ඒ ගැන උරණ වූයේ නැත. තම වයස පමණක් සඳහන් කොට කරබාගෙන ගියේය. මේ සබරගමුවේ ජනකවියෙන් ලැබෙන හොඳ උපදේශයකි.

171. සිටිනා කළ කඩේ මම පංසල ගාවා
නැඹුල් තරුණියක් ගහ බැහැලා නැවා
මගේ වයස නවයට බිංදුව ආවා
ඒ හින්ද මමත් කරබාගෙන ආවා[32]

නාකි කමට කරබාගෙන ගිය මුත්, තරුණියකුට උසුළු විසුළු පෑම ඇස් රතුවීටම කරුණක් වෙයි. මේ සබරගමුවේ ජනකවියෙන් හෙළිවන එවැනි අවස්ථාවකි.

172. නාන්නට ගියෙමි මම පරගල ගඟට
ගැණු රැළක් පිරිලා ඒ තොටුපලට
මුණු බල බලා උන් සිනා උනිය මට
මනමාලයෙක් නොවෙයි මම ආ තොපි වෙතට[32]

31. සිංහල ජනකවි සංග්‍රහය ii 144 පි.
32. රත්නපුරේ ජනකවි 29 පි.
32/1 කුකුළු කෝරළේ ජනකවි 19 පි.

තරුණයාට නම් කරබාගෙන සිටීමට නොහැකි විය.

සමාජයේ පවතින නැන්ද හා ලේලි අතර ඇතිවන හබය නිරූපනය කෙරෙන ජන කවිද සබරගමු ජනකවි අතරින් හමුවේ. හාල් සහ වී හොරෙන් ගැනීම විශාල පවක් ලෙස ගැමියා අදහයි. නැන්දම්මා විසින් ඉතා දුකින් සපයාගනු ලැබූ හාල් ටික ලේලිය සොරෙන් ගැනීම නොහොබිනා කාරියකි. බතේ රස දැනෙන්නේ අපායේදී බව කියා නැන්දම්මා සිත තුනී කරගත් මොහොතකි මේ.

172. ඉතා දුකින් සපයාගත් හාල් ටික
ලේලී හොරෙන් ගත්තේ මගෙ හාල් ටික
ඇතාවෙලාවත් බැරි ණය ගෙවනු දුක
බතේ රස දැනේ ලෝගුලි ගිලිනු දැක[33]

නව සංස්කෘතික පෙරළියකට හසුවූ ගැමි සමාජයේ පැවති අනුවණ කම් ද සබරගමු ජනකවියෙන් නිරූපණය කෙරේ. ගැමියන් බිත්තර-උම්බලකඩ වැනි දේ සිටුවා ඇති උපමා කතා ජනශ්‍රැතියේ එයි. රත්නපුරේ කලවාන ප්‍රදේශයේ ගැමියෙක් ලොසින්ජර පැල කළ බවත්, ඉන් පැලයක් ආ බවත්, දැක්වෙන්නේ මෙලෙසිනි. ඉන් ගැමියන්ගේ අනුවණ කම් රැසක්ම හෙළිවේ.

173. මුට්ටියකින් අමුඩ ගැසූ හපනා පරගල
ලොසින්ජරත් කලවානෙ දි සිටුවා පැල කළ
කෝදුරුවට කේඳිරි යයි කිව් නයියංගල
හබලපෙතිත් සම්බෝලෙට ගත් පනහැට ගල[34]

- තමන්ට ලැබෙන දේද සහෝදර සහෝදරියන් සමග බෙද හදගෙන නොකෑමේ සිරිත ජන කවියෙන්ද හෙළිවේ. වැඩිමහල් සහෝදරයාට නොදී මීපැණි කෑ මල්ලිගෙන් ජන කවියා මෙසේ ඇසුවේය.

---

33. රත්නපුරේ ජනකවි 25 පි.

34. කුකුළු කෝරළේ ජනප්‍රවාද 15 පි.

174. මීය කඩන්නට යනවා දැකලා
මී පැණි කන්නට උහිමි අනේ
මී පැණි කඩලා තැටි පුරවාලා
ළමයින් ඒ බස් දෙඩයි අනේ
කටින් නොකෑවට ඇසින් දුටුව කොට
මී පැණි බව නොදනිද අනේ
මගේ ගුණ සොඳ මල්ලියෙ තනියම
මී පැණි කෑ හැටි හොඳද අනේ[35]

මේ ජනකවිය පහත දැක්වෙන ආකරයටද සබරගමුවේ දී ඇසිය හැකිවේ. පහත දැක්වෙන කවියෙන් දැක්වෙන්නේ අයියා මල්ලිට නොදුන් පුවතකි.

175. මීය කඩාගෙන එනහැටි දැකලා
මමත් ගියා පැණි කන්න රසේ
තැටි පුරවාලා - දුම උඩ තියලා
ළමයින්ගේ බස් කියති ඇසේ
කටින් නොකෑවට ඇසින් දුටිමි මම
මී පැණි බව නොදනිත්ද කෙසේ
කුසේ උපන් මගේ එක හැටි අයියා
මී පැණි දුන් සැටි අඩනු තොසේ[37]

"කටින් නොකෑවට - ඇසින් දුටුව කොට" තමාට නොදී සඟවාගෙන කැමෙන් කළ දේ ඉවසාගෙන සිටිය නොහැකි වුවද "මගේ තුණ සොඳ මල්ලියේ" - "කුසේ උපන් මගෙ එක සැටි අයියා" යනුවෙන් කෙරෙන ආමන්ත්‍රණ පද වලින් හෙළිවන්නේ තවමත් සහෝදරයා කෙරෙහි තමා තුළ උපන් ආදරයයි. ඇල්මයි.

මේ ආකාරයේ සමාජ තොරතුරු රැසක් සබරගමු ජනකවියට එක්වී ඇත.

---

25. සපරගමුවේ ජනකවි 162 පි.

36. රත්නපුරේ ජනකවි 26 පි.

# සබරගමු ජනකවියෙන් හෙළිවන ග්‍රාම නාම ආශ්‍රිත ප්‍රාදේශීය තොරතුරු

# 6

ජනකවියා තමා ජීවත්වූ පරිසරයේ ග්‍රාම-නාම සහ ඒ ආශ්‍රිත තොරතුරු සන්නිවේදනය කරන්නෙකි. තම සිතුම් පැතුම් අන්‍යයන්ට පවසන ජන කවියා, තම ගම්මානය හැදින්වූ ග්‍රාම-නාමය ද ඊට ඇතුළත් කරයි. තලමලේ කවි බොහොමයකම මෙම ලක්ෂණය විද්‍යමානවේ. තලමල පිළිබඳව තමා ලැබූ චමත්කාරය හා වින්දනය සමගම එම මල හටගත් ගමේ නම සඳහන් කර ඇත. මේ අතර සාමාන්‍ය තොරතුරු රැගත් ජනකවි රැසක් සබරගමුවේ ජනකවියේ විෂය ක්ෂේත්‍රයට එක්වේ.

කිසිම තොරතුරක් නොමැතිව, ග්‍රාම-නාම පමණක් දක්වා නිහඬ වූ අවස්ථා ද ජන කවියෙන් හෙළිවේ. මේවා බොහොමයක්, ගැල් කරුවන් විසින් තමන් ගමන්ගත් මාර්ගය හෝ ගමනේදී පසුකළ හා රැකුම්ගත්, ලැගුම්ගත් විශේෂ ස්ථාන දැක්වීම සඳහා ගෙතූ සීපද විය හැකිය.

176 කුට්ටා පිටිය - දෙනවක - පැල්මඩුල්ලා
හුනුවල -ඕපනාකේ - උතුමන්ඇල්ලා
දෙරවක- බුලත්ගම - පඹදෙණියේ මුල්ලා
සකිසඳ ඉඹුල්පේ - දෙනගමපිල්ලා [1]

එහි 'සකිසඳ' යන වචනය හැර අනෙක් වචන වලින් ග්‍රාම -නාම හෙළිවේ.

177. රඹුක - බෝපිටිය වැව- දෙල්ගොඩ ගමට
යටියන - කෙසෙල්වතු - පොතුපිටි කොළොන්නට
හනුගොඩ - පැලවත්ත - මොරවක් කෝරළෙට
මෙකියන මේගම් සහ පරවෙණි මදි තොපට [2]

---

1. රත්නපුරේ ජනකවි 34 පි.
2. කුකුළු කෝරළේ ජනකවි 17 පි.

178. වවාපතද - පොරෝණුව - මාවතපල්ල
යවාගරද - ඔතනද - හොරහිත් ඇල්ල
ගසා බෙර දවුල් හොරණෑ එක එල්ල
නටා ජල බසින මහ රත්දෙව ඇල්ල [3]

179. එල්ලාවලද අකුරණ මාවුවාගල
හාත්දුකකණ්ද - කිරිඇල්ලද - ඉඩංගොව
කොට පිටි ගෙදර - ගලතුර- ගම්මැද්දගොඩ
අරඹේ ගමට උඩුගල සකිය පරගල [4]

මගින්ට ප්‍රයෝජනවත් වූ ඇල්ල - පිල්ල සහ වැව ගැන පමණක් එහි නාමමාත්‍රමය සඳහනක් වෙයි. එහෙත් සමහර ජනකවියක ග්‍රාම-නාමය සැදුණු ආකාරය පවා දැක්වේ.

180. එක වී ඇටය එක්වී පදුරක් විය
එක වී පදුර එක්වී නැළියක් විය
එක වී නැළිය එක්වී නැළිගොඩ විය
ඒ නැළිගොඩට එක් නැළි ගොඩ නම් විය [5]

සබරගමුවේ වාසය කළ අන්තිම වැද්ද "වැද්දගල" නමැති ගමේදී අල්ලාගෙන, ගලෙක තබා දඬු ගසා මැරූ ආකාරයද ජනකවියට විෂය වී ඇත. මෙසේ මරණයට පත්කෙළේ ඔහුගේ දරුණු කම නිසාය. එම ප්‍රදේශය වැද්දගල නමින් ප්‍රකට වූයේ ඉන්පසුවය. එම විස්තරයට අමතරව, වැද්දගල සුව පහසු ඇති ගමක් වූ බවද ජනකවියා කීවේය.

181. වැද්ද කළ දරුණු කම බැරුව ඉවසුම
විද්ද ගලක් දඬු ගැසූ මැරෙනා තුරුම
ලද්ද එයින් නම පවතී දන සැබොම
වැද්දගල සොඳයි සුව පහසු ඇති ගම

---

3. රත්නපුරේ ජනකවි 1 පි.
4. රත්නපුරේ ජනකවි 08 පි.
5. රත්නපුරේ ජනකවි 34 පි.
6. කුකුළු කෝරළේ ජනකවි 06 පි.

රජකෙනෙකු සැඟවී සිටි ස්ථානයක් සේ සැළකෙන වැද්දගල ගමේ පිහටි රජුවත්ගල පිළිබඳ තොරතුරු ජනශ්‍රැතියේ දැක්වේ. රජ උන් ගල රජුවන්ගල විය.

182. ඇවිදින් රජතුමෙක් යුදයෙන් පැරැදෙමින
විසුවෙන් වැද්දගල ගල් ලෙනක සතුටින
රජුවත්ගලය නම පැවැතිය දන එයින
එවදන් පහල විය අද තෙක් සිට එදින [7]

තිකගොඩ-හිටිගේ-කුකුළේ සහ රඹුකේ යන ගම්මාන වල, ප්‍රසිද්ධියට පත්වූ පුද්ගයින් සිව් දෙනෙක් ගැන මේ ජනකවියෙන් තොරතුරු හෙළිවේ.

183. අහසට ගුරු කවුද තිකගොඩ ඇඩිරාළ
පොළවට ගුරු කවුද හිටිගේ ලොකුරාළ
නුවණට ගුරු කවුද කුකුළේ කපුරාළ
ජීවිත රැක දෙන්ඩ රඹුකේ වෙදරාළ [8]

කපුරාළ ගෙන් හා වෙදරාළගෙන් ගැමියන්ට පිහිටක් වන්ට ඇත.

සතර වටින් කඳු වලින් වටවී තිබූ කරදන නමැති ගම්මානයට නිතර-නිතර වැසි ලැබේ. මෙම වර්ෂාව නිසා ඇතිවන ගං වතුරෙන් ප්‍රදේශය ඉමහත් හානි පැමිණෙන බව ජනකවියෙන් හෙළිවේ.

184. සතර වටින් කඳු ඇති කරදන ගමට
නිතර වැසි වසී රට වැනසෙන ලෙසට
පතර පෙර කරපු පව් පළදුනි අපට
මෙවර පිං කරමු මතු සැප ලබන්නට [9]

කුකුළු කෝරළයට එම නම ලැබී ඇති බව දැක්වෙන ජනකවියෙන් හෙළිවන ඓතිහාසික පුවතක් පළමුවන පරිච්ඡේදයේදී

7 කුකුළු කෝරළේ ජනකවි 6 පි
8 කුකුළු කොරලේ ජනකවි 17 පි
9 කරදන 04 පි

සාකච්ඡා කෙළෙමි. කුකුළු කෝර්ළයට එම නම ලැබී ඇත්තේ ප්‍රදේශය තුළ වූ භූමි පරිසරය නිසා බවද, කුකුළු කෝර්ළේ පරිසරය කුකුළකුගේ හැඩය ගෙන තිබෙන අයුරු ද මෙම ජන කවියෙන් හෙළිවේ. තමා ජිවත්වන භූමි පරිසරය පිළිබඳ ගැමියාගේ විඥානය මෙයින් හෙළිවේ. කඳු-හෙල්-ගංගං හා පර්වත පිහිටි ආකාරයත්, එහි හැඩරුවත් අනුව සංකල්ප රූප මවා ගැනීමට ජන කවියාට හැකි විය.

උසට පෙනෙන බෙරගල කඳු මුදුන කරමලය වැනිය. දෙපස ගලායන ගංගා දෙක දෙකකුල් වැනිය. එහි ඇති දුනු කෙයියාගල පෙදය වේ. සන්දේශ කවීන් පරිසරය දුටු ආකාරයටම ජන කවියාද පරිසරය දුටු ආකාරය මෙම ජන කවියෙන් හෙළිවේ.

185. උසට පෙනෙන බෙරගල සිරස කරමල
දෙපිට දෙපිය යුග වැනි විය දෙකඳු පෙල
රුවට ගලන ගංගා දෙකය දෙකකුල
එවිට පෙදය මෙහි සකි දුනුකෙයියගල[10]

මෙසේ පරිසරය හා භූගේලිය පිහිටීම නිසා කුකුළු කෝර්ළය, කුකුළාගේ හැඩයගත් ආකාරය සංකල්පරූප සහිත පරිසර වැනුමකින් ජනකවියා ඉදිරිපත් කරයි.

බලන්ගොඩ - ගැල්කරුවන්ට නැවැති සිටීමට සුදුසු ස්ථානයක් විය. ඇඟපත තිවාගැනීමට, දිය ඇදහැලීම සහ කෑමට පළාකොළ තිබීම නිසා බලංගොඩ ගම්මානය ගැල් කරුවන්ට නැවතී සිටීමට සුදුසු ස්ථානයක් විය. මෙවැනි තැන් ගැල් කරුවන්ගේ 'ගාල් පොල විය. 'ගොංගාලේගොඩ' - 'ගාල ගාව' - 'ගාල් තැන්න' - 'ගාල්ල' වැනි ග්‍රාම - නාම ඇතිවූයේ ගාල් පොලවල් ආශ්‍රිතවය. ප්‍රධාන ගාල් පොලවල් ගැන තොරතුරු සබරගමු ජනකවියෙන් හෙළිවේ.[11]

---

10 කුකුළු කෝර්ලේ ජනකවි 22 පි

11 i. ඇදපන් ගොනෝ විගසින් ගාල ගාවට - මාතලේ ජනශ්‍රැති 30 පි
ii. කළු කැලේ ගාලෙ නොලිහා වද දෙනවා - මාතලේ ජනශ්‍රැති 31 පි
iii. ගොහින් ලිහන් ගින්තොට නැන්දගෙ වත්තේ
iv. ගොහින් ලිහමි මොරතොට නැන්දගෙ වත්තේ - සබරගමුවේ ජනකවි 114 පි

186. ජඃ පිවමඃ කියා හැල්රිය දක්කනවා
නිදිමත යන්න කවි සීපද් පවසනවා
බලංගොඩ ගාල ඉදිරියෙ හමුවෙනවා
ඇදපන් ගොනෝ එතැනදි නිදහස දෙනවා[12]

187. පෙට්ටිගල හොඳයි පෙට්ටියකට ගන්ඩ
දිය කඳ ඇද හැලෙයි ඇහපත නලවන්ඩ
පළාකොළ තිබෙයි කෑමට මලවන්ඩ
බලංගොඩ හොඳයි දිගටම නවතින්ඩ[13]

පැල්මඩුල්ල-විහාරය ගැන ජන කවියා කරන විස්තරය ඉතා අගනේය. එය "දිව්‍ය ලෝක දහසයෙන් එකක්" බඳුය'යි ජනකවියා කියයි. දිව්‍ය ලෝක ඇත්තේ හයකි. දහසකයක් ඇත්තේ බ්‍රහ්මලෝකයි. ජනකවියා ඒ ගැන එතරම් කල්පනා නොකළා සේය. විහාරයේ මහිමය ඔහුට දැක්විය හැකි වූයේ කවියා අත් නොදුටු දිව්‍ය ලෝක ගැන මහත් ඉහළින් වර්ණනා කිරීමෙනි. ඔහුට අවශ්‍යවූයේ පුදුම නිර්මාණයක් බව දැක්වීම පමණි. තොරණ - දෙරටුපාල රූප හා රන් කොත ජනකවියාගේ විශේෂයෙන් සිත්ගත් නිර්මාණ විය. කෙසේවෙතත් මෙම විහාරය නිසා පැල්මඩුල්ල ග්‍රාමය ජන හදවත් ඇදබැඳ ගත් ආකාරය ජන කවියෙන් හෙළිවේ.

188. පැල්මඩුල්ල ලඟ තැනෙවූ විහාරය
දිව්‍ය ලෝක දහසයෙන් එකයි
සතර වටේටම ලැලි සේත්තු අල්ලා
මකර තොරණයෙන් ආසනයයි
දෙරටුපාල දෙව් කඩුවක් අරගෙන
නයි දරණේ පිට සැතැපෙනවයි
සින්දුව කීවට වස් නැත දෙවියනි
ඇතට රන්කොත දිළිසෙනවයි[14]

---

12-13 සපරගමුවේ ජනකවි 116 පි
14 සපරගමුවේ ජනකවි 70 පි

මෙම සිපදය ජනශ්‍රැතියේ මෙසේද දැක්වේ. ඉන් ඍනාවරණය වන්නේද පැල්මඩුල්ලේ විහාරයේ අරුමයයි.

189. පැල් මඩුල්ල ලඟ තැනෙව් විහාරය
දිව්‍ය ලෝක දහසයෙන් ඒකයි
සතර වටේට ලැලි බෝක්කු අල්ලා
මකර තෝරණයට ආසනයයි
සුද්ද වංසයෙන් නාගයො දෙදෙනෙක්
බන්දනයට ඉඳ සැරසෙනවයි
සිංදූව කිව්වට වස් නැත දෙවියනි
ඇතට රත්කොත දිළිසෙනවයි[15]

සිව්පද දෙකේම තුන් වැනි පාදයෙන් කියැවෙන්නේ දෙරටුපාල රූප දෙක ගැනයි.

මාරපන විහාරය ගැන කෙරෙන ජනකවියාගේ විස්තරයද අගෙයි. දෙරටුපාල රූප දෙක හා මුචලින්ද නාගරාජයා සහිත බුදු රුව ඉන් විස්තර වෙයි.

190. දෙරකඩ දැලේ අහනෝ දෙන්නෙක්
රත්කලයක අත තියාගෙනෝ,
එමගේ ඇතුලේ බුදුරජු වැඩලා
නාගදරන හිස තියාගෙනෝ
ඉර-හඳ දෙදෙනත් සෙනග සමග වී
නැඳුන් උයනෙ සිට බලා ගෙනෝ
වස්නැත දෙවියනි සින්දුව කිවට
තැනූ විහාරය මාරපනේ[16]

සබරගමුවේ මහ සමන් දේවාලයේ ලියලන ගලක් ගැන තොරතුරු ග්‍රාම-නාම ආශ්‍රිත ජනශ්‍රැතියේ පවතී. ජනකවියා ද එය මෙසේ කියා ඇත.

15 රත්නපුරේ ජනකවි 28 පි
16 රත්නපුරේ ජනකවි 21 පි

191. කුරුවිට කෝරලේ - පල්ලේ පත්තුවෙ

උතුම් සබරගමු දේවාලේ
දවසින් දවසට ලියලාගෙන එන
ගලක් තිබුණා කිවි මැද මාලේ
ලොව සතහට මත්තට පවතින්නට
සුමන දෙවිඳු පැවාද බලේ
ඔය ගල සකියනි තව ලියලනවද
උතුම් සබරගමු දේවාලේ[17]

කැටන්දෙල-දෙනිපිටිය වෙලේ අමුණු තිහක් වපුරා වී පැසුණු මහිමය ජනකවියා මෙසේ දුටුවේය. ඊට ජල පහසුකම් ලැබුණේ කැටන්දෙල අමුණ මගිනි මෙයද ජනකවියාගෙන් ලැබුණු ග්‍රාම-නාම ආශ්‍රිත ජනකවියකි.

192. ඇලකි දෙලකි ඇල කඳුලකි පෙකුණකි
අමුණ බලන් සකි කැටන්දොලේ
මැකී රොනකි මලපිට යන බමරෙකි
වදින රුවකි දිය පිට ඇල්ලේ
නමකි, ගමකි නායක විසිහතරකි
අමුණු තිහක් වපුරාය වෙලේ
දනට පිනට කුසලට සුර විමනකි
පැසුනු මහිම දෙනිපිටිය වෙලේ[18]

නාය යාමකින් මාදෙල ගමේ පාලම විනාශයට පත්වූ ආකාරය ද ජනකවියාගේ මතකයට නැඟුනේ ය.

17 රත්නපුරේ ජනකවි 23 පි
18 රත්නපුරේ ජනකවි 28 පි

193. පෙට්විගල සිටන් නායක් ඇවිදින්
මාදෙල ගඟ මැද හරස් උණේ
දවසින් දවසට වැසි තදවීමෙන්
දෙගොඩ දෙකේ ගංගා පිරුණේ
තදින් ජලය ගෙන තෙදින් වදිනකොට
දෙගොඩ දෙකේ ගල ගැලවී වැටුණේ
බලන් රුසිරි මාදෙල පාලම
ගං වතුරෙන් වද පාඩු උනේ[19]

මාදෙල පාලම විනාශවීම පිළිබඳ පුවතම ජනශ්‍රැතියේ මෙසේද දැක්වේ.

194. පොලව යටින් තද පතුරන්නාසේ
වැස්ස වහින්ට පටන්ගති
දවසින් දවසට වැසි තද කරලා
හෙනක් ලෙසට වෙඩි පුපුරවති
පෙට්විගලේ සිට නායක් ඇවිදින්
මාදෙල ගම මැද හරස් උනේ
මැයි මාසේ දින දහත්වෙතිද
ගංවතුරෙන් රට පාලු උනේ[20]

මෙහි මාසය හා දිනය සඳහන්වුවද වර්ෂය සඳහන් නොවීම මහත් අඩුවක් විය.

බඹර කොටුව ප්‍රදේශයේ සිදු වූ නායයාමක් ගැන ද ජනකවියේ සඳහන්වේ.

19 සපරගමුවේ ජනකවි 162 පි
20 සපරගමුවේ ජනකවි 100 පි

195. ගිගිරිනාද ලෙස ගලා බ්සින දිය
 බඹරකොටුව ගහ නැළවිල්ලේ
 මිහිරි එළිය බොර දියට හැරීගෙන
 දිනෙන් දිනට එනවද රැල්ලේ
 නොසිතු ලෙසට ගියෙ නාය ගලායන
 නායවලට සකි එක එල්ලේ
 එදිරි උනාදෝ පොලවේ මිහිකත
 බිඳීගියේ බිම නොව මෙල්ලේ[21]

මල්වල සිට පැමිණි හිවල් රැලක් කුඩාව දී නිල්වල කංකානම්ලගෙ ඩිංගිරිහාමි නමැත්තෙක් විසින් විනාශ කළ බවක්, මේ ජනකවියෙන් හෙළිවේ. එම අපරාධය සිදුවන්නට ඇත්තේ කැලෑව ගිනිලෑමෙන් විය හැකිය. ජනකවියා සිහිකරන්නේ කුඩාවේදී සිදුවූ එම අපාරාධය ගැනයි.

196. මල්වල සිට හිවල් රැලක් ඇවිත් කුඩාවට
 කල්බැඳ උන් පදිංචියට ගියෙ වන හපුවට
 හිවල කංකානම්ලගෙ ඩිංගිරි හාමිට
 එය කළ අපරාදෙ නිසා හෙන දෙයි ඔලුවට[22]

ඇරැපොල සිටින නෝනා නමැත්තිය බැනුමට පහත්කම් ඇත්තියකි. ඇය යමරජුගේ අම්මා වැනිය. ඉවසා සිටීමට නොහැකිවන තරමට බැනීමට ඇය පහත්තියකි. යමරජුගේ මවට සමාන වූයේ එබැවිනි. ජනකවියා 'නෝනා' කළු යකුට භාර කෙළේය.

197. ඇරැපොල සිටින නෝනා යන තරුණී
 දරාගන්ට බැරි ලෙස බැනුමට හපනී
 තිරා දෙර සිටින යම රජුගෙ මව් වැනී
 මරා කාකො කළුයකු තෝ මේ ගැනී[23]

---

21 රත්නපුරේ ජනකවි 03 පි
22 රත්නපුරේ ජනකවි 25 පි
23 රත්නපුරේ ජනකවි 29 පි

'මඩගම්මන - ආරියකුල වූ සුවිනිත තරුණියට ආශිර්වාද වේවා!' ජනකවියාගේ පැතුම වූයේ එයයි. සපරගමුවේ ජනකවියා ගැහැණියගේ හොඳ හා නරක දෙකම දැක, එය සමාජයට හෙළිකළ අවස්ථා හිඟ නොවිය. එය ග්‍රාම-නාමය සමගම හෙළි කොට ඇත.

198. ආරිය කුල වඩන මඩගම්මන ගෙදර
සූරිය පැව්වා වැනි සුවිනීත හර
මේලිය මන ගොසින් ආසිරිවාද කර
දීපිය අප්පුහාමිට හෙළ උඩ ගෙදර[24]

හෙළ උඩ ගෙදර අප්පුහාමි ඉතා විනිත තරුණයෙක් වන්නට ඇත. ඇයට සුදුසුවූයේ ඔහුමය. ඊට ජනකවියාගේ ආශිර්වාදය ද ලැබුණි.

රා නිෂ්පාදනය හා සුරා පානය ගැන ප්‍රසිද්ධ ගම්මාන තුනක් පිළිබඳව තොරතුරු සබරගමුවේ ග්‍රාම-නාම ආශ්‍රිත ජනකවි වලින් හෙළිවේ. මොට්ටැව - කුරුවිට හා එරත්න යන ගම්මාන පිළිබඳ තොරතුරු ඉන්-අනාවරණය වේ.

199. අවසක් ගීයෙමි මොට්ටැවේ රා බොන්ඩ
ගස්යට තිබුණි ගොටුවක් පොද වැගිරෙන්ඩ
බිව්වා බැරිත් ලෙස ආපසු ඒ ගන්ඩ
මැරුණත් නෝයිමි මොට්ටැවේ රා බොන්ඩ[25]

200. දසබල පියාණනි සම්බුදු තථාගත
ඔබෙ ආගමත් ගුණ දහමත් මෙහේ නැත
කලමුල් දමා රා විකුණන දනෝ කැත
කුරුවිට එරත්තේ ගඟබඩ ගමේ ඇත[26]

රක්වානේ පාරේ තිබූ විශාල කටු උණ පඳුරක් පිළිබඳ තොරතුරු මේ ජනකවියෙන් හෙළිවේ.

---

24 රත්නපුරේ ජනකවි 29 පි
25 රත්නපුරේ ජනකවි 56 පි
26 රත්නපුරේ ජනකවි 56 පි

201. රක්වානට මම යන්ට යන කොට
    කටු උණ පඳුරක් තිබුණිය පාරේ
උණ පඳුරේ වට මතිමු සීතාගෙන
    පැයක් පමණ පසු උනි පාරේ
නතර වෙලා මම බලාන උන්නත්
    යන්න තැනක් නැත මහ පාරේ
මෙච්චර ලස්සන කටු උණ පඳුරක්
    තිබුණේ රක්වානේ පාරේ[27]

සබරගමුවේ දිය ඇලි පිළිබඳ තොරතුරු දැක්වෙන ග්‍රාම-නාම ආශ්‍රිත ජනකවිද රැසක් වේ. මාපතාන සහ අලුපොල දිය ඇලි නිසා ප්‍රසිද්ධියට පත් විය.

202. සමන්ගිරට යට දෙසින් වැටුණු ගඟ
    ගොසින් එමුහුදෙන් නිම දකිනා
ගිගුම් දෙමින් රළ වැටෙයි තැනින්තැන
    අකුණු හඬින් ගුගුරන ලෙසිනා
කියන්ඩ විස්තර වෙනින් කෙනෙක් නැත
    මිහිකත දෙව් මිස මුළු දෙරණා
බලන්න ලස්සන මාපතානෙ දිය
    ඇල්ල තමයි දෙව් ලොව වටිනා[28]

එහි දිය කඳ ගිගුම් දෙමින් අකුණු හඬින් ගුගුරා හැලෙන බව ජන කවියා කියයි.

අලුපොල ඇල්ලේ දිය රැල්ල වැටෙන විට අහසට දුම්මල් විසිරේ.

27 රත්නපුරේ ජනකවි 29 පි
28 රත්නපුරේ ජනකවි 29 පි

203. නිවසේ මුලසිට ජලකඳ එනවා
ඒ මත ජල කඳ එක එල්ලේ
ඇල්ල උසක් දෝ වල ජඹුරක් දෝ
කොයි හැටියක් දෝ නෑ තිල්ලේ
ඇල්ල උඩින් දිය රැල්ල වැටෙන කොට
අහසට දුම්මල් විසිරිල්ලේ
වසවතු යුදයෙන් පැරැදී එනද
නැව තැනක්දෝ අලුපොල ඇල්ලේ[29]

කොළඹ-මහනුවර පැරණි රජ මාවත 1924 දී නුවර මාර්ගය තැනීමත් සමග අභාවයට ගියේය. එහි සතර කෝරළයට අයත් කොටසක ග්‍රාම-නාම සඳහන් වන්නේ මෙසේය.

204. මදුරාදෙණිය ද ඉද්දමල්පානේ පසුකර යන
අමුණුගොඩ හින්නෙත් එතලේවෙල යන ගම් පසුකරවන
හෙට්ටිමුල්ල අමුණුගල්ල දිවෙලගම පෙර හමුවන
වාකිරිගල ගලතර පාට්ටගම ඊළඟ පැමිණෙන.[30]

කෑගල්ලේ උස්සාපිටියට නොදුරු ගම්මානයක් වූ "ලෙව්කේ" නමැති ගමේ, සුප්‍රකට ලෙව්කේ මැතිඳු ඉපදී ඇත. එතුමා නිසා එම ගම්මානයට ප්‍රසිද්ධියක් ලැබුණි.

205. පුන්සඳ සේම පායාලා රට මැද්දේ
රන් කෙඳිසේම පීරාලා පිට මැද්දේ
මාර සෙනඟ වට කෙරගෙන යම යුද්දේ
ලෙව්කේ මැතිඳු අද තනියම යම යුද්දේ[31]

සමනළ කඳු මුදුනට ගිය විට දර්ශනයවන ගම්මාන ජනකවියට ලක්වී ඇත. මෙම ජනකවි වලින් සබරගමුවේ ග්‍රාම-නාම රාශියක් හෙළිවේ.

---

29 රත්නපුරේ ජනකවි 22 පි
31 සතර කෝරළේ 56 පි
31 සතර කෝරළේ 61 පි

206. රත්නපුරා පෙදසද ඒ පොත් ගුල
ඇලපාත ද බටුගෙදර පෙනේ
කැටත්දෙල පැල්වාඩිය සමගින්
පැල් මඩුල්ල කහවත්ත පෙනේ
කුරුවිට කරුඟහ දෙමෝදරද තව
දුම්බර ඇල්ලද හොඳින් පෙනේ
ඇහැලියගොඩ හා පහත බුලත්ගම
පතාවලද ගම් සොඳින් පෙනේ[32]

207. පරකඩුවද පුස්සැල්ලද මීපිටි
නන්දෙ නොයෙක් ගම් එමට පෙනේ
බඩගම්මන හා බටත්ගලද තව යෝධ මහල්
ගස් ළඟද පෙනේ
ඉස්මාලේගම - මොරතොට - ඇල්ගොඩ
මහා නියංගම් හොඳින් පෙනේ
සිතුවක්ඔය හා ගැටහැත්තේඔය
තුම්මෝදර හොඳට පෙනේ[33]

208. මැණික්කන්ද හා හිඟුරලකන්ද ද
නාහැල්මේ ලොකු කන්ද පෙනේ
අතිත් අතට බැලුවම මල්දෙනිය ද
මාලිගාව තැනු කන්ද පෙනේ
බස්නාහිර ඇති යහකටුවාව ද
කොබෝතුරු මහ ගලද පෙනේ
තල්දුව ද සීතාවකද නොයෙක් ගම්
නුගහාමිත්තේ වෙලෙද පෙනේ[33]

32-33 සපරගමුවේ ජනකවි 97 පි

209. දැරණියගල හා උඩගේතේකන්ද ද
 නාවෙල මීගස්තැන්න පෙනේ
 පාතවත්තු යටියන්තොට සමගින්
 කරවනැල්ල මහ කොටුව පෙනේ
 අයිගල මාපිටිගම ද නොයෙක් ගම්
 මොරවත්තේ මායිමද පෙනේ
 එක්තැලිගොඩ මහ වලව්වෙ වත්තද
 කෑගලු මාවත හොඳට පෙනේ[34]

රත්නපුරේ සිට නිවිතිගලට යන මාර්ගයේදී හමුවන ග්‍රාම-නාම රාශියක් ඇතුළත් ප්‍රහේලිකාවක් නොහොත් තේරවිල්ලක් බඳු ජනකවියකි මේ.

210. ඇස් නැති දෙළකි අතපය නැති බොකු පහකී
 නොඉඳුල් බතකි වරපට අදිනා ගමකී*
 කුඩ මසු කැටිය පාතට අදිනා ගමකී
 සාස්තර පරුවතේ එතනම ඔන්න සකී[35]

එහි දැක්වෙන පදවලින් පහත දැක්වෙන තේරුම් ලැබේ

| | | |
|---|---|---|
| ඇස් නැති දෙළ | - | කණාදෙළ |
| අතපය නැති බොකු පහ | - | කොටා මුල්ල |
| නොඉඳුනු බත | - | අමුවල |
| වරපොට අදිනා ගම | - | හත් ගමුව |
| කුඩමසු කැටිය | - | මගුරුගොඩ |
| පාතින්යන ගම | - | පාතගම |
| සාස්තර පරුවතේ | - | නිවිතිගල |

සමනළ වන්දනාව අතර මගදී නැඟින්තේ පසු කළ යා යුතු ආකාරය වන්දනා කරුවන්ගෙන් කියවුණි

34 සපරගමුවේ ජනකවි 98 පි
35 රත්නපුරේ ජනකවි 52 පි
* කුඩමසු කැටිය සහ පාතින් යන ගමකී
 ජනකවි සාහිත්‍ය 197 පි

211. මේ යන්නේ වඳිනට අපි සමනළ
දෙවියන්නේ පිහිටයි නිති හැම කළ
සිහිවන්නේ බුදු ගුණමයි සිත තුළ
නැහින්නේගොඩ පඳුකර යමු බල[36]

කතරගම වන්දනාවේ යන බැතිමතුන් රත්නපුරේ සිට මඩුවන්වෙල හරහා යායුතුවිය.

212. රුවින් එම දිළෙන මඩුවන්වල පියසින්
නුවන් අමා දකුණේ මාවතේ ගොසින්
ගිමන් නිවා බෝරුක දැකලාම නෙතින්
ගමන් ගතිය කදිරාපුර දෙවි පිහිටෙන්[37]

මේ ආකාරයෙන් සබරගමුවේ ජනකවි වලින් ග්‍රාම නාම රාශියක තොරතුරු හෙළිවේ.

---

36 රත්නපුරේ ජනකවි 07 පි
27 රත්නපුරේ ජනකවි 09 පි

# ගැමි ජනවිඥානය හෙළිකරන සබරගමුවේ තේරවිලි සිවිපද

7

තේරවිලි සිවිපද මුළු දිවයින පුරාම ව්‍යාප්ත වී ඇති ජනශ්‍රැති විශේෂයකි. එකම තේරවිලි සිවිපදය හා පිළිතුරු සිවිපදය දිවයින පුරාම ව්‍යාප්ත වී ඇත. මේ නිසා සබරගමුවේ ජනශ්‍රැතියට එක්වී ඇති තේරවිලි සිවිපද වල විශේෂත්වයක් දැකිය නොහැකිය.

පහත දැක්වෙන්නේ 'බඹරකවි' වර්ගයට ඇතුළත් කළ හැකි තේරවිලි සිවිපදයකි මෙම තේරවිල්ල ඉදිරිපත් කිරීමේදී හා ඊට පිළිතුරු නිර්මාණයේදී ජනකවියා තුළ වූ විඥාණය පැහැදිලිවේ.

213\. කැලේ සිටන් මහ සෙනඟක් ඇවිදින්
ගලේ කොටුව බැඳගෙන සිටිති
බලේ හපන්කම් ඇති අය ඇවිදින්
මරා දමා බඩු අරන් යතී
කලේ අනාඩුවයි බඩු මොකවත් නැත
කැමට තිසි දෙය අරන් යතී
මලේ මේක තෝරා බැලුවෝතින්
මිහිරි දෙයකි කවුරුත් කැමැති [1]

මේ සිවිපදය අසන්නාට තොරතුරු රැසක් ලැබේ.

- කැලේ සිටන් මහ සෙනඟක් ඇවිදින්
- ගලේ කොටුව බැඳගෙන සිටීතී
- බලේ හපන්කම් ඇති අය ඇවිදින්
- මරා දමා බඩු අරන් යතී
- කලේ අනාඩුවකි
- බඩු මොකවත් නැත
- කැමට තිසිදෙය අරන් යති.

---

සපරගමුවේ ජනකවි 127 පි

එම සිදුවීම් කිහිපය ගැන අසන්නාට හැඟෙන්නේ මේ සිද්ධිය සොර කල්ලියක් පැමිණ සිදු කළ කලබලයක් බවයි . මරා දමා බඩු පැහැරගෙන ගොසිනි . මෙයින් අසන්නාගේ අවධානය වෙනත් අතකට යොමුවේ. ජනකවියා ඉන් පසු කිසියම් හෝඩුවාවක් ලබා දෙයි. ඉන් පසු අසන්නා වෙනත් අතකට යොමු වෙයි .

- "මලේ මේක තෝරාබැලුවොත්
- කවුරුත් කැමට කැමැති
- මිහිරි දෙයකි"[2]

යන අවසන් පදයෙන් ලැබෙන හෝඩුවාව අනුව මින් කියැවෙන්නේ කෝලාහලයක් ගැන නොව, කැමට ගන්නා මිහිරි දෙයක් බව අසන්නාට දැනේ . තේරවිල්ල ඉදිරිපත් කරන්නාත් අසා සිටින්නාත් සිය විඥානය යොමුකළ ආකාරය අගෙයි. අසන්නාට පිළිතුර කුමක්දැයි සිහිවේ. එය "මීවදය" බව ඔහුට නිසැකය. එහෙත් ඔහුගේ විඥානය අනුව ඊට තිසි පිළිතුර තැබුවේද සීපදයෙනි.

214. ගලෙත් නොවෙයි ගල් රුකුලෙත්
නොවෙයි බොලන්
බිමත් නොවෙයි බිම් රුකුලෙත්
නොවෙයි බොලන්
ගසෙත් නොවෙයි ගස් රුකුලෙත්
නොවෙයි බොලන්
තිවසේ ගොසින් බැන්දේ රස
**මීය** බොලන්[3]

---

2. සසඳන්න - එම තේරවිලි සිව්පදයට සමාන තවත් තේරවිලි සිව්පදයකි මේ.
කැලේ සිටන් මහ සෙනඟක් ඇවිදින්
ගලේ කොටුව බැඳගෙන ඉන්නේ
බලේ සපන් කම් ඇති අය ඇවවිදින්
මරා දමා බඩු අරන් ගියේ
කලේ අනඩුවයි බඩු මොකවත් නැත
කැමට තිසිදේ අරන් ගියේ
මලේ මේක තෝරාලා බැලුවොත්
මිහිරි දෙයට කවුරුත් කැමැතියි
- කුකුළු කෝරලේ ජනකවි සහ ගැමි සංස්කෘතික ලක්ෂණ 105 පි.
3. කුකුළු කෝරළේ ජනකවි සහ ගැමි සංස්කෘතික ලක්ෂණ 106 පි.

පත්හිඳ ට කී තේර්විල්ලක් සහ ඊට දුන් පිළිතුරු සිව්පදයක් සබරගමුවේ ජනකවි අතරවේ.

215. උරණ වෙලා උන් පාළිය දැනගෙන
මිතුරු වෙලට අරගෙන ලගිතී
උරණ වෙලා උන් එළියට ආකළ
පරුවත මුදුනේ කුඩ වියතී
කරුණාකරලා උන්ගේ වරිගෙට
සරස්වතී මුඛයේ සිටිතී
සිහිකරලා මේ පද විමසාලා
පමා නැතිව තෝරා එවතී[4]

පාළිය දත් අය ගැනද සරස්වතී මුඛයේ ඇති හෙවත් කවි දන්නවුන් ගැන ද තල මල පිපීම ගැනද (උරණ වෙලා උන් එළියට ආ කළ පර්වත මුදුනේ කුඩ වියතී) යන හෝඩුවා වලින් පත්හිඳ ගැන කී තේරවිල්ලක් බව අසන්නාට හැඟේ. අසන්නා සිය විඥානය පළ කරමින් ඊට මෙසේ පිළිතුරු දෙයි.

216. ආලවඩන ගුරු රන්පෙති පෙළ ලෙස
ලියලා මට මේ පද එව්වා
මාල රත්තරන් කරවට දිළිසෙන
මතුවට පවතී දෝ මේවා
කාල මෙ පන්දහසට පවතින්නට
අඩිපාරේ ධර්මය ලිව්වා
බාල මගේ නැණයෙන් ගැන බැලුවෙමි
පත්හිඳ ටය මේ පද කිව්වා [5]

සබරගමුවේ ගැමියන්ගේ සාක්ෂරතාවයේ මහිමය ද තේරවිලි සිව්පද වලින් පිළිබිඹුවේ. තමන්ට ලබාදීමට අවශ්‍ය දෙය රහස් ලියැවිල්ලක් මගින් ඉල්ලා එවූ ආකාරය පහත දැක්වෙන තේරවිලි කවියෙන් හා ඊට දුන් පිළිතුරු කවියෙන් හෙළිවේ.

---

4. සපරගමුවේ ජනකවි 49 වි.

5. සපරගමුවේ ජනකවි 49 වි.

217. දස අකුරේ මුල්කුරු පා මුලට ගනු
පස පස තුනක් එක අකුරින් අල් කරනු
යස ලෙස කොම්බු ඇලපිල්ලක්ද අරගනු
මට මිතුරේ මේ දෙය සපයා එවනු [6]

සාක්ෂරතාවයෙන් යුත් අසන්නා ඊට පිළිතුරු දුන්නේ මෙලෙසිනි.

218. ඇලපත රුදුවට වෙදකම් ලපැත්තේ
මැතිසද තුමනි වැජඹෙන කුරුඳුවත්තේ
සොඳකිඳ සොයා යන්නට නැත මේ පැත්තේ
රසකිඳ තිබුණි කම්මල තිබෙනා වත්තේ [7]

මේ තේරවිල්ලේ අරුත වටහාගෙන ඊට නිසි පිළිතුරු සැපයිය හැකි වන්නේ සාක්ෂරතාවයෙන් යුතු කෙනෙකුට පමණි. පහත දැක්වෙන්නේ ද සාක්ෂරතාවයෙන් යුතු පුද්ගලයෙකුට පමණක් පිළිතුරු දිය හැකි තේරවිලි සවිපදයකි.

කුකුළුවා විහාරය - ගැන කියැවෙන මේ තේරවිලි කවියේ මුල් අකුරු සතර පහළට ගැලපූ විට ඊට නිසි පිළිතුර ලැබේ.

219. කුළුනින් වැඩි පිරුණු උතුමන් දිවාරය
කුළගුන් කර සැදුම්ණි රුව දෙවාරය
එවදන් දසත පුර්වාගෙන දිවාරය
වයඹින් පෙනේ මුල සිව්කුරෙ විහාරය [8]

මුල කුරු සතර ගැලපූ විට කු + කු + ළු + ව 'කුකුළුව' විහාරය යන තේරුම ලැබේ.

'රුක' හා 'තුර' යන වචන පිළිබඳ වාක්කෝෂමය තේරවිල්ලක් පහත දැක්වේ. මෙම තේරවිල්ල තෝරාදිය හැකි වන්නේ සාක්ෂරතාවයෙන් යුතු පුද්ලයෙකුට පමණි. එම තේරවිල්ල මෙසේය. මෙය නැනා කෙනෙක් සිය මස්සිනාට ඉදිරිපත් කළ

6. රත්නපුර ජනකවි 53 වි.
7. රත්නපුරේ ජනකවි 53 වි.
8. කුකුළු කෝරලේ ජනකවි සහ ගැමි සංස්කෘතික ලක්ෂණ 65 වි.

තේරවිල්ලක් විය හැකිය. මේ නෑනා විසින් සිය මස්සිනාගේ නුවණ උරගාබැලූ අවස්ථාවක් විය නොහැකිද?

220. මෙවන් රුකේ සියලු සතහට
උතුම් රුක තෝරා දෙනු
කතුන් අඩු වැඩි කරන රුකකුත්
ඇතේ එය තෝරා දෙනු
එමෙන් කොතැනත් තිවෙස් වල ඇති
රුකේ නම තෝරා දෙනු
යකුන් රකුසුට උතුම් වූ රුක
තෝරා මිස කට නාරිනු [9]

තේරවිල්ලෙන් මෙන්ම, ඊට දුන් පිළිතුරෙන් ද සබරගමුවේ ගැමින්ගේ විඥාණය හෙළිවේ.

221. ගසට කියන්නේ රුකමය - රුකට කියනේ තුරුමය
තුර සතරේ විස්තරෙ නුඹ අසනු කුමරියේ
ලොවට උතුම් තුරක් ඇතිය - ඒ කිව්තුර නම් චතුරය
අඟනුන් වැඩ කරන්නා තුර කතුර කුමරියේ
ගෙයට උතුම් තුරක් ඇතිය - ඒ කිව්තුර නම් යතුරය
එය නැත්නම් සොර සතුරන් පිඩා දෙතියේ
යකුට උතුම් තුරක් ඇතිය - ඒ කිව්තුර නම් මතුරය
මතුර බෙලෙන් යක් රකුසන් දමනය වෙතියේ[10]

"රුක" යනු "තුර" විය. තුර සතර චතුර-කතුර-යතුර හා මතුර විය.තේරවිලි අසන්නාගේ සහ පිළිතුරු දෙන්නා තුළ පැවැති සාක්‍ෂරතාවයත් විඥාණයත් ඉන් අනාවරණය වේ.

සබරගමුවේ ජනකවියා තේරවිලි සිව්පද කිමේදී සංකේත භාවිතයේ ද දක්ෂයෙක් විය පහත දැක්වෙන තේරවිලි සව්පදයේ "ගොනා" යුනුවෙන් දක්වා ඇත්තේ "මාලය" ටයි. එම මාලය ගොනෙකුගේ රුව ඇති එකකි.

---

9. කුකුළු කෝරළේ ජනකවි සහ ගැමි සංස්කෘතික ලක්ෂණ102 වි.
10. කුකුළු කෝරළේ ජනකවි සහ ගැමි සංස්කෘතික ලක්ෂණ 102 වි.

තන මත්තේ (පියයුරු අසළ) උඩ ඉඳ තන (පියයුරු) නොකන ගොනා (මාලය) ලෙස, දක්වමින් ජනකවියා තේරවිලි සිවිපදය නිර්මාණය කොට ඇත්තේ සිය විඥානය උපයෝගිකර ගනිමිනි.

222. මහපොලවේ ගින්නෙන් පුරවාපු ගොනා
මහමූදේ රළ පිට පීනවපු ගොනා
තන මත්තේ උඩ ඉඳ තන නොකන ගොනා
දුව දුන් ද දෑවැද්දට දුන්නු ගොනා[11]

ජනකවියා කීවේ දෙපියයුරු සමීපයේ මාලය රැඳී ඇති බවයි. එය දෑවැද්දට දුන් රන් මාලයයි.

මුදල් - ගැන සබරගමුවේ ජනකවියා ගේ විඥානය ඉතා පුළුල්ය. ජන කවියා තේරවිලි සිවිපදය සඳහා සිය විඥානය මෙහෙයවූයේ මෙලෙසිනි.

223. අත නැත පය නැත දෑස දෙකම නැත
මව්පිය කෙනෙකුත් නැත දන්නේ
කනවා තොරනැත බඩ පිරුනෙත් නැත
අතින් අතට ගොස් නැළවෙන්නේ
දෑස නැතත් මඟ වැරැදීමක් නැත
කොයි කොයි රටවලටත් යන්නේ
උතුම් නමක් ඇති කෙනෙකුට කිව්වා
පුළුවන් නම් සකි තෝරන්නේ[12]*

---

11. රත්නපුරේ ජනකවි 53 වි.
12. රත්නපුරේ ජනකවි 54 වි.
* මුදල් ගැන කී තවත් තේරවිල්ලක්
- ඔක්කොම රටකොට, බාරවෙලා සිට
ජීවත් වෙයි වෙළඳන් කරලා
එක්කම සමනළ දෙකම මුරේදී
කරපු පිනක් සිට මතු කරලා
තික්මුණු නැව් බඩු කලප්පු කප්පර
පැදගෙන එති කොට මුණට වෙලා
ඔක්කොම කවිපද මුලසිට තෝරන්
පුළුවන් නම් මතු සිහිකරලා
- පහළ ඌවේ ජනකවි 83 වි.

මෙම තේරවිලි සිව්පදයට සඳහා කී පිළිතුරු සිව්පදයක් හමුනොවේ. එහි තේරුම 'මුදල්' ය.

මේ බෙරය ගැන කී තේරවිලි සිව්පදයකි.

224. ගොනෙක් ගෙනත් දෙරකඩ බැඳලා තියලා
ඔලුව නැතුව තොප්පිය හිස ලවාලා
බෙල්ල නැතිව ලණු හුහකින් වෙලාලා
ගොන්රජ හඬයි අත වැදුනායි කියාලා[13]

'අඬති' - 'අත වැදුනායි කියාලා' යනුවෙන් දැක්වෙන සිව්වැනි පදයෙන් තේරුම කීමට හෝඩුවාවක් ලැබේ.

දවුල ගැන කී මේ තේරවිල්ලේ වචන ගලපා ඇත්තේ දවුල් හඬ නැගෙන ශබ්ද රටාවකට සුදුසු වූ පද වයන්නාක් මෙනි. ජන කවියාගේ විඥානය ඉන් හෙළිවේ.

225. ඇතුත් නැතුව බතුත් නැතුව
මහ හිමයේ ගසක නමක්
රේණු නැතුව බුබුළු නැතුව
විජේන්ද්‍ර දෙරක නමක්
අඩාවැටෙන මේ කෝවේ දෙවියන්
දෙර දෙරක නමක්
මේ තුන් සරනේ තේරුව කෙනෙකුට
උඩරට දෙමි මුදලි කමක්[14]

---

13. සපරගමුවේ ජනකවි 126 වි.
14. සපරගමුවේ ජනකවි 151වි.

** දවුල් ගැන කී තවත් තේරවිල්ලක් හා පිළිතුරක් මෙසේය.
- වනේ එකෙක් ඇත කඳ මිස පණ නැත
පණ නැති දෙන්නෙක් එක් වන්නේ
ගුණේ කෙහෙත් නැති එකෙක් ඇවිල්ලා
බිම පෙරලාගෙන ගුටි දෙන්නේ
වදේ බැරුව මහ අඬයි විටින් විට
නඩුවක් වත් නැත පවසන්නේ
අනේ මේක අද තෝරා බැලුවොත්
ඉතාම කදිමයි පද සන්නේ

පිළිතුර - වනේ එගස පැල වෙලා සොඳින කඳ
දක කපමින් ගෙන සිත් තුටිනා
අනේ මොකද මළ ගමේ එළන අත
ගිගුම් දිදී සොඳ පද ගසනා
රනේ රුවන කොළ බලා මේ විසිතුර
පද බැඳලා කවි අප කිව්නා
අනේ මේක පද කරලා කීවේ
දවුලට දේ නොවෙදේ ඉතිනා

- සිහල තේරවිලි 60 - 61 පි.

කුඹුරට එන කුරුල්ලන් පළවා හැරීම පිණිස 'දිය හොල්මන' නමැති ගැමි උපකරණයක් සවි කෙරේ. මෙය සවිකෙරෙන්නේ වක්කඩකය. එය කරුවක රඳවන ලද උණ කඳකි. වක්කඩින් බැස යන වතුර උණ කඳේ එක් කොනක පිරෙන විට අනෙක් කොන උඩ යයි. එවිට වතුර පිරුණු කෙටස එක්වරට පහතට ඇදී එය සමීපයේ තබා ඇති ගලේ හැපෙන්නේ නාදයක් නිකුත් කරමිනි. මෙය ජලය ගලා බැසීමත් සමගම නිරන්තරයෙන්ම සිදුවන්නකි. මෙය දිය හොල්මන නමින් හැඳින්වේ. දිය හොල්මන 'දිය ඩොහරය' 'ඌරු බොක්ක සහ 'හොල්මන් කුරුල්ලා'[15] යනුවෙන්ද හඳුන්වයි.

මෙසේ නොනවත්වා නද දෙමින් වක්කඩ අසළ සිටුවා ඇති දිය හොල්මන සබරගමුවේ ජනකවියා දකින්නේ ජීවයෙන් යුත් මිනිසෙක් ලෙසිනි. නැතහොත් ඊට සචේතනික ගුණය ආරෝපණය කරමිනි.

226. එවලෙම තන කෑම එවලෙමයයි අහක
කොනක් ඇවිත් නිතරම ඇනෙනව ගලක
මෙහෙම කෙනෙක් ඉන්නව දුටුවා වෙලක
අනේ ඉලව්වේ උණ්දෑ විදින දුක[16]

මේ තේරවිලි සිව්පදය අසන්නා එක් වරටම වල්මත්වෙයි. 'කොනක් ඇවිත් නිතරම ඇනෙනව ගලක' යන පාදය හෝඩුවාවක් කර ගන්නා අසන්නා ඉන් පසු පිළිතුර කරා පැමිණේ.

---

15. දිය හොල්මන ගැන කී සිපදයක්
- උණ දඬු කපන තැන උණ දඬු රිකිල්ලා
බට දඬු කපන තැන පමදඬු රිකිල්ලා
වතුර බසින තැන හොල්මල් කුරුල්ලා
සීපද කියන අය කවුරුත් වරෙල්ලා
- ගොවිගෙදර ජනකවි

16. සපරගමුවේ ජනකවි 153 පි.
දිය හෙල්මන ගැන කී තවත් තේරවිල්ලක්
- මෙලක්සන සතෙක් දුටුවා මං දෙලක
කොනක් ගොසින් තිස්සෙම ඇනෙනව ගලක
පිරිව්වාම ආහර යනවා අහක
අනේ අනිච්චං උන්ද විදින දුක

රත්නපුර ඇඹිලිපිටිය ප්‍රදේශයේ හේන්වල වගාකෙරෙන ඉරිඟුකරල ගැන කී තේරවිලි සිව්පදයකි මේ. ජනකවියා ඉරිඟු කරල තරුණියකට උපමාකොට දැක්වූ අයුරු කදිමය.

227. එරන් කුඹේ පිට ඉන්නයි කියාගෙන
උනා නිල් වරල පිට දිග හෙළාගෙන
කිරිඇති දෙතන සළු හතකින් වසාගෙන
තෝරාපන් බැනෙ *නුවණින් බලා ගෙන[17]

මාමා කී තේරවිල්ලට බෑනා ගෙන් ලැබුණු පිළිතුර මෙසේය.

228. ඇඹිලිපිටිය නම් ඇතිතෙක් හොඳ නාමේ
උණ ගත්තම දිය උණුකර දෙන දීමේ
සියලු සතුන් හරිකරගෙන කන කෑමේ
කරල් ඉරිඟුවට කිව්වා දෝ මාමේ[18]

රත්නපුරේ ප්‍රදේශයේ හල් පිට්ටු ඉතා ජනප්‍රිය ආහාරයකි. හල් ගෙඩිය තිත්ත රසය. එහි තිත්ත ගතිය පහකිරීම පිණිස මඩේ හෝ වතුරේ දමා තබයි. ජන කවියා "හල් පිට්ටු" ගැන කී තෝරවිලි සිව්පිදයකි මේ.

229. උඩ හමසක් තිබුණු ගෙඩිය
බිම හමසක් තිබුණු ගෙඩිය
හත්කෝරළෙන් ගෙනා ගෙඩිය
රිලව් නොකන තිත්ත ගෙඩිය[19]

තවත් ජනකවියක් "හල්ගොඩිය" දුටුවේ මෙලෙසිනි.

230. තිත්ත තිත්ත තිත්ත ගෙඩිය
දිය යට යන පතන ගෙඩිය
මම යන විට බලා සිටිය
ඇල මෝදර ගලා සිටිය[20]

---

17 -18. සිංහල තේරවිලි 39 පි.
19. සපරගමුවේ ජනකවි 125 පි.
20. සපරගමුවේ ජනකවි 145 පි.
* - තේරාපන් යාලු නුවණින් බලා ගෙන පහළ ඌවේ ජනකවි 81 පි.

මේ බලියත් දක කි තේරවිල්ලකි. ජනකවියා බලිය දූවුවේ දරුවන් වඩාගත් මවක් මෙනි.

231. උදපනම මම යන කොට අසල වනේ
හැඩරුව ඇති අඟනක් මහෙබලා ගෙනේ
දරුවන් දෙදෙනා දෙ අතින් බැඳ වඩා ගෙනේ
මේ පන්නේ තෝරාපන් ගුරුවරුනේ[21]*

ඊට පිළිතුරු ලැබුණේ මෙවැනි සිව්පදයකිනි. මැටි බලිය විසිතුරු නිර්මාණයකි.

232. කලවා උඩ කෙණ්ඩ උඩ ගෝමර කැවියා
නිරාහාරයෙන් එළදගෙ මස් දැවියා
නුවණ මද කමින් පාරේ රැක සිටියා
කුමට කතා කරනෙද ඒ මැටි බලියා[22]**

රත්නපුරේ කිතුල් පැණි හා හකුරු ආශ්‍රිතව ද තේරවිලි සිව්පද නිර්මාණය වී ඇත. මේ තේරවිල්ල නිර්මාණය වී ඇත්තේ කිතුල්ගස පිදි තිබූ ආකාරය ඇසුරිනි. කිතුල් ගස පූදින්නේ ගසමුදුනින් මලක් පිදීමෙනි. එය "මුදුන්මල" ලෙස හැඳින්වේ. මුදුනේ සිට එක් එක් පිත්තෙන් පිත්තට මල් හටගනී. මල පිදීමට පෙර, පැණි ලබා ගැනීම පිණිස නොපුබුදු කිතුල් මල තලා - තමා - බෙහෙත් වර්ග බැඳ පූදනම් කරගත යුතු ආකාරය ජනකවියා අසන්නාට සිහිපත් කරවයි.

---

21. රත්නපුරේ ජනකවි 46 පි.
* සසඳන්න - උදපනම මම යනකොට ගුරුවරුනේ
හවරුව ඇති අඟනක මඟ බාලගෙනේ
උකුල් දෙකට දරු තව දෙන තබාගෙනේ
මේ එන්නේ කෝරනවද ගුරුවරුනේ
- සිංහල තේරවිලි 69 පි.

22. රත්නපුරේ ජනකවි 51 පි.
** සසඳන්න - කපා ගොඩකරන් එල මල් දැවූ කැවියා
දනා ගෙඩිකරන් රිපිට මැටි කැවියා
දලික් ගුරුත් ගාලා එකි රුව කැවියා
උඹට කතා නොකළද මැටියෙන් බලියා
- සිංහල තේරවිලි 69 පි.

233. ඉතාම අත දරුවන්ට-තලාලා
අච්චේ කණුවක බැඳ පල්ලා
තැලුවා මදිනම් තවත් තලාලා
දඬුකඳකට හිර කරපල්ලා
හඬනා හැඩුමට මේ හඬ මදිනම්
උගුරට බෙහෙතක් දපල්ලා
ගුවන් තලේ සිට හඬනා ළමයගෙ
නම දනිතොත් තෝරා පල්ලා[23]

ජනකවියා කිතුල් මලට ද ජීවයක් දී එය ළමයෙක් සේ දක ඊට සචේතනික ගුණය ආරෝපණය කරයි. ඊට පිළිතුරු සීපදයක් නොලැබේ. පිළිතුර කිතුල් මල ය.

සබරගමුවේ ජනකවියා "පුස්කොළ පොත" ගැන කී තේරවිලි සීපදයකි මේ.

234. උසකින් බැසලා උණු දිය නාලා
පවනේමයි උන් සැතැපෙන්නේ
කඳක් කපාලා කඳ උඩ තියලා
රජවද තිස්දෙක වද දෙන්නේ
දෙකොන කපාලා සුරතින් අල්ලා
උලකින් ඇණ වද කරවන්නේ
බෙහෙත් අඳුන්ලා වෙදකම් කරලා
යතුල්ලාපු ගේකයි ඉන්නේ[24]

ජනකවියා පුස්කොළ පොත ද සචේතනික බවට පත්කොට ඇත. අසන්නාට හැඟෙන්නේ එය මිනිසෙකුට දෙන වද තිස් දෙකක් මෙනි. එහෙත් ඉන් කියැවෙන්නේ තල්ගස් ගොබ කපා (උසකින් බැසලා) තම්බා (උණුදිය නාලා) පවනේ ලා වේලා ගනී. ඉන් පසු පුවක් කඳක් මත තබා අදිමින් (රජ වද තිස්දෙක දෙන්නේ) තල් කොළ පදම් කර ගනිති. පදම් කරගත් කොළ දෙකොණ කපා මැද දෙපොලක සිදුරු (උලකින් ඇණ වද කරවන්නේ) විද ගනී.

23. සපරගමුවේ ජනකවි 133 පි.

24. රත්නපුරේ ජනකවි 33 පි.

එසේ කෙරෙන්නේ පත්ඉරු නූලකින් බැඳ ගැනිම පිණිසය. ඉක්බිති අකුරු ලියා. ඒවා පෙනෙන සේ කළු මැද ආරක්ෂාව පිණිස දුම්මල තෙල් ගා (බෙහෙත් අඳුන් ලා වෙදකම් කරලා) පුස්කොළ පොත බැඳ අල්මාරියේ (යකුල්ලාප්පු ගේ කයි ඉන්නේ) තබයි. ජනකවියා සිය විඥානය මෙහෙයවා පුස්කොළ පොත ගැන තේරවිල්ලක් නිර්මාණය කර ඇත්තේ එළෙසිනි.

සබරගමුවේ ජනකවියා මිල්ලවිටියේ ආචාරිගෙන් ගිරයක් සාද ඉල්ලා යැවුවේ පහත දක්වෙන තේරවිලි සහිත සිව්පදයක් මගිනි.

ගිරයෙන් පුවක් කැපිම පහසුවේ. පිහියකින් පුවක් කපන විට ටික - ටික කැපි අල්ල තුවාල වේ. 'අල්ල ඉරිලා ලේ ගලනා කලට' ඔහුට මිල්ලවිටියේ ආචාරි උන්නැහේ සිහි විය.

235. එල්ල ගෙන කියමි මගේ දුක — දයාවට
මිල්විටියෙ ලොකු ආචාරි — උන්දට
අල්ල ඉරිලා ලේ ගලනා — කලට
බෙල්ල ඇද ගිරා පැටියෙක් එවන් — මට[25]

ජනකවියා කෙළේ සන්නිවේදනයකි. එම සන්නිවේදනය කෙරුණේ සංකේතයක් මගිනි. එම සංකේතය තේරවිල්ලක් බවට පත්විය. 'බෙල්ල ඇද ගිරා පැටියෙක් එවන් මට' 'බෙල්ල ඇද ගිරා පැටියා' යනුවෙන් ජනකවියා සඳහන් කළේ ගිරයයි. ගිරය ගැන කී තේරවිලි රාශියක් ජනශ්‍රැතියේ පවතී.

පිළිතුරු පැවැසීමට නොහැකිව පැරදුනු අයට අභියෝගවලට මුහුණ දීමට සිදුවිය. එක් අභියෝගයක් වූයේ සිටි තැනින් පලවා හැරීමය.

25. රත්නපුරේ ජනකවි 16 පි.

236. හතලිහ හතලිය හතලිස් පේලිය
ගල් කණු කොච්චර ඇද්ද කියං
එක ගල් කණුවට හතර හතර නම
රහතුන් කොච්චර ඇද්ද කියං
රහතන් ගණනත් ගල් කණු ගණනත්
සේරම කොතරම් ඇද්ද කියං
කියා දෙන්න බැරි උනි නම් සතියකි
පැරදුන නුඹ අහකට පළයං[26]

"ලෝවාමහාපාය" යන එහි තේරුම දීගත නොහුණුවිට අසන්නා ඉවත්විය යුතු විය.

මේ ආකාරයෙන් ගැමි ජන විඥානය හෙළි කෙරෙන තේරවිලි සිව්පද රාශියක් සබරගමුවේ ජනකවි ක්ෂේත්‍රයට එක්වී තිබේ.

26. රත්නපුරේ ජනකවි 16 පි.



121

# සබරගමු ජන කවියේ විශේෂාංගයක් වූ ඇත්කවි

# 8

දිවයිනේ වෙනත් ප්‍රදේශවලට වඩා සබරගමුවේ ජනකවි අතර, **ඇත්කවි** රාශියක් හමුවේ. සබරගමුව ඈත කාලයේ සිටම ඇත් ගාල් වලට ප්‍රසිද්ධියක් උසුලයි. සබරගමුවට අධිපති සමන් දෙවියන්ගේ වාහනය වන්නේද ඇතා වේ. මේ නිසා ඇතුන් ගැන කී කවි රාශියක් සබරගමුවේ ජනකවියට එක් වී ඇත. ඇතුන් ගැන කී එකම කවිය විවිධ ආකාරයෙන් ව්‍යවහාරයට පත්වී ඇති අයුරුද මෙහි දී පෙනෙන විශේෂත්වයකි.

237. රත්නපුරේ සිට හොඬ හකුලාගෙන
සබරගමුවෙ යනවාද ඇතා
රත්තරනෙන් ඇඟ පිට සරසාලා
පෙරහැරකට යවාද ඇතා
දළපිට ඇගෙරන් කඩුව තබාගෙන
දිය කැපුමට යවාද ඇතා
වස් නැත දෙවියනි සින්දුව කීවට
සබරගමුවේ දේවාලෙ ඇතා [1]

1. කුකුළු කෝරළේ ජනකවි හා සංස්කෘතික ලක්‍ෂණ xix පි.
සසඳන්න - i
- අලුත්නුවර සිට සොඬහකුලාගෙන නවගොමුවට යනවාද ඇතා
රත්තරනෙන් ඇඟ පිට සරසාලා පෙරහැරකට යනවාද ඇතා
දළ පිට ඇගෙ රන් කඩුව තබාලා දිය කැපුමට යනවාද ඇතා
වස්නැත දෙවියනි සින්දුව කීවට අලුත්නුවර දේවාලෙ ඇතා
- කුකුළු කෝරළේ ජනකවි හා ගැමි සංස්කෘතික ලක්ෂණ xix
ii - අලුත් නුවර සිට සොඬ හකුලාගෙන නාගමුවට යනවාද ඇතා
රත්තරනින් උගෙ පිට සරසාගෙන පෙරහැරකට යනවාද ඇතා
දළ දෙක පිට රත් කඩුව තබාගෙන දිය කැපුමට යනවාද ඇතා
ඇත්කවි කීමට වස්නැත දෙවියනි අලුත්නුවර දේවාලෙ ඇතා
- ජනසම්මත කවි ගී - 109 පි.
- සිංහල ජනකවි සංග්‍රහය ii -110 පි.
iii නවගමුවේ සිට හොඬ හකුලාගෙන අලුත්නුවර යනවාද ඇතා
රත්තරනෙන් ඌගෙ පිට උඩ සරසාලා පෙරහැරකට යනවාද ඇතා
දළ දෙක උඩරන් කරඬු තබාගෙන දිය කැපුමට යනවාද ඇතා
වස් නැති දෙවියනි සින්දුව කිව්මට අලුත්නුවර දේවාලෙ ඇතා
සබරගමුවේ ජනකවි 18 පි.
iv නවගමුවේ සිට හොඬ හකුලාගෙන හංගමුවට ආවාද ඇතා
දළ දෙක උඩ රන් කරඬුව අරගෙන දිය කැපුමට යනවාද ඇතා
රත්තරනෙන් උගෙ පිට සරසාගෙන පෙරහැරකට යනවාද ඇතා
සින්දුව කිව්වට වස් නැත දෙවියනි සබරගමුවෙ දේවාලෙ ඇතා
රත්නපුරේ ජනකවි 28

මෙම ජනකවි වලින් කියැවෙන්නේ

"සබරගමුවෙ දේවාලෙ ඇතා" සහ
"අලුත්නුවර දේවාලෙ ඇතා ගැනය.

ඇත්කවි කීමට දෙවියන්ගෙන් (වරම්) අවසර ලබා ගත්තේය.

"ඇත් කවි කීමට වස්නැත දෙවියනි"
"වස්නැත දෙවියනි සින්දුව කිව්වට"
"වස් නැත දෙවියනි සින්දුව කිව්මට"
"සින්දුව කිව්වට වස්නැත දෙවියනි"

ඇත්කවි ගායනා රටාව ජන කවියා හඳුන්වා ඇත්තේ "සින්දුව"[2] යනුවෙනි. කුරහන් කැපීමේ කයියේ දී ඇත්කවි ගායනා කෙරුණි.[3] ඇතෙක් සෑදූ සැටි - ඇතාගේ ලක්ෂණ - ඇතා පිළිබඳ විශේෂ සිද්ධි ඇත්කවි වලට විෂය විය.

238. ඇතෙක් සෑදූ සැටි අසුවද නුඹලා
එක්නැලිගොඩ මැතිඳුන් ගාවා
ඇතාගෙ කරවට ඉසුනයි ගෝමර
පවන්සලන කන්දෙක ගාවා
රිදී කදන්සේ දළ දෙක ඇරගෙන
ඇවිත් සිටිති වාසල ගාවා
ඇතා එරුණ තැන ඈසුවද නුඹලා
වලව්වෙ කුඹුරු පන්තිය ගාවා[4]*

ඉන් කියැවෙන්නේ කුඹුරේ එරී ඇතාට අණතුරක් වූ බවය. මෙය එල්ලාවල දී සිදුවූවක් බව තවත් ජන කවියක සඳහන්වේ.

---

2. ජනකවියේ "සින්දුව" පිළිබඳ විස්තර සඳහා බලන්න
ගොවිගෙදර ජනකවි 20 – 21 පි.
3. බලන්න - ජනසම්මත කවි ගී 107-114 පි.
4. සිංහල ජනකවි සංග්‍රහය ii -110 පි.

* සසඳන්න - ඇතෙක් සැදුහැටි ඇසුවද ලෝකේ එක්නැලිගොඩ මැතිඳුන් ගාවා
ඇතුගේ කරවට ඉසුනිය ගෝමර පවන්සලන කන්දෙක ගාවා
රිදී කඳක්සේ දළදෙක අරගෙන ඇවිත් සිටි දෙරකඩ ගාවා
ඇතා වැටුන හැටි ඇහුනද ලෝකෙට වලකුඹුරේ කලව්ව ගාවා
- රත්නපුරේ ජනකවි 25 පි.

239. ඇතෙක් තැනුව තැන් බලන්ඩ යමු අපි
එල්ලාවල මැතිඳුන් ගාවා
ඇතා වැටුණු තැන් බලන්න යමු අපි
එල්ලාවල මැතිඳුන් ගාවා
ඇතාගෙ කරවට ඉසුනයි ගෝමර
පවන් සලන කන් දෙක ගාවා
රිදී කඳන් වගෙ අත්පොඩි අරගෙන
බලා සිටිති වාසල ගාවා[4/1]

ගමේ ප්‍රභූන් විසින් ඇතුන් ඇතිකරනු ලැබූ අකාරය ඇත්කවි කිහිපයකින් ම පැවැසේ.

ඇත් පැටියා බැන්දවනු ලැබුවේ කොක්කාවිට ගම මුහන්දිරම් විසිනි. නවදුන් කෝරළෙන් පැමිණි පිරිසක් ඉල්ලූ විට ඇත් පැටියා නොලැබුණි. එහෙත් ඇත් පැටියා මිය ගොසිනි.

240. කොක්කාවිට ගම මුහුන්දිරම් මැති
බැන්දෙව්වයි ඒ ඇත් පැටියා
නවදුන් කොරළෙ සෙනඟක් ඇවිදින්
ඉල්ලුවයි ඒ ඇත් පැටියා
ගැතලා රුපියල් දහක් දුන්නත්
ඒත් නොදුන්නයි ඇත් පැටියා
ඉරිද-සඳුද-අඟහරුවාද
නැසී ගියයි ඒ ඇත් පැටියා[5]

මේ ඇත් පැටියා මිය ගියේ, අල්ලාගත් පසු වතුර පොදක් පවා නොබීම නිසා බව තවත් ජනකවියක සඳහන්වේ.

---

4/1. සපරගමුවේ ජනකවි 50 පි.

5. සිංහල ජනකවි සංග්‍රහය ii-110 පි.

241. කොක්කාවිට ගම මුහන්දිරම් ඇති
බැන්දෙව්වයි කී ඇත් පැටියා
රුපියල් දහක් ගැනලා දීලත්
ලබාගන්න බැරි වූ සැටියා
සාපය වැදිලා වතුර පොදක්වත්
බොන්නේ නැතුවම සිටි සැටියා
ඉරිද දවසේ එම වරුවේදී
නැසී ගියයි මේ ඇත් පැටියා [6]

ඇත් පැටියෙක් මියයාම පවා, ජනකවියා කම්පාකළ සිදුවීමක් විය.

කිරි ඇල්ලේ -කුලවාතේ සහ පතාමුරේ ඇත්ගාල් ගැන තොරතුරු සබරගමුවේ ජනකවියෙන් හෙළිවේ.

ජනකවියා කියන්නේ ඇතින්නකට වූ විපතක් ගැනය. ඒ විපත කුමක්දැයි ජනකවියෙන් හෙළි නොවේ. හංගමුවේ සිට ආ පිරිසක් විසින් කිරි ඇල්ලේ ඇත්ගාලක් බඳිනු ලැබූ බව පමණක් ඉන් හෙළිවේ.

242. හංගමුවේ සිට සෙනග ඇවිල්ලා
බැඳි ඇත්ගාලකි කිරිඇල්ලේ
කැලේ සිටින අලි නඩේ ගෙනැල්ලා
ගාල් කරයි සොඳ කිරිඇල්ලේ
සූතල් කියමින් සොඩ අකුලාගෙන
ඇවිදින් කිරිබොති දෙතන තුලේ
අනේ සමන් දෙවි සෙනේ ඇතින්නට
වැදුන ගින්න ඇයි පහ නොකෙළේ [7]

මොලමුරේ සහ ඇලපාත වැනි මුදලිවරුන් ඇත්ගාල් කළ ආකාරය සබරගමුවේ ජනකවි වලින් හෙළිවේ.

---

6. කුකුළු කෝරළේ ජනකවි 18 පි.

7. සිංහල ජනකවි සංග්‍රහය ii-110 පි.

243. දිසාපතිඳු කලවාතේ වල් අලි
බඳිමින් නවසිය විසි නවයේ
පලලැබ ගන්නට පස්සෙම
නොබැඳපු හිත්ද අලිරැළ මහ වනයේ
බල පෙන්වන බව දකිමින් ඒ අය
මොලමුරෙ මැතිඳුන් සිටි සැටියේ
මැතිඳුන් ඒ ඇලපාතට කැඳවා
එතුමට මේ ලෙස පැවසීයේ[8]

කුකුල් කොරළේ ජනකවියා මේ දක්වා ඇත්තේ පනාමුරේ ඇත්ගාල හා සම්බන්ධ වූ පුවතකි. පනාමුරේ ඇත්ගාල ඉපැරැණි ඇත් ගාලකි. කාලයක් තුළ එහි අලි නොබැඳීම නිසා ගැමියන්ගේ වගාවන්ට හානි සිදුවිය.

244. පනාමුරේ තිබෙනා ඇත් ගාලේ
කලෙකින් අලි නොබැඳපු හෙයිනේ
විනාශයකි සිදුවන්නෙ වගාවට
වල් අලි ගම මැද ආවොතිනේ
ප්‍රසාද කරගෙන මුත්තෙට්ටුව ගම
දිසාපතිඳු ගම කැඳවන්නේ
දනාද රැස්කර බැඳීම යුතුවෙයි
ගාල මෙවර ඕනැකමිනේ[9]

ක්‍රි.ව. 1944 දී පමණ මෙම පුවත සිදුවී ඇත. මෙම කාර්යය භාරවූයේ මුත්තේට්ටුවෙගම දිසාපතිටය. මෙවර ප්‍රදේශයේ පැවැති අලි උවදුර පහවී ගියේය.

---

8. කුකුළු කෝරළේ ජනකවි 18 පි.
9. රත්නපුරේ ජනකවි 58 පි.

245. පිළිඅරගෙන ඒ අයදුම එතුමා
මුත්තෙට්ටුවෙගම මැති කැඳවා
මැලි නොවනා මහ සෙනඟක් ගෙනවිත්
පනාමුරේ ඇත්හල බඳවා
අලි බැඳ නවසිය හතලිස් හතරේ
ප්‍රදේශයේ බිය දුරු කෙරුවා
යලි ඇතිනොවෙනා ලෙස අලි උවදුරු
මේ ප්‍රදේශයේ දුරු වේවා[10]

246. නවසිය පහහේ අගොස්තු මාසේ
පස්වෙනි දින ශුභ මොහොත බලා
යොදවිය මහ ජනයා ඇත් ගාලට
අලි බඳනා ලෙස අණ දීලා
ගිය ගිය තැන මරහඩ නගනා වල්
අලි ලහට හීලවුණු අලි යවලා
පිය නගමින් වටකරගත් විට
සැනෙකින් සිදුවිය මේ අවුලා[11]

මෙසේ දඩුවැට ගසා අලි රැළ ගාල් කළ විට සිදුවූයේ විපතකි. රැළේ නායක ඇතා "පනාමුරේ ඇත් රාජා" අනෙක් ඇතුන් බේරාගැනීමට කළ සටනේ අන්තිම ජවනිකාව වූයේ සිය දිවි පිදීමට සිදුවීමය. මේ අපරාධය ගැන ගැමියෝ කම්පාවූහ.

247. මගෙ බුදු අම්මේ රැළටම නායක
ඇත්රජ දඩුවැට දුටු හැටියේ
මහහඬ දම්මේ වනය කම්පාවී
කණ් අඩි පුපුරන ලෙස අටියේ
නැත දුක නොමිනේ ජාති ආලෙ
ගැන ජීවිත පිදුමට කැප වූයේ
කාගෙ වුවත් හදවත් දෙදරනවා
මේවා ඇසුවොත් දුක් වූයේ[12]

---

10. – 12. රත්නපුරේ ජනකවි 58 පි.

248. ඔයින් මෙයින් වනයේ අලි අරගෙන
    ඇත් රජුගේ කකුලක් බැඳලා
ගුවන් කුසේ දෙවියනි බැඳි කඹයත්
    කඩාගත්ත වෑයම් කරලා
එයින් පසුව කඹ පොට තද වීලා
    ඇඟිලි සමග කකුලක් කැපිලා
බලන් ඉන්න බැහැ සිදුවුන දේනම්
    යන තරමයි හදවත පැලිලා[13]

249. සිය පවුලේ සිටි ඔක්කොම හසුවුනි
    බේරෙන්නට බැරි මර උගුලේ
ලය පත්ලෙන් ගිනි මතුවුන හින්ද
    ජාතිය ගැන තිබෙනා ආලේ
බියවී ඉන්නා කාලයෙදී උණ
    ඉවසුම නැතුවම හැම වේලේ
ජය පෙන්නාලා අනෙක් ඇතුන්හට
    ඇඩුවා තැන තැන ගොස් ගාලේ[14]

250. තිරිසන් ජාතියෙ උපනත් පවකින්
    පෙරකී කළ පින් වැඩි හින්ද
බලසම්පන්නව ඉපදී රජ කුල
    ඔටුණු පැළඳ ජාතිය හින්ද
අවසන් බිම ඇත්රාජය ඉඳගෙන
    රාජ විකුම් හසරැළි බන්ද
නගමින් හොඬවැල හීල ඇතුන්හට
    පහර දෙමින් බිම දැමුවෙන්ද[15]

13. රත්නපුරේ ජනකවි 58 පි.
14-15. රත්නපුරේ ජනකවි 59 පි.

251. වටකරගෙන උන් ඒ අලිබිය වුණි
බිම වැටුණා ලොකු ඇත් ගොව්වා
වැට කඩමින් ඇත් රළ ගෙනයාමට
රජා බොහොම උපමා සෙව්වා
වැට මැද ඒ අලි මරණෙන් බේරෙන
ලෙසටත් ඒ මේ අත දිව්වා
රටදැය එසමයෙ වැඩ ඇති මොලමුරෙ
මැතිඳු ඇවිල්ලා වෙඩි තිව්වා[16]

252. අහල පහල වැජඹෙන ධනපතියන්
හා තිලධාරින් එහි කැඳවා
වලල්ගොඩේ මහ රාළහාමිගේ
ගුරු උපදෙස් පිට වැඩ කෙරුවා
දවල්කාලෙ කෑ ගසමින් නද දෙන
මදුරුවො තලමින් ගිනි මොලවා
හවුල්වෙමින් කළ මේ අපරාධය
ඇසූ-දුටු අය කම්පා වෙනවා[17]

1888 වර්ෂයේ සිට 1921 වන තුරුම කොළොන්නෙ ජේ. ඩබ්ලිව්. මඩුවන්වල දිසාපති විසින් අලිගාල් කිරීම සිදු කොට ඇති බවත්, ඉන් පසු කලවානේ දිසාපති විසින් අලි ගාල් කළ බවත් සබරගමු ජනකවියෙන් හෙළිවේ.

253. කොළොන්නෙ තිබෙන මඩුවන්වෙල
මහ වලව්වෙ එතුමා වැජඹෙනවා
සොඳින් දිසා මැතිඳුට ජේ.ඩබ්ලිව්
මඩුවන්වල නම පවසනවා
අහන්න ඒ නම ලොව සත කීමෙන්
ගිනිමෙන් ඉන් රැස් විහිදෙන්වා
තෙදින් යුතුව සිය කටයුතු කෙරුවෙන්
රජයත් එතුමට බිය වෙනවා[18]

16. රත්නපුරේ ජනකවි 59 පි.
17. රත්නපුරේ ජනකවි 57 පි.
18. රත්නපුරේ ජනකවි 60 පි.

254. ඔහොමම වැජඹෙන විටු මඩුවන්වල
සොහොයුරු ආලෙන් සිත් පැහැදී
පෙර සිට පැවැතෙන කරුණක් සිහිවී
ලෝසත කැඳවා පහදදී
බැලුමට ඇත්ගාලක් අත දීලා
තිලධාරින් කැඳවා මුලදී
කදිමට අත්බැඳ ගත්තලු අටසිය
අසූ අටේ එන කාලේදී[19]

255. එතැන් පටන් නවසිය විසිඑක
වනතුරු එතුමගෙ ඇත් ගාලේ
කොතන ඉඳලා අලි බැන්දත් ආවලු
විසි දෙවරක් මේ කුරු රාලේ
හිතෙනා සැටියට වැඩ කළ වීරය
ඒ පරලොව පත්වුන කාලේ
එතන එයින් පසු අලිබැන්දේ
කලවාන දිසාපති සිටි කාලේ[20]

පනාමුරේ ඇත්ගාල හා "පනාමුරේ ඇත්රාජා" පිළිබඳ පුවත මෑත ඉතිහාසයේ මහත් ආන්දෝලනයක් ඇති කළ පුවතක් විය.

වෙඩි පහරකින් මියගිය ඇතින්නියගේ පැටවා ඇගෙන් කිරි ඇදගෙන බොන ආකරය දුටු ජකවියාට සිතුනේ සතරවරම් දෙවි ඇති කාලෙයක නම් ඇතින්නිය නැගිට එන බවයි.

කරවට දිළිසුණු ගෝමර - මෙන්ම වෙඩි වැදී පිම්ම පනින විටම මැලවී යන ආකාරය ද ජනකවියාගේ මතකයට නැගිණි.

19-20. රත්නපුරේ ජනකවි 60 පි.

256. අඹගහතැන්නේ මැරූ ඇතින්නගෙ
කරවට ගෝමර දිළිසෙන්නේ
වෙඩිල්ල වැදිලා පිම්ම පනින කොට
කරවට ගෝමර මැලවෙන්නේ
සැණෙකින් වස්සා දුවගෙන ඇවිදින්
මළකුණයෙන් කිරි ඇද බොන්නේ
සතර වරම් දෙවි ඇතිකාලේ නම්
අම්මා සැණෙයෙන් නැගිටින්නේ[21]

අලි- ඇතුන් වාසය කරන ඝන වන පෙදෙස්වල ඇත්ගාල් බැඳ -ඇතුන් අල්ලා විකුණා මුදල් ලබාගැනීමට ගම් ප්‍රදානීහු පියවර ගත්හ. රත්නපුරේ ඇහැළියගොඩ කරදන ප්‍රදේශයේ ද කඳුවල ගැවැසෙමින් සිටි අලි- ඇතුන් අල්ලාගැනීම පිණිස කුරුවිට කෝරළේ රටේ මහත්මයා වූ ඇලෙක්සැන්ඩර් එක්නැලිගොඩ මහතා විසින් 1892 දී පමණ වැවිල ඇත් ගාලක් බඳිනු ලැබීය. අක්කර 34 ක පමණ ප්‍රදේශයක් වටකොට විශාල කොට සිටුවා, මාවර බැඳ දඬුවැට ගසා ඇත්ගාල වෙන්කළ බව ජනශ්‍රැතියේ එයි. එහි අලි ඇතුන් 18 දෙනෙක් අල්ලාගෙන ඇත.[22]

කරදන ප්‍රදේශයේ අන්තිමට ඉතිරිවූ ඇතාද ගල් පර්වතයකින් පෙරළී මිය ගියේය. එම පුවත ගැමි කවියෙක් දුටුවේ මෙලෙසිනි. මෙසේ ඇත්කවි රාශියක් සබරගමු පළාතේ ජනකවියට එක්වී ඇත.

257. සකවරුසේ එක්වා දහසේ
අට සියකි මෙසේ තැන පලවෙව්වී
බිනර මසේ ජලවක සැලසේ
ඉරිදු දවසේ ඉර පායව්වී
එම විලසේ ඇතු ගලට බැසේ
මග යන විලසේ ගොස් වැරැදිව්වී
ඇතු සතොසේ යටිපව් පියසේ
කන්දකි මෙලෙසේ ඇතු පෙරලිව්වී[23]

21. ජනසම්මත කවි ගී 110 පි.

22-23 කරදන 54-56 පි.

258. කරුමෙ කෙරුවග දන්ගන්නට හැකිය
මෙයින් සැහෙයි ගොල්ලේ
අරුම පුදුමවල් ඇසුවද මෙහෙමට
ගජතුන් වටුණා ගල පල්ලේ
බොරුම නොවෙයි මේ ඇතාව වැටුනේ
කරපු දෙයක් සේ එක එල්ලේ
උරුම වෙන්ට තිබුන ද මේ ඉරණම
යටිපව් කන්දේ ගල පල්ලේ[24]

259. කෙරිච්ච තෙරතුරු ගජතුට මේ ගැන
අසළ සිටිය ළමයෙක් දුටුවා
ඇහිච්ච හැටියට ගසක් කඩන හඬ
කන්දේ ගල මුදුනේ දුටුවා
පලච්චගල උඩ ජලක් තිබීලා
එනකොට මරු ළඟටම ආවා
වැටිච්ච තැන සිට මැරිච්ච ඉඩමට
හැත්තැපහයි බඹ මැන බැලුවා[25]

260. ඇතු පෙරලිච්චී - ගලෙන් වැටිච්චී
දත පොඩිවෙච්චී හිරියන්ඩා
ගස් ඉදිරිච්චී - ගල් පෙරලෙච්චී
පාර හැදිච්චී පවතින්ඩා
ගල උඩ වෙච්චී - මරු ළං වෙච්චී
අද බැරිවෙච්චී ගැලවෙන්ඩා
කිරි අප්පොච්චී ඇතු අද වෙච්චී
ගලෙන් වැටිච්චී පණයන්ඩා[26]

24-26. කරදන 56 - 57 පි.

261. මන්ද මන්ද මේ පුරතල් ඇත්රජ
    ඇවිදින් ගල මුදුනට    පැන්නේ
දන්ද දන්ද මේ ඇතා වැටුන සැටි
    කල්පනාව සිහියට    ගන්නේ
කන්ද කුන්ද සොද යටිපව් පියසේ
    කන්දේදි පව් පළ    දුන්නේ
කුන්ද ගහිති ගත කුන්ද ගහිති ගත
    තාලෙට ගල පල්ලට    වැටුණේ[27]

මන්ද -මන්ද, දන්ද - දන්ද, කුන්ද - කුන්ද, කුන්ද ගති ගත, කුන්ද ගහිති ගත අලියා වැටුණු ආකාරය දක්විමට ජනකවියා යොදු ගන්නේ එවන් බස් වහරකි. එය නැටුමක් සේ දක්විමට උත්සාහ කළාසේ ය.

262. අපොයි හැබෑටම ඇතෙක් වැටුණු හැටි
    මෙහෙම දෙයක් ඇහුවද    මිතුරේ
ටිකක් කියම් මම ඇසුවද ඒ වග
    ගස් ගල් පොඩිවුනි වැටුණු    සැරේ
හෙනක් ගසනු මේ හැමටම ඇහුනයි
    යටිපව් කන්දේ    බස්නහිරේ
රටක් වටින මේ ඇතාව මැරුනේ
    ගල පල්ලේ ගස් දෙක    අතරේ[28]

263. ඇතෙක් නොවෙයි ඇත් රජෙක් තමයි
    මොහුරාජ කුලේ උපදින්ට    ඇතී
දළක් දිගයි දළ ලොකුත් නැතෙයි සකි
    ඇනුමට කැඩිලා වෙන්ට    ඇතී
ගලක් නොවෙයි මරු ඇවිත් සිටිය මයි
    පුරුවෙ පව් පල දෙන්ට    ඇතී
බොරුත් නොවෙයි මේ හැබෑව මයි සකි
    ඇතුගේ සලකුණු මෙලෙස    වෙති[29]

27 - 29.කරදන 57 - 58 පි.

ජනකවියා මෙම පුවත ඉදිරිපත් කර ඇත්තේ එක් අනුවේදනීය සිදුවීමක් ලෙසිනි. මරණය පිළිබඳ ජනකවියාගේ දෘෂ්ටිය ඉන් හෙළිවෙයි. 'ගලක් නොවෙයි මරු ඇවිත් සිටිය මයි පූරුවෙ පව් පල දෙන්ට ඇති' නැවත ඉපදීම, පුනර්භවය පිළිබඳ ජනකවියාගේ විශ්වාසය ඉන් හෙළිවේ. ඇතාට සිදුවූයේ පෙර කරුමයක් පළදීමකි.

ඇතෙකුට සිදුකළ විපතක් දක්වෙන සබරගමුවේ ජනකවියකි මේ. එහෙත් සිදුවූ විපත කුමක්දැයි ජනකවියෙන් හෙළි නොවේ.

264. දුන්න අරන් මා අලුයම යනකොට
ඇතු සිටියයි මගෙ දෙපාමුලේ
දුන්න මිසක් මට වෙන පිහිටක් නැත
දෙවි පිහිටයි මේ කඳන් කැලේ
දුනු හීතල ඇද සතරක් විද්දයි
එකකුත් නොවැදුනි ඇතුගෙ බලේ
මෙච්චර බලගතු ඇතාට කළ වැඩ
බලන්ට යමු අපි කඳන් කැලේ[30]

මෙම පුවත තවත් ආකාරයකින් ජනශ්‍රැතියට එක් වී ඇත.

265. දුන්න අරන් මා අලුයම යන කළ
ඇතු සිටියයි මගෙ දෙපා මුලේ
දුනු රිතල් කැට සයකින් විද්දෙමි
එකකුත් නොවැදුනි ඇතුගෙ බලේ
වන්නි රටේ රජු ඇතෙකුට දුන් බැට
බලන්ට යමු අපි කඳන්පලේ
දුන්නෙ පිහිට මිස වෙන පිහිටක් නැත
රැක දෙන් දෙවියනි තිසන්සලේ[31]

මේ ආකාරයෙන් ඇත්කවි රැසක් සබරගමුවේ ජනකවි ක්ෂේත්‍රයට එක්වේ.

30. රත්නපුරේ ජනකවි 33 පි.

31. ජන සම්මත කවි ගී 110 පි.

# සබරගමු ජනකවියට එක්වූ වෙනත් - විවිධ හා විශේෂ සංකල්පනා

# 9

සබරගමුවේ ජනකවියා සංකල්ප රූපයක් මවයි. වට්ටිය ඉස මතය. දත වැනෙයි. සිනා සිසී යන ගමන ලස්සනයි. මේ යන ගමනට ජන කවියාගේ සිත ඇදේ. ඇයට ඉනාවක් දී හෝ ඇය තමාට කැමැතිකරවා ගැනීමට ජනකවියා අපේක්ෂා කරයි.

266. වනා දත වට්ටිය ඉස තියා ඉද
සිනාසිසී යන කොට මොන ලස්සනද
මෙයාකාර ආදර කුමට බැඳුනද
ඉනා බෙහෙත් දෙන වෙදරාළ මැරුනද [1]

'වනා දත - වට්ටිය ඉස තියා ඉද - සිනා සිසී යන කොට- මොන ලස්සනද?' යන වචන ඇසෙන විට රූපත් තරුණ වට්ටි අම්මා ඉදිරියට එන්නාසේ පෙනේ.

මැය නැතිවිට ගම පාළුය - ඇගේ වචන ළඳ බොළඳය. මුහුණ රිදී තැටපතක් සේ පවිත්‍රය. කොණ්ඩය රන කිතුල් මලක් මෙන් දිගැටිය. ජනකවියා දුටුවේ එවැනි සුන්දර සුරූපියකි.

267. කොණ්ඩෙ නුඹේ කිතුලෙන් කළ වැඩක් වගේ
මූණ නුඹේ රිදියෙන් කැඩපතක් වගේ
කතා නුඹේ කිරි දරුවකු වචන වගේ
නුඹ නැතිද අපෙ ගම පාළුවට වගේ [2]

නෝනා එන්නේ පන්සල් ගොසිනි. ඇය බැඳි කොණ්ඩය බට්ටෙක් මෙන් කුඩාය. පුංචි කෙල්ලක් ඇය ඉදිරියෙන් යයි. ඇය කුඩා බව ජන කවියා හැඳින්වූයේ 'කුක්කෙක් විතර' යයි කී මෙනි. 'නොන්නො' ඇඳ සිටියේ රටක් විටින පට කම්බායකි. ඇය

---

1. රත්නපුරේ ජනකවි 18 පි.
2. රත්නපුරේ ජනකවි 42 පි.

පන්සල් ගොස් එන බව ජන කවියා දන සිටියද 'පන්සල් ගොසින් එනව ද නොන්නෝ උඹලා' යනුවෙන් අසා නොසිටීමට ජනකවියාට නොපුළුවන් විණ. මිනිසුත් - ඇයත් අතර සබඳතාවය - හෙළ හිත රැකගත්තේ එසේ ඇසීමෙනි.

268. බට්ටක් විතර කොණ්ඩේ පස්සට බැඳලා
කුක්කෙක් විතර කෙල්ලක් ඉස්සර කරලා
රටක් වටින පට කම්බායක් ඇඳලා
පන්සල් ගොසින් එනවද නොන්නෝ උඹලා [3]

ජනකවියා යෙදූ උපමා අගෙයි. 'බට්ටක් විතර කොණ්ඩය' - 'කුක්කෙක් විතර කෙල්ලක්' - 'රටක් වටින පට කම්බා' ජනකවියා යෙදූ උපමා විය. 'රටක් වටින' යන්නෙන් කම්බායේ වටිනාකම මෙන්ම, දකුම්කළු බව ධ්වනිත කරයි.

සබරගමු ජනකවියා කී මේ සීපදය, කියවන විට අපූරු කැමක් රසවිඳීමට අපට ආශාවෙයි. එහෙත් ඒවා ලැබෙන්නේ අපට නොව, පැල් රකින්නන්ට පමණි.

269. අද්දර පැලේ මම වැස්සට සිටින කල
ආවා ගොවිරාළ මුලකුත් ගෙන එකල
මොනවද කියල මම ලිහලා බැලුව කල
කැකුලෙන් බතකුයි මාලුව මයියොක්කා අල [4]

කාලෙකින් පිපෙන තල මල කදිම දර්ශනයකි. එක එල්ලේ සැදුනු තලගස් හතරක මල් සතරක් එකවිට පිපීම දුලබ දසුනකි. එම අලංකාර තල මල් සතර සුළඟට වැනෙනවිට කෙතරම් පියකරුද? චමත්කාර ජනක ද? සබරගමුවේ ජනකවියා මෙම අරුම පුදුමය දුටුවේ රක්වානේ ගම් පියසකිනි.

---

3. රත්නපුරේ ජනකවි 21 පි.

4. රත්නපුරේ ජනකවි 23 පි.

270. එක එල්ලේ ගස් සතරක් සැදීලා
ගස් සතරේ මල් සතරක් පිපීලා
අලංකාර මල් සුළඟට වැනීලා
සුරපුර රක්වානෙ තලමල් පිපීලා [5]

මේ ආකාරයටම බදුල්ලේ තලමල ගැන කී කවියත්, එතරම් අපූර්වත්වයක් විඳ ගැනීමට අපට නොහැකිවේ.

271. එක පේළියට ගස් සතරක් සැදීලා
ඉන් එක ගසක තල් ගොබයක් ඇදීලා
අලංකාර ලෙස සුළඟට වැනීලා
සුරපුර බදුල්ලේ තලමල පිපීලා [6]

මේ තවත් තලමලක් ගැන සීපදයක් කීමට ගත් උත්සාහයකි. එකෙකුට සීපදය ගොතාගත නොහැකි විය. තවෙකෙක් හවුල් විය. දෙදෙනාම ගෙතුවේ පද දෙකකි. දෙදෙනාටම නොහැකි වූයෙන් තවත් කෙනෙකුගේ සහාය අවශ්‍ය විය. ඔහුට හැකි අයුරින් අනෙක් පද දෙක කීවේය. පද සතරින්ම තලමල ගැන යමක් සඳහන් නොවීය.

272. එගොඩ ගොඩට තල මලකුත් පිපිජ්ජා
මෙගොඩ ගොඩට ඒ තල මල පෙනෙජ්ජා
පළමු පදය කීවේ අප්පුවජ්ජා
දෙවන පදය කිවේ උගෙ හුවජ්ජා [7]

බොහෝ තලමල් කවි වලින් මල දැක්මෙන් තමා තුළ උපන් චමත්කාරය දක්වීමට ජකවියා වෙහෙස දරා ඇත. තල මල ගැන කියැවෙන සමහර ජනකවි තුළින් මලේ වරුණ තබා, කිසියම් තොරතුරක් පවා දැන ගැනීමට නොලැබේ. 'තලමල පිපිච්චි - දැන් පරවෙච්චී' සීපද කුමටද? මේ ජනකවියා කීවේ එපමණකි.

---

5. රත්නපුරේ ජනකවි 37 පි.
6. රත්නපුරේ ජනකවි 37 පි.
7. කුකුළු කෝරළේ ජනකවි සහ ගැමි සංස්කෘතික ලක්ෂණ xv පි.

273. ඇලපාතයි යන නම ගම පලවෙව්වී
මල පිපිව්වී ඉඩමේ නම නැතනිව්වී
සුළඟට ඉතිරිලා තල මල පිපිව්වී
සීපද මොටද තලමල දූන් පරවෙව්වී[7/1]

සබරගමුවේ ජනකවියාට පෙණුනාසේ ම අපට ද සිතෙන්නේ, දුප්පතාට කැඳ පොදක් වත් නොදෙන පොහොසතුන්ගෙන් සමාජයට පිහිටක් නොවන බවයි.

274. තද දුකේ වැටී සිටිනා දුප්පත්තු
කැඳ දූකේ ඊට නොයොද තම වත්තු
අද ලකේ සිටින මහතුනෙ බලවත්තු
බලුපුකේ බැන්ද මීයක සිරි ගත්තු[8]

ජන කවියා යොදන උපමා ගැමි සුවඳ විහිදුවයි. 'බලුපුකේ බැන්ද මීයකින්' කාට නම් පිහිටක් වේද?

සබරගමුවේ ජනකකවියා පරිසරයේ සුන්දරත්වය නිර්ව්‍යාජත්වයෙන් දුටුවෙකි.

'අරණ දිගේ ලතණ කකා - අහර දහර පා - අං සොලව සොලවා - මුවාවකට මුවා වෙවී- මුවාද අර එන්නෙ'? 'මුවා ද අර' යන වචනය සය වරක් යෙදීමෙන්, මුවා සෙමින් සෙමින් පා තබමින් මුවාවකට මුවාවෙමින් එන ආකාරය අපට පෙනෙන සේය. සංකල්ප රූප මැවෙන සේය.

275. මුවාද අර - මුවාද අර - මුවාද අර- එන්නේ
මුවාවකට මුවා වෙමින් - මුවාද අර- එන්නේ
අරණ දිගේ ලතණ කකා - මුවාද අර- එන්නේ
අහර දහර අං සොලවා - මුවාද අර එන්නේ[9]

---

7/1. කුකුළු කෝරළේ ජනකවි 08 පි.
8. රත්නපුරේ ජනකවි 43 පි.
9. රත්නපුරේ ජනකවි 15 පි.

'මුවාවකට මුවා වෙමින්'
'අරණ දිගේ ලතණ කකා'
අහර දහර අං සොලවා' යන වචන කිහිපය හැරෙන විට, අනෙක් වදන් සියල්ලම 'මුවාද අර එන්නේ' යනුවෙන් පුනරුත්තියක් සේ නිතර නිතර යෙදුනද ජනකවියා මවන සිත්තම ඒ ආකාරයෙන්ම දක ගැනීමට අපට හැකිවේ.

වගාවට ආල පාලු කරන වල් සතුන් පැමිණෙතැ'යි දැඩි අපේක්ෂාවෙන්, පැල් රකිමින්, ඈත බලා සිටි පැල් රකින්නෙක් දුටු දර්ශනයක් ජනකවියට විෂය වී ඇත.

මහළු වියට පත්වූ විට නාකි සීයලාට තිරිහන් තරුණියෝ කවට කම් කරති. ඔච්චම් කරති.

276 දුරුවන් ගරු කතර ඇවිදින් වැටිච්චම
හරියන් රෙදි මාලු ඇඳලා ඉරිච්චම
තිරිහන් වයස පසුවී මාලු වෙච්චම
තිරිහන් ගෑණු මා දුටුවාම ඔච්චම[10]

මහ තොටදී හමුවූ තරුණියක් දකීමෙන් හටගත් රාගික හැඟීම් සබරගමුවේ ජනකවි තුළින් හෙළිවේ. තරුණියන් තරුණයන්ට කී පෙම් බස් සහ තරුණියන් තරුණයන්ට එල්ල කළ පිළිතුරු ඉන් අනාවරණය වේ.

277. හකුරු කන්ට ගිය කල පුස්සල කන්දේ
හකුරු ලියක් සිටියයි උන්නේ කන්දේ
කැකුළු තන දෙකට මගෙ සිත ලොබ බැන්දේ
හකුරු කාපු කල කට තිත්තයි නැන්දේ[11]

278. පණු කොටෙක් ඇවිදින් අපගෙ කන්දට
හකුරු පැණි ටිකක් තිකමට දුන් වරද්දට
යන එන ගමන් කවි සීපද කීයයි මට
මගේ තන දෙකෙන් උණු වරද මොකද තමුසෙට[12]

10. කුකුළු කෝරළේ ජනකවි 09 පි.
11. කුකුළු කෝරළේ ජනකවි 14 පි.
12. කුකුළු කෝරළේ ජනකවි 14 පි.

279. කැකුණ කන්ට ගිය කළ උමගේ පල්ලේ
කැකුණ තල තලා ඇලිසා ගල් තල්ලේ
කැකුළු තන දෙකත් එනවා එක එල්ලේ
කැකුණ තලන්නට මම එන්නද කෙල්ලේ[13]

"හකුරු කන්ට ගියකළ" හා "කැකුන කන්ට ගියකළ" කැකුළු තන දකීමෙන් ඇතිවූ මනෝභාවයන් ඉන් හෙළිවේ.

ඔහු රන් එතනා ගේ නිවස දෙසට හැරුනේ බටහුල පත්තුකර ගැනීමටය. ඔත්තු බැලීමට නිවස අසළ එකෙක් තබා "වස්තුබබා" එතනා ගේ නිවස තුළට රිංගාගෙන ඇයට සැපදෙයි. එතැන "සමයම් පොලකි".

280. පත්තුකර ගන්ඩ බට හුල වම් අතට
ගත්තු ගමන් ඉදිකොළ තොප්පිය අතට
ඔත්තු බලයි බඹරෙක් සමයම් පොලට
"වස්තු බබා" සෙත දෙයි රන්එතනාට[14]

"වස්තු බබා සෙත දෙයි රන් එතනාට" යන්නෙන්, සිදුවන්නේ කුමක්දැයි අපට හැඟේ. ඉන්පසු කුමක් වීදැයි ජනකවියා සඳහන් කර නැත.

මාළු - කැමට දක්වූ කැදරකම සබරගමුවේ ජකවියෙන් හෙළිවන අවස්ථා හිඟ නොවේ.

281. ගමනක් යන්ට ආකල මං දං ඔන්න
අතර මගදි ඇල්ලූ මගුරන් දෙන්න
දුන්නා ගෙදරකට ඒ ටික උයවන්න
බොකු දහරයි වල්පත් දෙක මට දුන්න[15]

මගුරන් දෙදෙනෙක් දී ඔහුට ලැබුනේ වල්පත් (වරල්පත්) දෙක හා බොකු දහර පමණි. මොහුට ලැබුනේ හොදි පමණි.

---

13. කුකුළු කෝරළේ ජනකවි 14 පි.
14. කුකුළු කෝරළේ ජනකවි 18 පි.
15. කුකුළු කෝරළේ ජනකවි 11 පි.

282. වස්කඩුවෙන් ගෙනා -මාලු රසකරලින් උයලා
අපෙත් ඔහේ බඩුවක් ඇත කුකුළෙගමට දීලා
අපිත් නගෝ කන්න හදමු අර ගොයියට තියල
තිල් කපුට හිනා ගියයි හොදි හැදිගා බලලා[16]

රත්නපුරෙන් ගෙනා කුම්බලාවා, අතර මගදී 'හොරකිරියා' ගේ කටට පැන්නේය. කුම්බලා කරවලයා අමු අමුවේ ගිල දැමූ පුවතකි මේ.

283. රත්නපුරෙන් කුම්බලාවෙක් ගෙනාවා
ගල උඩ ගෙදරටයි උගෙ කල්පනාවා
මගදි කටට පැන්නා කුම්බලාවා
හොර කිරියෝ දිය මගේ කුම්බලාවා[17]

මෙවැනි සිදුවීම් ආශ්‍රිත ජනකවි වලින් සමාජ චරිත නිරූපණය වේ. සමහරුන්ගේ චරිතය ක්‍රියාවෙන් නොව ඇඟපතින් පවා නිරූපණයවේ.

284. ලබ්බ ලෙසට බඩ පුරවා ඉස්සරට
තට්ටෙ පෙනෙයි කිරිමානාගල ලෙසට
කට්ට කමට වැදිලා හෙන එක දිගට
තට්ටෙ පැලීයන් කරනා අනඩුවට[18]

අන් හිමියන් පිළිකුල් කරන, බිරියෝ ද, තම හිමියාට සෙත් සලසන සිතක් නැති බිරියෝ ද සමාජයේ එමට සිටිති. මෙවැනි ගැහැණුන්ගේ ගුණ-නුගුණ සබරගමු ජනකවියෙන් හෙළිවේ.

285. පින්වත් අතුම් ගුණවත් ස්වාමි බාරිට
අන් හිමියන් පිළිකුල් ගැරැඩින් ලෙසට
තම හිමි දෙව් ලොවේ සුරකුමරකු ලෙසට
පතිවත රකියි බාරිය ස්වාමි මෙම ලෙසට[19]

16. කුකුළු කෝරළ් ජනකවි 19 පි.
17. රත්නපුරේ ජනකවි 23 පි.
18. කුකුළු කෝරළ් ජනකවි 20 පි.
19. සපරගමුවේ ජනකවි 66 පි.

286. ගමේ ගොඩ් සැමතැන තිවසක් ගානේ
අනේ හිමිගෙ දෙසමයි ළඳ පවසන්නේ
වනේ වෙසෙන දිවිදෙන මෙන් ගොරවන්නේ
සෙනේ සිතක් නැත හිමිහට එළදුන්නේ[20]

උපදේශ හා පිරුළු රැසක් ද සබරගමු ජනකවියට එක්වී ඇත.

287. රත්දේදුන්න වෙල් එළියට පියකරුය
කත්දේගෙදර නැන්දට දුන් හොඳ සරුය
දුන්දේ මතක දුන් අය ළඟ ඇති තුරුය
තින්දේ පෙනෙන සීනය උදයට බොරුය[21]

තින්දේ දී පෙනෙ සීනය උදයට බොරුවනේය. දුන් අය ළඟ ඇති තෙක් පමණක් දුන්දේ මතක ඇත. පසුව අමතක වෙයි.

රත්දේදුන්න වෙල් එළියට පියකරුවන්නාසේ කත්දේ ගෙදර නැන්දට කළ එළියක් ඇත. ඒ හොඳට සරුසාර වී ඇති බැවිනි. දේදුන්නේ පියකරු භාවය පවතින්නේ මද වේලාවකි. ජනකවියා දුන් උපදේශය ඉතා අගනේය. රන් කළ ගෙඩිය බිඳුනත් එහි අගය නම් අඩු නොවේ. ඒ ජනකවියා දුන් තවත් උපදේශයකි.

288. රිදුනොත් පාර හොරවෙයි තව තව අඩිය
මුදුනත් උස උනොත් එය පල්ලම වැඩිය
යොදුනක් ගිය තැනලු කළුතර ජය කොඩිය
බිඳුනත් අගය අඩුනැහැ රන් කළ ගෙඩිය[22]

මේ ගැල්කරුවකුගෙන් කියවුණු සිව්පදයක් ලෙස හැඟේ. එහි 'ජය කොඩිය' යනු තමා ගමන් කළ යුතු වූ දුරයි. එය යොදුනකි. එය සැතපුම් හතරක් පමණි. ගොනාගේ අඩිය රිදෙන විට තව තවත් ගමන පමාවෙන්නේ අඩිය හොරට තබන බැවිනි. හමුවන කඳු මුදුන් ද ජයගතයුතුවේ. මුදුන නැගීම පමා වුවත්

20. සපරගමුවේ ජනකවි 67 පි.
21. සපරගමුවේ ජනකවි 106 පි.
22. සපරගමුවේ ජනකවි 22 පි.

පල්ලම නම් යෑම පහසු ය. මේවා සිහිකරන ජනකවියා සතරවන පදයෙන් අනගි පිරුළක් ඉදිරිපත් කරයි. එනම් 'රන් කළය බිඳුනත් එහි අගය අඩු නොවන බව'[23] යි.

ඔළුවේ හයිය ඇද්දැයි කලක ගසා බලන්නේ නැත.

289. ඔළුවේ හයිය ඇද්දැයි බලනට ජපනා
සිංගප්පූරුවේ ගල් පොත්තක හැපුනා
මේ ටික කිය කියා නිතරම උඩ පනිනා
කටකාරියකි වල්ගම්පොත කළුඑතනා[24]

'කටින් සිටවනා කොළවල බතල නැත'[25] කටින් සිටුවනා බතල කොළ වල අල බසින්නේ නැත.

290 රටින් රට වහින වැස්සේ වතුර නැත
විටත් විට අදින දබරේ රවුම් නැත
හෙමින් කියපු සිව්පද මට ඇසුනෙ නැත
කටින් හිටවනා කොළවල බතල නැත[26]

මුදල් නොමැතිව බඩු ගැනීමට ගොස් නුදුන්විට තරහ නොගත යුතුය.

291. ඉල්ලාගෙන එපා යන්නට බඩු ණයට
දෙන්න එපා කීවා මුදලාලි මට
ගන්න එපා මිළ නැත්නම් බඩු අතට
යන්ට එපා රොස්වී බඩු නොදුන් විට[27]

23. සසඳන්න :– වැදුනත් තද පුළඟ සෙළවෙන්නෙද ගව්ව
බිඳුනත් රන් බඳුන මිල අඩු නැත කිව්ව
කැඩුනත් අම්බලම කොට වන්නෙද ගව්ව
නැණවත් පුබුදනට අපහස නොකරව්ව
– ජනකවි සියපත 06 පි.
24. රත්නපුරේ ජනකවි 17 පි.
25. සසඳන්නා:–
කටින් සිටෙව් බතල කොළේ අල නැතිවූ විට මව්වුව
– පිරුළු මිණි 64 පි.
26. රත්නපුරේ ජනකවි 17 පි.
27. රත්නපුරේ ජනකවි 17 පි.

සබරගමුවේ ජනකවියා දෙන උපදේශය අගෙයි.

හැම ගුණයකටම වඩා මව් ගුණය උතුම්ය. සබරගමුවේ ජනකවියාටද එය එස්ම විය.

292. කෝන්ගස්රුප්ප මුහදට පෙනෙයි පෙනෙයි
මුහුදේ මරු පාරු දසතට පෙනෙයි පෙනෙයි
අම්මගෙ දෙතන කිරි මුහදට ඉසෙයි ඉසෙයි
අම්මා විදින දුක සමනළ කොතට පෙනෙයි[28]

කුසගිනි නිවෙන තරමට - කිරි මුහුදක් තරමට - අම්මා ළඟ කිරි ඇත. එහෙත් දරුවන් නිසා අම්මා විදින දුකද සමනළ කොත තරමට උසය. දරුවන් නිසා දැඩි දුක් විදින අම්මාවරුන්ට දෝෂාරෝපණය කරන දරුවන්ද ඇත. ජනකවියා ඔවුනට උපදේශයක් දෙයි.

293. බිම ඉරිතලාලායි බිම්මල් පිපෙන්නේ
කඳ ඉරිතලාලායි රට කඳ පිපෙන්නේ
දස මස පිරිලයි අම්මා වදන්නේ
එසෙව් අම්මාට ඇයි තොපි බනින්නේ[29]

අම්මාගේ වටිනාකම දනෙන්නේ අම්මා නැතිදටය. මිය ගිය අම්මාට වුව ද නැගිට එන ලෙස අඬගසන්නේ එබැවිනි.

294. කිරිමදු කොළ - කිරිමදු කොළ කිරි අම්මේ
කිරට හඬන කිරි දරුවොය අපි අම්මේ
අනුන් දෙන බතට බඩ නොපිරෙයි අම්මේ
ගෙදර යන්න නැගිටින් මගේ බුදු අම්මේ[30]

28. සපරගමුවේ ජනකවි 28 පි
29. සපරගමුවේ ජනකවි 29 පි.
30. රත්නපුරේ ජනකවි 17 පි.
සසඳන්න - කිරිමදුවැල් කිරිමදුවැල් කිරි අම්මේ
අපිත් කිරට හඬනා ළමයින් අම්මේ
අනුන් දීපු බත් බඩ නෙපිරෙයි අම්මේ
ඇක ඉදන් මට අඬගහපන් අම්මේ
සපරගමුවේ ජනකවි 113 පි.

ගෙදර බුදුන් අම්මා-බවද ජනකවියා සිහිපත් කරවයි. අම්මාගේ ලේ කිරට හැරෙන්නේ දරුවන්ට සෙනෙහස නිසාය.

295. එගොඩ ගොඩේ වැහි වැහැලා  වැහි  බින්දු
මොගොඩ ගොඩේ පිනිබාලා  පිනි  බින්දු
කැලේ ගසක මොර ඉදිලා  පැණි  බින්දු
මව්ගෙ තනේ කිරි එරිලා  කිරි  බින්දු[31]

අම්මා ගෙදරින් පිටත්වූයේ දබර වීමෙනි. මල්ලි හඩන්නේ කිරි නැතිවය. සතරවරම් දෙවියෝ මේ දුක බලත්වා ! රාත්‍රියේවත් අම්මා නැවත පැමිණේය, යන අපේක්ෂාව දරුවන් තුළ රැඳී ඇත.

296. අම්මාගියා ඒ ගෙදරින් දබර  වෙලා
මල්ලී හඬයි රස කිරිටික මතක්  වෙලා
සතරවරම් සැම දෙවියෝ මෙදුක  බලා
අම්මා වරෙන් හඳපානේ පිටත්  වෙලා[32]

මෙවනත් ගුණ පිරි අම්මාට වැඳීමට ගාථා කුමටද?

297. ජීතා ජීත නොබලා වඩමින්  පෙම්මා
මීතා මියුරු සැපයදී මා වැඩූ  නිම්මා
සීතා දේවි මෙන් රැකගත් කුළුණින්  මා
ගාථා මොටද වඳිනට මගෙ බුදු  අම්මා[33]

පියාණනි ! ඔබගේ ද දෙපා පියුම් මෙසේ නමදිමි.

298. නොපා උරන රිසි හැම දේ  මනාපෙනී
ලප සඳ සේම නොමකර මව්තුමිය  තනී
සැපා දෙමින් දැඩිකළ මා  දයාවෙනී
දෙපා පියුම් නමදිමි ඔබෙ  පියාතෙනී[34]

---

31. සපරගමුවේ ජනකවි 113 පි.
32. සපරගමුවේ ජනකවි 110 පි.
33. කුකුළු කෝරළේ ජනකවි සහ ගැමි සංස්කෘතික ලක්ෂණ 38 පි.
34. කුකුළු කෝරළේ ජනකවි සහ ගැමි සංස්කෘතික ලක්ෂණ 39 පි.

මස්සිනා විසින් නෑනාට කියනු ලැබූ සිව්පද රාශියක් සබරගමු ජනකවි අතර ඇත. 'කුරහන්' සහ 'අමු' කෙටු මේ නෑනලාට මස්සිනාලා විසින් කියන ලදැයි සැළකිය හැකි සිපද කිපයකි මේ.

299. කුරක්කන් රුසිරු රුබර ළද ලියනේ
ඉලක්කන් ලෙසට නුඹෙ එන කැකුළු තනේ
නරක්කන් තවත් නොකරන් මෙමට අනේ
කුරක්කන් තදින් නොකොටත් වැටෙයි තනේ.[35*]

ඊට ලැබුනේ මෙවැනි පිළිතුරකි.

300. ලොවට උතුම් තන කෑමකි කුරක්කන්
පවට ඉපදිලා මේ වද විඳින්නන්
අපටත් ඔහොම පද සලසා කියන්නන්
වැටෙතත් තනේ නොකොටා බැහැ කුරක්කන්[36**]

මේ 'අමු' කෙටූ කෙල්ල කී සීපදයයි

301. අකුණු හඬ දිදී අමු කොටනා කෙල්ලේ
මුකුළු මුතු දත දගෙන සුළඟිල්ලේ
වතුර ලෙසට එහි දඩිය බිඳු බෙල්ලේ
කැකුළු තන වැටෙයි අමු නොකොටත් කෙල්ලේ[37]

මෙවැනි විවිධ -'විශේෂ සංකල්පනා සබරගමුවේ ජනකවියට එක්වී ඇත.

---

35. කුකුළු කෝරලේ ජනකවි සහ ගැමි සංස්කෘතික ලක්‍ෂණ 120 පි.
 * සසඳන්න :- කුරක්කන් රුසිරු රුසිරි කුරු දෙතනේ
 මලක්කන් සේම ඇවිදින් තිබෙයි තනේ
 නරක්තන් මෙහෙම නොකියන් මට ලඳුනේ
 කුරක්කන් තදින් නොකොටත් වැටෙයි තනේ
 \- ගොවි ගෙදර ජනකවි 278 පි.
36. කුකුළු කෝරලේ ජනකවි සහ ගැමි සංස්කෘතික ලක්‍ෂණ 120 පි.
 ** සසඳන්න :- නොබලන් ඔහොම පද කවිකර කීමෙන්
 පෙර සිට පැවැත එන බොජුනකි කුරක්කන්
 පවටත් අඳුවෙලා මම විඳින දුකදන්
 වැටුනත් තනේ නොකොටා බැහැ කුරක්කන්
37. කුකුළු කෝරලේ ජනකවි සහ ගැමි සංස්කෘතික ලක්‍ෂණ 120 පි.

# සබරගමු ජනකවියන් ගේ වැනුම්මඟ හා කවිත්වය

10

කාව්‍ය විචාරාත්මක දෘෂ්ටිකෝණයකින් බලා භාවිත විචාර සිද්ධාන්තයන්ට අනුකූලව ජනකවියේ කවිත්වය විමසීම, ජන කවියන්ට කරන අගෞරවයක් සේ සලකමි.

ජන කවියා "කවියෙක්" නොවේ. ඔහු පෞද්ගලික හැඟීම් ප්‍රකාශකයෙකි. සන්නිවේදකයෙකි. පෞද්ගලික අද්දැකීම් චමත්කාරයක් ඇතිවන අයුරින් විශ්වසාධාරණත්වයට පත් කිරීම කවියාගේ කාර්යයයි. කවිත්වය යනුවෙන් හැඳින්වෙන්නේ එයයි. ජනකවියා තමා ලත් අද්දැකීම හෝ අත්දුටු සිද්ධිය අනෙකාට අවබෝධ වනසේ තමාට හුරු පුරුදු බසින් පවැසීම හෝ සන්නිවේදනය කිරීම විනා එම පරමාර්ථය ඉක්මවූ කාව්‍යමය දෘෂ්ටියක් ඔහු තුළ නොවීය. බොහෝවිට ජනකවියෙන් හෙළිවන්නේ එදිනෙද ජීවිතයේ දී තමා ලැබූ කටුක අද්දැකීමකි. දුඩි වෙහෙස, බිය හා පාළුව දැනෙන විට පතල් කරුවාගෙන් කවි කියැවුණේය.

302. කඹේ දිගේ යනකොට දෙපතුල් දනවා
මිටිය අතට ගත්තම උර කකියනවා
උඩ බැලුවම හැම දෙවියන් සිහිවෙනවා
මේ පව් ගෙවා මෙතනින් කවද යනවා [1]

303. මන්මුලා වෙලා මේ රට පසුවෙනවා
අම්මලා පෙව්ව රන් කිරි සිහිවෙනවා
අයියලා ඉඳන් මට තව දුක් දෙනවා
බංගලා වලේ දේනාවට යනවා [2]

සොර සතුරුබිය පාළුව හා නිදිමත දුරුකරලීමට පැල් රකින ගොවියා සීපද ගොතා කීවේය.

1. රත්නපුරේ ජනකවි 14 පි.
2. රත්නපුරේ ජනකවි 15 පි.

304. කැලේ ගියොත් ඌරන්ගේ කරච්චලේ
වෙලේ ගියොත් මැඩියන්ගේ කරච්චලේ
ගෙදර ගියොත් මහ ගෑනිගෙ කරච්චලේ
මෙද යලේ පැල් රැක්කා කෙහෙම්මලේ[3]

තම ගවයා සමඟ ගැල් ඇද යන කරත්ත කරුවා ද කාන්සිය හා පාළුව මකා ගත්තේ සීපද කීමෙනි. ගවයා සමග අදහස් හුවමාරු කර ගැනීමට සන්නිවේදනයේ යෙදීමට නොහැකිවූ ගැල් කරුවා රාත්‍රී කාලයේ ගමන් බිමන් වලදී තනි විය. එහෙයින් අන්‍යයන්ට ඇසෙන සේ තමාටත් - ගොනාටත් ඇතිවන දුක හඬනාගා සීපයදකින් පවසා, ගොනාට ඇතිවන දුක තමාත් විඳදරාගත්තේය.

305. වයිර ගොනා දන ගහලා අදිනකොට
මයිල ගොනා පැන්නේ පස්සට හොරට
මොකද කරන්නේ පූරුවෙ කළ පවට
ඇදපන් ගොනෝ විගසින් ගාල ගාවට[4]

මෙසේ තම හැඟීම් අව්‍යාජත්වයෙන් හා තමාට හුරු - පුරුදු කටවහරින් ප්‍රකාශයට පත් කිරීමේදී කාව්‍යමය හැඟීම් නිරායාසයෙන් සිව්පදයට ඇතුළත් විය. ඒ ඉතා කලාතුරකිනි. මේ හැඟීම් සිතා - මතා නිර්මාණය වූ කාව්‍යමය හැඟීම් නොවේ. එහෙත් සබරගමුවේ ජනකවි තුළින් ද මඳ වශයෙන් වුවද වැනුම්මග හා කවිත්වය හෙළි කෙරෙන රසවත් නිර්මාණයන් හඳුනාගත හැකි වේ.

සබරගමුවේ ජනකවියා කුකුළේගඟ දක ඒ ගැන කෙරෙන විස්තරය මගින් අපට කුකුළු ගඟ පිළිබඳ තොරතුරු මෙන්ම, කවිරස විඳගැනීම ද අපහසුනොවේ.

කුකුළේගඟ බියකරුය. ජල කඳ ගල් අතරින් පැන පැන මතුවන්නේ ඝෝෂා නගමිනි. එහි පලළ හැටපස් බඹයකි. අඩි 390 ක් පමණි. අවුරුද්දකට මිනිසුන් දෙතුන් දෙනෙක් මේ ගඟට

3. රත්නපුරේ ජනකවි 42 පි.
4. සබරගමුවේ ජනකවි 114 පි.

බිළිවෙති. ජනකවියා එම විස්තරය කරන්නේ මෙලෙසිනි.

306. කුකුළුගඟේ වස කමේ හැටිය මට
කියන්ඩ යන්තම් සිහිවෙනවා
ගඟේ පළල වේවැලේ දිගට මයි
හැටපස් බඹයකි මැනබැලුවා
සලා දිදී ගෝසාවකි ජල කඳ
ගල් අස්සෙන් පැන මතුවෙනවා
අවුරුද්දට තුන් දෙනා කනක්කුවෙ
කුකුළු ගඟට බිලි කැප වෙනවා [5]

ගඟේ භයංකාර භාවය දක්වන ජනකවියා ඉන් පසු අපට පෙන්වා දෙන්නේ ගංගාවේ සුන්දරත්වයයි. ඒ සඳහා ජනකවියා තමාට හුරු පුරුදු උපමා - රූපක මගින් තමා විඳි සුන්දරත්වය අපට ද විඳවයි.

"තිල්වා ඇලි සුදු සේලේ"
"උනා වරල පීරුව සේමයි"
"නලා කොම්බු හොරණෑ වෙස් හැඩයෙන්"
"දූදල්ලක් සේ යන අන්දම්"

වැනි උපමා රූපක මගින්, දිය රැළි නඟමින් ගංගාව නට නටා පහලට දිය කඳ ගලින් ගලට පැන පැන යන ගමන නාට්‍යමය ස්වරූපයකින් අපට පෙන්වා දෙයි.

307. තිල්වා ඇලි සුදු සේලේ සේමයි
රැළි දස අත විහිදෙන අන්දම්
උනා වරල පීරුව සේමයි
ජල කඳ හැඩ අත විහිදෙන අන්දම්
නලා කොම්බු හොරණෑ වෙස් හැඩයෙන්
දූ දල්ලක් සේ යන අන්දම්
බලා සිටිනු ගඟලඟට ගිහිල්ලා
දුන්මල් පහුරක යන අන්දම් [6]

5. කුකුළු කෝරළේ ජනකවි 07 පි.
6. කුකුළු කෝරළේ ජනකවි 08 පි.

නිල් හා සුදු දිය රැළි නගමින් සුදු පේලයක් සේ දස අත විහිදෙමින් ගඟ-ගලායන අන්දම බලාසිටීම කදිම දර්ශනයක් විය. මෙවැනි ගංගාවක අත්වැල් පතුරක් ගමන්කරන ආකාරය කදිම දසුනක් විය හැකිය.

කවියාට උචිත සංකල්පරූප සමග වැණුමට සුදුසු විරිතකින් යුත් උචිත රිද්මය උපයෝගිකොට ගනිමින් ජන කවියා, තමා විඳි සුන්දරත්වය අපට ද විඳ ගැනිමට ඉඩ තබයි.

මහට බැස තනිවම ගමන්කරන "ටිකිරිහාමි" නමැති යෞවනිය දකීමෙන් ජනකවියා ලැබූ සුන්දරත්වය හා චමත්කාරය අපට ඇතිවන්නේ මෙලෙසිනි.

"ඇඳපු ඔරියල් - ටිකිරි තන පොඩි - ඉසුණු ගෝමර" වලින් පමණක් බාහිර වශයෙන් ජන කවියා ඇය සුන්දරත්වයට පත්කළ ආකාරය කදිමය.

308. ටිකිරි හාමි ඇඳපු ඔරියල්
පලාබද්දල පසුව යන්නේ
ටිකිරි තනපොඩි පුබුදු වෙන කොට
සුවඳ මානෙල් මලක් වැන්නේ
ටිකිරි බඳ වට ඉසුනු ගෝමර
තාරකා ලක්ෂයක් වැන්නේ
මෙහෙව් රුව ඇති ටිකිරිහාමි
මහට බැසලා තනිව යන්නේ[7]

මානෙල් මලක් පුබුදු වන විට දනෙන සුවඳ සිහිකරන ජනකවියා ටිකිරි හාමිගේ තනපොඩි වලින් විහිදෙන නැඹුල් සුවඳට සමාන කරයි. බඳ වට ඉසුණු ගෝමර-තාරකා වැනිය. තාරකා රශ්මිය විහිදුවයි. ගෝමර ද දිළෙන සුළුය. ජනකවියා "ලක්ෂයක්" යයි කීවේ ගෝමර රාශියක් තිබූ බව ඇඟවීමටය.

7. කුකුළු කෝරලේ ජනකවි - 21 වි.

අලුත්නුවර බබප්පුගේ දුවණිය ටිකිරිහාමිටත් වඩා සුරූපිය වූ අතර, ඇය පායන පුන්සඳක් වැනිය. පළිගු මැණිකක් සේය. රත්තරනෙත් කළ රන් කෙඳි වැනි වූ ඇයගේ කේශ කලාපය මනහරය. පයෝදර කැළනි වෙහෙරේ රන්කොත මෙනි. ඇය කෙරෙහි ජනකවියා තුළ උපන් අපිරිමිත ආදරය සහ භක්තිය නිසාම, කැළනි විහාරයේ කොත ජනකවියාට සිහිවන්ට ඇත. රන්කොත සිහිවූයේ 'රන්කුඹු' යනු කීමට විය හැකිය. 'රන්කුඹු' ආලංකාරකයින් විසින් නිතර නිතර යෙදූ උපමාවකි.

309. අලුත්නුවර පුර බබප්පුගේ දුව
පායා එන පුන්සඳ වාගේ
මූනට ඔබිනා අත්පොඩි බැඳලා
පළිගු මැනික් ගල් කැට වාගේ
පීරා වරලස පිටට එලාලා
රත්තරනෙත් රන් කොත වාගේ
මෝරා යන තැන නුඹේ පයෝදර
කැළණි වෙහෙරෙ රන් කොත වාගේ [8]

ජනකවියාද ඇගේ රූ සපුව විනා ගුණ සපුව දක නැත. පැරණි කවියන්මෙන් බාහිර අලකාරය පමණක් දක්වා ඇත.

දිය ඇල්ලක් දැකීමෙන් තමා ලැබූ චමත්කාරය, තමා විඳි ආකාරයෙන්ම අසන්නාටත් ලබාදීමට සබරගමුවේ ජනකවියා සමත් විය. ජනකවියා දිය ඇල්ල දුටුවේ නාට්‍යාකාරයෙනි. රන්දෙඹ ඇල්ලේ ජල කඳ කඩා හැලෙන්නේ රඟුමක ආකාරයෙනි. එය එක එල්ලේ වාදනය කෙරෙන බෙර - දවුල් හා හොරණෑවලින් නැගෙන රාවයේ රිද්මයට නැටවෙන ආකරයකි, ජනකවියා දුටුවේ.

310. වටා පොතද පොරෝනුව මාවත පල්ල
යටා ගරද ඔතනද හොරයින් ඇල්ල
ගසා බෙර දවුල් හොරණෑ එක එල්ල
නටා ජල බසින මහ රන්දෙඹ ඇල්ල [9]

8. සපරගමුවේ ජනකවි 111 පි.
9. රත්නපුරේ ජනකවි 01 පි.

ජන කවියා එය වාර්තා ස්වරූපයෙන් ඉදිරිපත් කොට ඇතත් ඔහු යොදගත් 'ගසා - බෙර - දවුල් - හොරණෑ' යන වචන තුළින් අපට එම නාදයේ රාවය ඇසෙන සේය. එසේම ඒ හා බැඳෙන එළිසමයට යෙදූ පල්ල - ඇල්ල - එල්ල - ඇල්ල යන වචන සංඝටනයෙන් ද නාට්‍ය ස්වරය ධ්වනිත වන අතර, දිය ඇල්ල කඩාවැටෙන හා නැටෙන ආකාරය පෙනෙන සේය. ජනකවියා එහි දී උපමා උපයෝගී කොට නොගත්ත ද 'නටා' යන වචනය සමග 'ගසා' බෙර - දවුල් - හොරුණෑ - වැනි වාද්‍ය භාණ්ඩ වල නම් සඳහන් කිරීමෙන් පමණක් දිය ඇල්ලේ ගලා බසින නාට්‍යාකාරය දනවෙන උපමාවක් බවට නිරායාසයෙන් පත්වී ඇත.

දනට පිනට කුසලට කැමැති ගම්වාසීන් ගේ සිත්ගත්, ගම් විසිහතරකට නායක වූ ගම් ප්‍රධානියකු විසින්, අමුණු තිහක පමණ කුඹුරු වපසරියක් වපුරනු ලදුව ඉත් සරු අස්වැන්නක් ලැබූ ආකාරය ජනකවියා විස්තර කරන්නේ මෙසේය. ජනකවියා සිතන්නේ එය තමාට ලැබුණු සම්පතක් සේය. හිත හොඳ මිනිසකුට ලැබෙන සම්පත තමාටත් සම්පතකි.

311. ඇලකි දෙලකි ඇල කදුලකි පොකුණකි
අමුණ බලන් සකි කැටත්දෙලේ
මලකි රෝනකි මල පිටයන බමරෙකි
වදින රුවකි දියපිට ඇල්ලේ
නමකි ගමකි නායක විසිහතරකි
අමුණු තිහක් වපුරාය වෙලේ
දනට පිනට කුසලට සුර විමනකි
පැසුන මහිම දෙනිපිටිය වෙලේ[10]

කැටත් දෙලේ - දෙනිපිටිය වෙලේ අමුණු තිහක් පැසීම ජනකවියාටත් සතුටට කරුණක් විය. අමුණු තිහක විශාල වෙල්යායක් පැසී කරල් බරවී, සුළඟට ලෙළ දිදී සැළෙන ආකාරය

10. රත්නපුරේ ජනකවි 28 පි.

ජනකවියා වචන මගින් මැවූ රිද්මය තුළ රැඳී ඇත. ඒ සමගම අමුණ පිරීයන දිය හැලෙන ඇල දෙළ මත දිය රැළි නඟන ආකාරය මල් රොනට බමරුන් එන්නා වැනිය. ඉන් හැඟෙන්නේ සොබා සිරියද ඊට සතුටු වන ආකාරය නොවේද?

'මලකි රොනකි මල වට යන බමරෙකි වදින රුවකි දිය පිට ඇල්ලේ' ජනකවියා නිර්මාණය කර ඇත්තේ චමත්කාර ජනක උපමාවකි.

'ඇලකි - දෙලකි-ඇල කදුලකි - පොකුණකි - බලන්සකි - මල්කි - රොනකි - මල වටයන බමරෙකි' යන වචන යෙන් නැගෙන රිද්ම රටාව ජල තරංග නගමින්. ගලින් ගලට පනිමින් ඇල - දෙල ගලායන ආකාරය මෙන්ම, අමුණු තිහක පැසුණු ගොයම සුළඟට ළෙල දෙන ආකාරය ද දිස්වන සේය. එමෙන්ම ඇල - දෙළ - අමුණ - මල - රොන් - බඹර' වැනි වචන සෞභාග්‍යය සංකේතවත්ව ධ්වනිත කරයි.

ආදරය පිළිබඳ පෞද්ගලික මනෝභාවයන් නිර්ව්‍යාජත්වයෙන් හා චමත්කාරයෙන් යුතුව ඉදිරිපත් කොට, පෞද්ගලික අද්දැකීම පොදු අද්දැකීමක් ලෙස විශ්ව සාධාරණත්වයෙන් ඉදිරිපත් කිරීමට සබරගමුවේ ජනකවියා නිතැතින් සමත්වෙයි. 'යසෝදරා' නමැති තම සෙනෙහෙබර ආදරවන්තිය කෙරෙහි ජනකවියා හෙළන මනෝභාවයන් මෙසේ වෙයි.

312. සතරැස් උළු ගෙයි ඇඳ මත ඉඳගෙන
මල් අමුණනවා — යසෝදරා
එතැනින් බැසලා පිලපිට ඉඳගෙන
හිස පීරනවා — යසෝදරා
මව්පිය දෙදෙනා බලාසිටිද්දී
සළු පළඳිනවා — යසෝදරා
බුදුන් වදින්නට ගියාට මොකටද
ගෙදර වරෙන් මගෙ — යසෝදරා[11]

11. රත්නපුරේ ජනකවි17 පි.

ජනකවියා සංකල්ප රූප මැවීමට සමතෙකි. සතරැස් උළු ගෙයක් අප ඉදිරියේ වමැවී පෙනේ. එහි මැද ඇඳ අපට පෙනෙන සේය. දෙපිල ද අපට පෙනේ. එක් පිලෙක අම්මාය. තාත්තා අනෙක් පිලේය. ඒ දෙදෙනා යසෝදරා වෙත බලාසිටිති. ආදරවන්තයාද යසෝදරාගේ සියලුම ඉරියව් නොඉවසිල්ලෙන් බලා සිටියි. දූන් යසෝදරා ඇඳමත ඉඳගෙන මල් අමුනන්නීය. මේ මොහොතේ අප වෙත මැවෙන දර්ශනය මහනුවර යුගයේ අලංකාර බිතුසිතුවමක් සිහිගන්වයි. මුද්‍රානාට්‍යයක් සිහිගන්වයි. මල් අමුණා අවසන් වූ යසෝදරා එතැනින් පිලට බසී. පිල පිට ඉඳගෙන හිස පීරයි. අම්මා සහ තාත්තා බලා සිටිය දී යසෝදරා සළු පළඳියි. ආදරවන්තයාට එයද පෙනේ. ඉන්පසු යසෝදරා අපසු නොබලා යන්ට පිටත්වෙයි. මේ සියල්ලම ඉරියව්වෙන් ඉරියව්වට ඉවසා දරාගෙන ආශාවෙන් බලාසිටීමට ජනකවියාට හැකිවිය.

යසෝදරා ගේ ක්‍රියාකාරකම් දෙස නෙත් නොසලා - සිත් නොසලා බලා සිටි ඒ ආදරවන්තයාගේ අවධානය කැඩී පොඩිවී දෙදරාගියේ ඇය ආපසු නොබලා ගෙයින් පිටත්වන මොහොතේදීය. ඉන්පසු ඔහුගේ කට හැඩවූනේය. ඔහුද එම නිවසේම සිටි බව අපට හැගේ.

'බුදුන් වඩින්නට ග්‍රියාට මොකදූයි'
(ආපසු නොබලා ගියාට මොකදූයි)

පෙම්වතාගේ අපේක්ෂාව වූයේ ඇයගේ නැවත පැමිණීමයි.

'ගෙදර වරෙන් මගෙ යසෝදරා'

ඇය තවත් කාගේවත් සිත් හා බැදේද? තව කාට්වත් අයිතිවේද? පෙම්වතාගේ සිත පාරවන චේතනාව වූයේ එයයි. ඔහුගේ දැඩි අපේක්ෂාව වූයේ ඇය නැවත නිවසට ගෙන්වා ගැනීමයි. මේ ආකාරයෙන් චමත්කාර ජනක සංකල්පරූප මගින් තරුණ සිතක මනෝභාවයන් නිර්ව්‍යාජතත්වයෙන් ඉදිරිපත්

කිරීමට ජනකවියා සමත්විය. මෙම යසෝදරා පුවත මඳ වෙනස්කම් සහිතව ද සබරගමුවේ ජනශ්‍රැතියට එක්වී ඇත.[12]

සබරගමු ජනකවියාගේ වැනුම් මඟ දක්වෙන කවි අතරට තලමල් කවි ද ඇතුළත්වේ. එහි වැනුම්මඟ හා කවිත්වය දිවයිනේ අනෙක් 'තලමල' වැරුණේ කවි වලට බෙහෙවින් සමානවේ.

කහවත්තේ ගම මැද පිපි තලමල ජනකවියා මෙසේ වර්ණනා කර ඇත. එක් ජනකවියෙක් එය දුටුවේ 'වෙහෙරට රන් කොත බැඳිවාගේ 'ය. වෙහෙර පන්සලේ උසම ස්ථානයක ඉදි කෙරෙන අතර, එහි කොත ගම්මානයේ ඈතට ම දිස් වේ. අඩි හැටක් පමණ උස් වූ ගසක තල මල පිපෙන්නේ ද ඒ හා සමාන අනෙක් ගස් කොළන් අභිබවා යමිනි.

ගසක් උඩ ගසක් පිහිටියා සේ තල මල තලගසේ සිට තවත් අඩි විස්සක් හෝ තිහක් පමණ උසට විහිදේ.

---

12. (i) - සතරැස් උළු ගෙයි මාලේ ඉඳගෙන
මල් අමුණනවද — යසෝදරා
එ තැනින් බැසලා පිල පිට ඉඳගෙන
හිස පීරනවද — යසෝදරා
අම්මත් අප්පත් දෙපිල හඬද්දී
යන්ටම යනවද — යසෝදරා
ආපසු නොබලා ගියාට මොකදැයි
ගෙදර වරෙන් මගෙ — යසෝදරා
- සිංහල ජනකවි සංග්‍රාහය - II 140 පි.

(ii) - සතරැස් උළු ගෙයි කොනපිට ඉඳගෙන
එළි වළඳිනවද — යසෝදරා
එතැනින් බැස එළිපිට ඉඳගෙන
ඉස පීරනවයි — යසෝදරා
අම්මත් අප්පත් බලා සිටිද්දී
සම් පළඳිනවද — යසෝදරා
බුදුන් වඳින්නට ගියාට මොකදැයි
ගෙදර වරෙන් මගේ — යසෝදරා
- සපරගමුවේ ජනකවි 161 පි.

313. අහගත්තෙයි පද දෙකක් කියන්ට
    රස මීයේ බැදි පැණි වාගේ
බිහිවෙච්චෙයි මවු කුසයෙන් බිළිදෙක්
    මෙතුන්ලොවට පුන්සඳ වාගේ
එක සත්තෙයි ඇති දරුමෙ ලියන්නට
    පත්හිඳ නැති වෙච්චා වාගේ
කහවත්තේ ගම මැද පිපි තලමල
    වෙහෙරෙට රන්කොත බැදි වාගේ[13]

කවියා පද දෙකක් කියන්ට උත්සාහ කොළේ 'රස මීයේ බැදි පැණි වාගේ' රසවත් වන ලෙසිනි. මව් කුසයෙන් බිළිදෙක් ඉපැදීමත් තල මල පිපීමත් අතර සමානත්වයක් කවියා දකී. තල මලක් පුබුදු වන්නේ මාස දහයක් පමණ ගතවී බැවින් ජනකවියා එසේ කල්පනා කළා විය හැකිය.

කහවත්තේ තලමලක් තවත් ජනකවියෙක් දුටුවේ රන් මල් දහසක් පිපී බැබළෙන ලෙසිනි. රන් බෝපත් ලෙසිනි. ජනකවියාගේ පරමාර්ථය වූයේ අනෙක් සියලුම මල් වලට වඩා අරුම පුදුම ලෙස තලමල වර්ණනා කිරීමයි.

314. කහවත්තේ ගල මුදුන බහින කොට
    ලස්සන තල මල දිස්වෙන්නේ
රන්මල් දහසක් බැබළෙන විලසට
    ගුවනේ පිපිලා ලෙළ දෙන්නේ
බමරු රොනට එහි - උන් රොන් ගෙනයති
    කදිමයි තල මල බැබලෙන්නේ
කහවත්තේ ගම මැදපිපි තලමල
    රන්බෝපත් මෙනි දැක ගත්තේ[14]

තලමල රන්බෝපත් වලට සමාන කළ නොහැකිය.
'මලට මලක් නැත මෙහෙම මලක් නැත'
'මලක් දුටිමි මම මෙහෙම මලක් නැත'

13. සිංහල ජනකවි සංග්‍රහය II 177 පි.

14. රත්නපුරේ ජනකවි 35 පි.

මෙවැනි පද වැණුම් මගින් තොරවේ. මාදම්පේ තලමලට සමාන කළ හැකි වෙනත් දෙයක් මිහිපිට නැති බවයි ජනකවියා පවසන්නේ. තල මලේ වරුණ පවසන ජන කවියාගේ වැනුම්මග කවිත්වයෙන් තොරය.

හුදු ශබ්ද රසයක් විනා අර්ථ රසයක් මෙම තලමල් වරුණින් නොපැවැසේ.

315. මලක් දුටිමි මම මෙහෙම මලක් නැත
අනෝතත්ත මහ විල වාගේ
දියක් දුටිමි මම මෙහෙම දියක් නැත
මහ මුහුදේ කරදිය වාගේ
ගලක් දුටිමි මම මෙහෙම ගලක් නැත
සිරිපාදේ මහ ගල වාගේ
මලක් දුටිමි මම මෙහෙම මලක් නැත
මාදම්පේ තල මල වාගේ[15]

316. ඉරට ඉරක් නැත මෙහෙම ඉරක් නැත
ඉරිඳු පායන ඉර වාගේ
සඳට සඳක් නැත මෙහෙම සඳක් නැත
සඳුදු පායන සඳ වාගේ
දියට දියක් නැත මෙහෙම දියක් නැත
කළු ගංගාවේ දිය වාගේ
මලට මලක් නැත මෙහෙම මලක් නැත
මාදම්පේ තල මල වාගේ[16]*

---

15. රත්නපුරේ ජනකවි 35 පි.
16. රත්නපුරේ ජනකවි 35 පි.
*සසඳන්න -
- ඉරට ඉරක් නැත මෙහෙම ඉරක් නැත
ඉරිඳු පායන ඉර වාගේ
සඳට සඳක් නැත මෙහෙම සඳක් නැත
සඳුදු පායන සඳ වාගේ
දියට දියක් නැත මෙහෙම දියක් නැත
කැලණිගඟේ දිය කඳ වාගේ
මලට මලක් නැත මෙහෙම මලක් නැත
කරත්දෙණියෙ තල මල වාගේ
- තල මල් කවි සමාජය - 114 පි.

ජන කවියා යෙදූ කිසිම උපමාවක් තල මල සමග නොපෑසදේ.

ජනකවියා තම අද්දැකීම, තවත් අයට සන්නිවේදනය කිරීමේ දී තමාට හුරු පුරුදු කට වහරේ ආ වචන ඒ ආකාරයෙන් ම යොදගත් අතර, එළිසමය පිහිටුවීම පිළිබඳ එතරම් උත්සාහයක් දරා නැත. කටට හුරු පරිදි තාලයකට කියැවෙන විට ජනකවියාට එළිසමයක් අවශ්‍ය නොවීය.

හේනේ නෙළුමට එක්වූවන්ගේ සිතුම් පැතුම් ජනකවියා ඉදිරිපත්කළේ මෙළෙසිනි.

317. හේනේ නෙළුමට තිස් අට දෙන්නයි
අම්මත් ආවද අහපන්නේ
අම්මාවරුනේ කිරිමව් ළඳුනේ
මෙමට ලැබුණු දුක අහපල්ලා
අදින්න දුන් හිමි දකින්න නොලැබුණී
පූරුවෙ කළ පව් වැඩි හින්ද
අම්මේ නුඹවත් පව් අරවාපන්
යනතැන එළියක් නැති හින්ද[17]

අග එළිසමය නිමවුණේ අහපන්නේ - අහපල්ලා - හින්ද - හින්ද යන පද වලිනි. ජනකවියාට අවශ්‍යවූයේ තාලයකට කියැවීමට ඇති දක්ෂතාව පමණී.

තමා පසුකල ගම් පිළිබඳව මතකය අලුත් කළ ජනකවියා ඒවා තාලයකට පැවැසුවා මිස එළිසමය ගැන කල්පනා නොකෙළේය.

318. එල්ලාවල ද අකුරන මාවුවාගල
මාන්දූකන්ද කිරිඇල්ල ද ඉඩංගොඩ
කොටපිටි ගෙදර ගල තුර ගම්මැද්දෙගොඩ
අරඹේ ගමට උඩුගල සකිය පරගල[18]

17. සපරගමුවේ ජනකවි - 102 පි.
18. රත්නපුර ජනකවි - 08 පි.

එම සීපදයේ අග එළිසමය තිම වුණේ මාටුවාගල - ඉඩංගොඩ - ගම්මැද්දේගොඩ - පරගල යන නොසැසඳෙන පද කිහිපයකිනි. එහෙත් ජනකවියාට අවශ්‍ය වූ තාලය එහි රැඳිණ. මේ ආකාරයෙන් කාව්‍ය රසය විඳගතහැකි ජනකවි රාශියක් ද සබරගමුවේ ජනකවියට එක්වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


1946 - ලංකාවේ ජන ලේඛනය - ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

1950 - සිව්පද හා සමාජය - ආචාර්ය නන්දදේව විජේසේකර - ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

1955 - ලංකා ජනතාව - ආචාර්ය නන්දදේව විජේසේකර - ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

1960 - ලංකා ඉතිහාසය - (බ්‍රිතාන්‍ය හා නිදහසේ යුග) එස්. ජී. පෙරේරා පියතුමා. ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම.

1960 - ලංකා ඉතිහාසය - (පෘතුග්‍රීසි යුගය) එස්. ජී. පෙරේරා පියතුමා. ලංකාවේ සීමාසහිත එක්සත් පවෘත්තිපත්‍ර සමාගම.

1964 - ජන සම්මත කවි ගී - ටී. එස්. ධර්මබන්දු. ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

1967 - සාහිත්‍ය විචාර - 3 බී. ශ්‍රී. ධම්මානන්ද හිමි. රත්න පොත් ප්‍රකාශකයෝ - මරදාන..

1969 - සංස්කෘති - 16 - කලාපය - 1. සඟරාව. සංස්කාරක, කේ. සී. පෙරේරා.

1971 - ජනකවිය හා සිංහල සංස්කෘතික ලක්ෂණ මහාචාර්ය මිණිවන් . පී. තිලකරත්න.

1977 - පහළ ඌවේ ජනකවි - ස.ජ. සුමනසේකර බණ්ඩා - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

1978 - කඩඉම් පොත් විමර්ශනය - ආචාර්ය එච්. ඒ. පී. අභයවර්ධන - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

1981 - රසවාහිණී - (පෙබරවාරි කලාපය)

1988 - පතල් සිව්පද - රෙක්ස්. ඒ. කාසිනාදර්. සීමාසහිත ප්‍රබුද්ධ ප්‍රකාශකයෝ.

1988 - කරදන - කේ. එන්. ඩී. චන්ද්‍රසේන.

1990 - ගොවිගෙදර ජනකවි - නෝමන් සිරිපාල ලංකාවේ සීමා සහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

1991 - සබරගමුවේ ජනකවි - බන්දුල ලියනගේ.
තිලක් ප්‍රින්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්. පන්නිපිටිය.

1991 - කුකුළු කෝරළේ ජනකවි - කලවානේ. ජයසේකර
රත්න මුද්‍රණාලය. - තිවිතිගල.

1992 - පිරුළු මිණි - ටී. එස්. ධර්මබන්ධු
ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

1993 - සව්දම් - කේ. එන්. ඩී. චන්ද්‍රසේන.

1994 - සපරගමුවේ ජනකවි - මුනිදස දෙඩන්තැන්න
තිලක් ප්‍රින්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්. පන්නිපිටිය.

1994 - කුකුළු කෝරළේ ජනකවි හා ගැමි සංස්කෘතික ලක්ෂණ - චන්දන සමරවික්‍රම. තිලක් ප්‍රින්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්. පන්නිපිටිය.

1994 - කමත් හැල්ල - නෝමන් සිරිපාල.
පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්, නුගේගොඩ.

1995 - රුවන් කවි - බන්දුල ලියනගේ.
ඉසුරු මුද්‍රණාලය- කුරුවිට.

1995 - සිංහල තේරවිලි - ආර්. ඒ. ඩී. කේ. රාමනායක.
එම්පයර් මුද්‍රණාලය - කැළණිය.

1995 - රුවන් කවි - බන්දුල ලියනගේ.
ඉසුරු මුද්‍රණාලය. කුරුවිට.

1996 - ජන කවිය හා ජන දිවිය - නෝමන් සිරිපාල.
පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස් - නුගේගොඩ.

1996 - මහාවංශය - සිංහල පරිවර්තනය - තෙවන මුද්‍රණය - ශ්‍රී ලංකා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

1996 - සිංහලේ ආණ්ඩු ක්‍රමය - ජෝන් ඩොයිලි -
ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

1996 - සතර කෝරළේ - කරුණාරත්න අතුකෝරල.
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ -මරදන.

1997 - සිංහල ජනකවි සංග්‍රහය - ii- හර්බට් පතිරණ
ශ්‍රී ලංකා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

1997 - මාගම් පත්තුවේ ජනකවි - නෝර්මන් සිරිපාල.
පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස් - නුගේගොඩ.

1997 - තලමල් කවි සමාජය. නෝර්මන් සිරිපාල.
පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස් - නුගේගොඩ.

1998 - සංඛ - (ජුලි- සැප්) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

1998 - සතරකෝර්ලේ සූවිසි විවරණය හා එහි බෞද්ධාගමික මුහුණුවර - ඒ. පී. එස්. පී. කේ. ජයතිලක - උපාධි නිබන්ධන කැළනිය විශ්ව විද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යාපන පීඨය.

1998 - නිමිති හා සබරගමුවේ නිමිති. බන්දුල ලියනගේ - පාලිත මුද්‍රණාලය - පැල්මඩුල්ල.

1998 - ජනකවි සියපත - නෝර්මන් සිරිපාල.
බුද්ධශාසන අමාත්‍යාංශය - රජයේ මුද්‍රාලය.

1998 - සිංහල තේරවිලි - කිත්සිරි අලුත්ගේ.
ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

- පතල් කවි සමාජය- නෝර්මන් සිරිපාල (අත් පිටපත)
- ගල කැප්පු සැහැල්ල සහ දැඩිමුණ්ඩ අවතාරය
- පුරාණ හිමගත වර්ණනාව - කොළඹ විජය මුද්‍රණාලය.

# සබරගමු ජනකවියේ සමාජ මුහුණුවර



## නෝමන් සිරිපාල

සිංහල ජනකවිය ඔහු තෝරාගත් විෂය ක්ෂෙත්‍රයයි. ගොවිගෙදර ජනකවි, ගොයම් කවි සරණිය සහ කමත් හැල්ල මගින් කෘෂිකාර්මික ජනකවි දෙදහස් පන් සියයක් පමණ දැනටමත් ඔහු විසින් සංග්‍රහ කරනු ලැබ ඇත.

'සබරගමු ජනකවියේ සමාජ මුහුණුවර' අනුව දශකයතුළ ඔහු විසින් පළ කරනු ලබන තෙලෙස්වන ජනකවි සංග්‍රහයයි. මෙහිදී ඔහු පෘථුල ලෙස ජනකවියෙන් සමාජ තොරතුරු හඳුනාගැනීමට වෙහෙස දරා ඇති අතර, ඒවා විචාරයට අවශ්‍ය රීතියක් ද අත්හදා බලයි.

බුත්තල, මාගම්පත්තුව සහ මාතලේ වැනි ප්‍රදේශයන් හි අප්‍රකට ජනකවි පරිශ්‍රමයෙන් යුතුව එක්රැස්කොට ශ්‍රී ලාංකික පාඨකයන්ට කියැවීමට සැලැස්වීමෙන් නෝමන් සිරිපාල ඉටුකරන කාර්යය ප්‍රශංසනීයයි.

මහාචාර්ය ජිනදාස දනන්සූරිය

**ISBN - 955 - 96157 - 4 -2**

මිල රු. 200/-

**National Digitization Project**

***National Science Foundation***

Institute : Sabaragamuwa University of Sri Lanka

1. Place of Scanning : Sabaragamuwa University of Sri Lanka, Belihuloya
2. Date Scanned : 2017-10-02
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : S.A.C Sadaruwan

Signature : ..........

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : LIBRARIAN

Name : T.N. NEIGHSOOREI

Signature : ..........

Date : 2017-10-02

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*